# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2120/5 - 2019 අප්‍රේල් මස 22 වැනි සඳුදා - 2019.04.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.සී.එෆ්. 1/64.

**(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනත**

(40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 5 වන වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදනු ලැබූ නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 අප්‍රේල් මස 22 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

**1 වන කොටස**

**සාමාන්‍ය**

1. මේ නියෝග 2019 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝග නමින් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. (1) යම් හදිසි අවස්ථා නියෝගයක වෙනත් අර්ථ නිරූපණයක් ප්‍රකාශිතව ම එහි සඳහන් කොට ඇත්තේ නම් මිස හෝ අන් ආකාරයකින් එහි ප්‍රකාශිතව ම සලස්වා ඇත්තේ නම් මිස හෝ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස - අර්ථ නිරූපණය

'නීතිපතිවරයා' යන්නට, යම් හදිසි අවස්ථා නියෝගයක් සම්න්ධයෙන් සොලිසිටර් ජනරාල්, ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්, අතිරේක සොලිසිටර් ජනරාල්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් , නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්, ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ, රජයේ නීතිඥ හෝ, ඒ නියෝගයෙහි කාර්යය සඳහා ඒ වෙනුවෙන් නීතිපතිවරයා විසින් බලය පවරනු ලැබූ රජයේ යම් නීතිඥවරයෙක් ද ඇතුළත් වේ. ;'

1A - G 29754 - 382 (2019/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නිසි බලධරයා' යන්නෙන්, යම් හදිසි අවස්ථා නියෝගයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට ඒ නියෝගයෙහි අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්තේ නම් මිස, ඒ නියෝගයෙහි කාර්යය සඳහා නිසි බලධරයකු වශයෙන් ජනාධිපතිවරයා විසින් නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබූ යම් තැනැත්තෙක් අදහස් වේ ;'

'හදිසි අවස්ථා නියෝගය' යන්නෙන්, මේ නියෝග අතුරින් යම් නියෝගයක් හෝ මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදනු ලැබූ වෙනත් යම් නියෝගයක් අදහස් වේ ;

'අත්‍යවශ්‍ය සේවය' යන්නෙන් මහජන උපයෝගීතාවය සඳහා වූ හෝ ජාතික ආරක්ෂාවට හෝ මහජන සාමය ආරක්ෂා කිරීමට හෝ ජන ජීවිතයට අත්‍යවශ්‍ය වූ හෝ යම් සේවයක් අදහස් වන අතර එයට මෙහි උප වගන්තියෙහි නිශ්චිතව සඳහන් යම් සේවාවක් බවට ප්‍රකාශයට පත්කරන ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ එහි ශාඛාවක් ඇතුළත් වන අතර මේ නියෝගවල 44 වන නියෝගය ප්‍රකාර මින්මතු ප්‍රකාශ කරනු ලැබිය හැකි යම් සේවාවක් ද ඊට ඇතුළත් වේ ;

'පුපුරණ ද්‍රව්‍ය' යන්නට, (183 වන අධිකාරය වූ) පුපුරණ ද්‍රව්‍ය පනතෙහි දී ඇති අර්ථයම ඇත්තේ ය.

'තුවක්කු' යන්නට (182 වන අධිකාරය වූ) තුවක්කු ආඥාපනතෙහි දී ඇති අර්ථයම ඇත්තේ ය ;

'පොලිස්පතිවරයා' යන්නට, යම් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් ද ඇතුළත් වේ ;

'ඉඩම' යන්නට, ජලයෙන් වැසුනු ඉඩම් ද ගෙවල්වල හෝ ගොඩනැගිලිවල කොටස් ද ඇතුළත් වේ ;

'පොලිස් නිලධරයා' යන්නෙන්, (53 වන අධිකාරය වූ) පොලිස් ආඥාපනත යටතේ පිහිටුවන ලද යම් පොලිස් හමුදාවක සාමාජිකයෙකු අදහස් වේ ;

'රජයේ නිලධරයා' යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

'අධිග්‍රහණය' යන්නෙන් යම් වාහනයක් සම්බන්ධයෙන් වන විට, එම වාහනයේ සන්තකය ලබා ගැනීම හෝ අධිග්‍රහණය කරනු ලබන අධිකාරියේ භාවිතය සඳහා වාහනය බැහැර කිරීමට නියම කිරීම අදහස්වන අතර එහි ව්‍යාකරණමය වෙනස්කම් හෝ සජාතීය ප්‍රකාශයක් ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

'රාජ්‍ය ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්වරයා' යන්නට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් බලය පවරන ලද රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ යම් අතිරේක ලේකම්වරයෙක් ද ඇතුළත් වේ ;

'ශ්‍රී ලංකාව' යන්නට, ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශය අදහස් වන අතර එයට එහි දේශීය ජලතීරය සහ ගුවන් අවකාශය ද ඇතුළත් වේ ;

'නිශ්චිතව දක්වනු ලබන ත්‍රස්තවාදී ක්‍රියාව' යන්නෙන් 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ නිශ්චිතව දක්වා ඇති යම් වරදක්, (40 වන අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත යටතේ වූ යම් වරදක්, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනතේ 3 වන වගන්තිය යටතේ වූ යම් වරදක්, 2005 අංක 25 දරන ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ සම්මුතිය පනතේ 3 වන වගන්තිය යටතේ වූ යම් වරදක්, සහ (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ 114, 115, 116, 117, 121, 122, 128, 129 වගන්ති යටතේ සිදුකරනු ලබන යම් වරදක් අදහස් වේ.

'දේශීය ජලතීරය' යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දී ඇති අර්ථයම ඇත්තේ ය;

"ත්‍රස්තවාදය" යන්නෙන්

(i) ජනගහනයක් බිය ගැන්වීමේ අරමුණින් යුතුව;

(ii) යම් ක්‍රියාවක් සිදු කිරීමට හෝ සිදු කිරීම වැළැක්වීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ වෙනත් යම් ආණ්ඩුවක් හෝ ජාත්‍යන්තර සංවිධානයක් සාවද්‍ය ලෙස හෝ නීති විරෝධී ලෙස පෙළඹවීමේ අරමුණින් යුතුව;

(iii) එවැනි යම් ආණ්ඩුවක් ක්‍රියා කිරීම වැලැක්වීමේ අරමුණින් යුතුව; හෝ

(iv) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් ස්වෛරී රටක භෞමික අඛණ්ඩතාවයට හෝ ස්වෛරී බවට හානි සිදුකිරීමේ අරමුණින් යුතු ව,

(අ) මිනීමැරීම, මිනීමැරීමට තැත් කිරීම, බරපතල තුවාල සිදුකිරීම, ප්‍රාණ ඇපයට ගැනීම හෝ යම් තැනැත්තකු පැහැර ගැනීම;

(ආ) ක්‍රියාව සිදුකරන තැනැත්තා නොවන යම් තැනැත්තකුගේ ජීවිතය අනතුරට පත් කිරීම;

(ඇ) රාජ්‍ය හෝ පෞද්ගලික දේපළ ඇතුළු දේපළවලට යම් පොදු භාවිත ස්ථානයකට යම් රාජ්‍ය හෝ ආණ්ඩුවේ පහසුකමකට, යම් රාජ්‍ය හෝ පෞද්ගලික ප්‍රවාහන පද්ධතියකට හෝ යම් යටිතල පහසුකමකට හෝ පරිසරයට බරපතල හානි සිදු කිරීම;

(ඈ) අත්‍යවශ්‍ය සේවාවලට හෝ සැපයීම්වලට බරපතල බාධා හෝ හානි සිදුකිරීම;

(ඉ) රාජ්‍ය හෝ පෞද්ගලික දේපළ සම්බන්ධයෙන් කොල්ලකෑම, ත්‍රාසද්ග්‍රහණය කිරීම හෝ සොරකම යන වරද සිදු කිරීම;

(ඊ) යම් ඉලෙක්ට්‍රෝනික හෝ ස්වයංක්‍රීය හෝ පරිගණක ගත පද්ධතියකට හෝ ජාලයකට හෝ ශ්‍රී ලංකාවට පවරාදී ඇති සයිබර් අවකාශයකට හෝ එවැනි බලවර්තනයකට හෝ එවැනි බලවර්තනයක ලියාපදිංචි වී සිටින වෙබ් අඩවිවලට හෝ බාධා ඇති කිරීම හෝ අලාභ හානි සිදු කිරීම හෝ එවැන්නකට මැදිහත්වීම;

(උ) යම් අත්‍යවශ්‍ය සේවාවක් හෝ සැපයීමක් ආශ්‍රිත අත්‍යවශ්‍ය යටිතල පහසුකමක් හෝ ක්‍රියාත්මක කිරීමේ පහසුකමක් කෙරෙහි බාධා ඇති කිරීම හෝ ඊට අලාභ හානි සිදුකිරීම හෝ ඒ සමගින් මැදිහත්වීම;

(ඌ) යම් ආගමික හෝ සංස්කෘතික දේපළක් හෝ උරුමයක් විනාශකිරීම හෝ එවැනි දේපළකට හෝ උරුමයකට අලාභහානි සිදුකිරීම;

(එ) සංඥා සම්ප්‍රේෂණයක් සහ වෙනත් යම් සංඛ්‍යාත පදනම් වූ සම්ප්‍රේෂණ පද්ධතියක් ඇතුළුව යම් ඉලෙක්ට්‍රොනික්, ඇනලො., ඩිජිටල් හෝ වෙනත් රැහැන් සහිත හෝ රැහැන් රහිත සම්ප්‍රේෂණ පද්ධතියකට බාධා ඇති කිරීම හෝ අලාභහානි සිදු කිරීම හෝ ඒ සමගින් මැදිහත්වීම;

(ඒ) මහජනතාවගේ හෝ එහි යම් කොටසක සෞඛ්‍යය සහ ආරක්ෂාවට බරපතල අවදානමක් ඇති කිරීම; හෝ

(ඔ) වෙනත් යම් ක්‍රියාවක් සිදු කිරීම,

අදහස් වේ.

යම් මූලික අයිතිවාසිකමක් නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමේ දී හෝ යම් අධිකරණ නියෝගයක් ප්‍රකාරව හෝ එවැනි නියෝගයක් බලාත්මක කිරීමේ දී, තමා වෙත ලබාදුන් නීත්‍යානුකූල නියෝගයක් අනුව හෝ එවැනි නියෝගයක් බලාත්මක කිරීමේ දී, යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් ගන්නා ලද යම් පියවරක් මේ නියෝග ත්‍රස්තවාදය යන්නට අයත් නොවිය යුතු ය.

'යාත්‍රාව' යන්නට, සෑම වර්ගයකම බෝට්ටු, ඔරු, පහුරු හා යාත්‍රා විශේෂ ඇතුළත් වේ.

(2) අර්ථ නිරූපණ ආඥාපනත, යම් පනතක හෝ ආඥාපනතක හෝ ජාතික රාජ්‍ය සභාවේ පනතක හෝ අර්ථ නිරූපණය සඳහා අදාළ වන පරිද්දෙන් ම, හදිසි අවස්ථා නියෝගයක් හා එය යටතේ සාදනු ලබන නියමයන් හෝ රීත අර්ථ නිරූපණය සඳහා අදාළ විය යුතු ය.

(3) යම් හදිසි අවස්ථා නියෝගයක් පිළිබඳව යම් ලේඛනයක හෝ වෙනත් යම් ලිඛිත නීතියක ඇති සෑම සඳහන් කිරීමක් ම, ඉන් පටහැනි අදහසක් පෙනෙන්නේ නම් මිස, මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදනු ලැබූ යම් තදනන්තර නියෝගයකින් සංශෝධනය කර ඇති පරිදි ඒ නියෝගය පිළිබඳ සඳහන් කිරීමක් ලෙස තේරුම් ගත යුතු ය.

(4) මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සේවාවන් හෝ යම් සේවයක් මහජන උපයෝගීතාවය සඳහා වන බවට හෝ රාජ්‍ය ආරක්ෂාවට නැතහොත් ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය බව ප්‍රකාශ කරමින්, මේ නියෝගවල 44 වන නියෝගය මගින් ජනාධිපතිවරයා විසින් ප්‍රකාශිත යම් සේවාවක් සාමාන්‍යයෙන් මුළු ශ්‍රී ලංකාව සඳහා හෝ ඒ ආඥාවේ සඳහන් යම් ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා හෝ කරනු ලැබිය හැකිය.

(5) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ කරනු ලැබූ යම් විධානයක හෝ නියමයක කාලසීමාවක් සඳහන් කළ යුතු බව ඒ නියෝගයෙන් නියම කර ඇති අවස්ථාවක හෝ එසේ සඳහන් කිරීමට එම නියෝගයෙන් ඉඩ සලස්වා ඇති අවස්ථාවක සහ එවැනි යම් කාලසීමාවක් ඒ විධානයෙහි හෝ නියමයෙහි සඳහන් නොවන අවස්ථාවක, ඒ කාලසීමාව, එම විධානය හෝ ආඥාව හෝ කරනු ලැබූවේ යම් නියෝගයක් යටතේ ද ඒ නියෝගය බලපවත්නා කාලසීමාව වශයෙන් සැලකිය යුතු ය.

ජනාධිපතිවරයාගේ බලතල

3. අන්‍යාකාරයකින් ප්‍රකාශිතව විධිවිධාන සලස්වා ඇත්නම් මිස, යම් හදිසි අවස්ථා නියෝගයක් මගින් පවරනු ලැබූ බලතල, ජනාධිපතිවරයා වෙත හෝ වෙනත් බලධරයකු හෝ තැනැත්තකු වෙත නීතිය මගින් පවරනු ලැබූ වෙනත් යම් අයිතීන් හෝ බලතලවලට අතිරේකව විය යුතු අතර එම අයිතීන් හෝ බලතල හීන කිරීමක් නොවිය යුතු ය.

හදිසි අවස්ථා නියෝග යටතෙහි බලතල කාර්ය හා කර්තව්‍ය පැවරීම

4. යම් හදිසි අවස්ථා නියෝගයකින් ජනාධිපතිවරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, ජනාධිපතිවරයා විසින් ඒ වෙනුවෙන් බලය පවරනු ලැබූ යම් අමාත්‍යවරයකු විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම හෝ කළ හැකි ය.

නිසි බලධරයා

5. (1) යම් හදිසි අවස්ථා නියෝගයක කාර්ය සඳහා යම් තැනැත්තකු නිසි බලධරයා වශයෙන් සාමාන්‍යයෙන් මුළු ශ්‍රී ලංකාව සඳහා හෝ ඒ තැනැත්තා පත් කරනු ලබන ලියවිල්ලෙහි නිශ්චිතව සඳහන් යම් ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා හෝ පත් කරනු ලැබිය හැකි ය. තව ද ඒ පත් කිරීම ඒ ලියවිල්ලෙහි නිශ්චිතව සඳහන් කාර්යය සඳහා සීමා කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, යම් නියෝගයක යම් කාර්ය සඳහා හෝ යම් නිශ්චිතව සඳහන් ප්‍රදේශයක් හෝ ස්ථානයක් සඳහා නිසි බලධරයන් වශයෙන් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් පත් කිරීම මේ ඡේදයේ ඉහතින් වූ විධිවිධානවල කිසිවකින් වැළැක්වේ යැයි නොසැලකිය යුතු ය.

(2) යම් නමෝද්දිෂ්ඨ ධුරයක් දරන්නකු නිසි බලධරයකු ලෙස පත් කරනු ලැබ ඇති අවස්ථාවක පටහැනි විධානයක් ප්‍රකාශිතව සලස්වා නොමැති නම්, එකී නමෝද්දිෂ්ඨ ධුරයෙහි කාර්යය එවකට ඉටු කරන තැනැත්තා වෙත ඒ පත් කිරීම දීර්ඝ වන ලෙස සැලකිය යුතු ය.

දැන්වීම භාරදීම

6. යම් හදිසි අවස්ථා නියෝගයක කාර්යය සඳහා යම් තැනැත්තකු වෙත භාර දිය යුතු දැන්වීමක්, ඒ හදිසි අවස්ථා නියෝගයේ අඩංගු යම් විශේෂ විධිවිධානවලට හානියක් නොමැතිව, ඒ තැනැත්තාගේ අවසානයට දැන සිටි හෝ සිරිත් පරිදි වූ වාසස්ථානය හෝ ව්‍යාපාරික ස්ථානය වෙත තැපැලෙන් යැවීමෙන් භාර දිය හැකි ය.

නියමයන් ආදිය ප්‍රත්‍යාදිෂ්ට කිරීම හා වෙනස් කිරීම

7. යම් නියමයක් හෝ රීතියක් සෑදීම සඳහා යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පවරන ලද යම් බලයකට ඒ නියමය හෝ රීතිය ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ වෙනස් කිරීම සඳහා ඒ ආකාරයෙන් සහ සමාන කොන්දේසිවලට යටත්ව ක්‍රියාත්මක කිරීමට හැකි බලයක්, එවැන්නක් ඇත්තේ නම් ඇතුළත් වන ලෙස තේරුම් ගත යුතු ය.

## II වන කොටස

### පරිශ්‍රයන් සන්තකයට ගැනීම හා වාහන සහ පෞද්ගලික සේවාවන් අධිග්‍රහණය කිරීම.

වරදක් සම්බන්ධයෙන් යොදා ගන්නා ලද ගොඩනැගිලි හා පරිශ්‍ර සන්තකයටගැනීම ආදිය

8. (1) යම් ගොඩනැගිල්ලක් හෝ පරිශ්‍රයක්, මේ නියෝගය යටතේ හෝ 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ හෝ යම් වරදක් සිදු කිරීමෙහි ලා හෝ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් හෝ පාවිච්චි කරන ලදැයි කියනු ලබන අවස්ථාවක දී ඒ ප්‍රදේශයෙහි පොලිස් අධිකාරීවරයා විසින්, එම ගොඩනැගිල්ල හෝ පරිශ්‍රය සන්තකයට ගෙන, එහි සිට හමුවන හෝ එහි සාමාන්‍යයෙන් පදිංචිව සිටින යම් තැනැත්තකු එම ගොඩනැගිල්ලෙන් හෝ පරිශ්‍රයෙන් ඉවත් කරනු ලැබිය යුතු අතර, අවසර රහිතව එම ගොඩනැගිල්ලට හෝ පරිශ්‍රයට ප්‍රවේශ වන යම් තැනැත්තන්ගෙන් එම ස්ථානය ආරක්ෂා කළ යුතු ය ඃ

එසේ වුව ද, එම ගොඩනැගිල්ලට, පරිශ්‍රයට හෝ ස්ථානයට අයිතිය කියාපාන යම් තැනැත්තකුට එකී ගොඩනැගිල්ල හෝ පරිශ්‍රය නිදහස් කිරීම සඳහා ආඥාවක් කරවාගැනීම පිණිස, ඒ සඳහා මහාධිකරණය වෙත ඉල්ලීමක් කිරීමේ හිමිකම තිබිය යුතු ය. එම ආඥාව කිරීමෙන් සති දෙකක කාලසීමාවක් ඉකුත් වූ පසුව, එම ගොඩනැගිල්ල හෝ පරිශ්‍රය ඔහුගේ දැනුම නොමැතිව හෝ ඔහුගේ උපදෙස්වලට පටහැනිව හෝ පාවිච්චි කරන ලද බවට මහාධිකරණය සෑහීමට පත් වේ නම් මහාධිකරණය විසින් එම ගොඩනැගිල්ල හෝ පරිශ්‍රය මුදා හරිනු ලැබිය හැකි ය ඃ

එසේම තවදුරටත්, එකී ගොඩනැගිල්ල හෝ පරිශ්‍රය සන්තකයට ගැනීමෙන් මාස හයක කාලයක් ඇතුළත ඉහත සඳහන් ලෙස වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් නඩු කටයුතු පවරනු නොලැබුවේ නම් එකී ගොඩනැගිල්ල හෝ පරිශ්‍රය එහි නීත්‍යානුකූල අයිතිකරුට ආපසු දෙනු ලැබිය යුතු ය.

(2) මේ නියෝගය හෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ යම් තැනැත්තකු යම් වරදක් සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබ ඇත්තාවූ ද, මේ නියෝගය හෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ හෝ යම් වරදක් සිදු කිරීමෙහිලා හෝ යම් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් හෝ එම ගොඩනැගිල්ල හෝ පරිශ්‍රය පාවිච්චි කර ඇති බවට අධිකරණය සෑහීමට පත් වන්නා වූ ද, අවස්ථාවක එම වරද සඳහා අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි යම් දණ්ඩනයකට අතිරේකව එම ගොඩනැගිල්ල හෝ පරිශ්‍රය රාජසන්තක විය යුතු බවට අධිකරණය විසින් ආඥා කරනු ලැබිය හැකි ය.

වාහන අධිග්‍රහණය කිරීම

9 (1) රාජ්‍ය ආරක්ෂාව සඳහාත්, මහජන සාමය පවත්වා ගැනීම සඳහාත්, ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාම සඳහාත්, ශ්‍රී ලංකාවෙහි යම් වාහනයක් අධිග්‍රහණය කිරීම අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි නිසි බලධරයකුට අදහස් වුවහොත්, එබඳු වාහනයක් ඒ බලධරයාට අධිග්‍රහණය කළ හැකි ය. ඒ අධිග්‍රහණය සම්බන්ධයෙන් අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි නිසි බලධරයාට හැඟෙන විධානයන් ඔහු විසින් කළ හැකි ය.

(2) මේ නියෝගයෙහි (1) වන ඡේදය යටතේ යම් වාහනයක්, නිසි බලධරයා විසින් අධිග්‍රහණය කරනු ලැබූ විට, රාජ්‍ය ආරක්ෂාව සඳහාත් මහජන සාමය පවත්වා ගැනීම සඳහාත්, ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාම සඳහාත් යෝග්‍ය යයි, නිසි බලධරයාට හැඟෙන කාර්යවලට හා ආකාරයට ඒ වාහනය ඔහු විසින් පාවිච්චි කළ හැකි ය. නැතහොත් යෙදිය හැකි ය. එසේම ඒ කාර්යවලට හා ආකාරයට පාවිච්චි කරන ලෙස හෝ යොදන ලෙස බලය දිය හැකි ය.

(3) මේ නියෝගයේ (1) වන ඡේදයෙන් පවරනු ලැබූ බලතල සක්‍රීය ලෙස ක්‍රියාවේ යෙදවීම සඳහා එසේ කිරීම අවශ්‍ය බව නිසි බලධරයාගේ මතය වේ නම්, මුළු ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් හෝ එහි නියමිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් හෝ කරනු ලැබූ නියමයකින්, ඒ නියමය ක්‍රියාත්මක වන අවස්ථාවෙහි නියමය සම්බන්ධ වූ ප්‍රදේශයක, යම් පරිශ්‍රයක, නියමයෙහි විස්තර කරනු ලබන අන්දමේ වාහනයක් තම සන්තකයෙහි හෝ තම පාලනයෙහි ඇති කිසිම තැනැත්තකු විසින්, නියමයෙහි නිශ්චිතව සඳහන් නැතැත්තා හෝ බලධරයා විසින් ඒ වාහනය ඉවත් කිරීමට අවසර දෙන තෙක්, ඒ භූමියෙන් ඒ වාහනය ඉවත් නොකරන ලෙස හෝ ඉවත් නොකරවන ලෙස හෝ එබන්දකට ඉඩ නොහරින ලෙස, නියම කළ හැකි ය.

(4) මේ නියෝගයෙහි ඉහතින්ම වූ විධිවිධාන මගින් යම් තැනැත්තකු වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාවේ යෙදවීමේ දී, ඔහු විසින් ඉල්ලා සිටියහොත්, පොලිස් නිලධරයකු හෝ ආණ්ඩුවේ වෙනත් නිලධරයකු ඔහුට ඒ සඳහා ආධාර හා සහාය දිය යුතු ය.

(5) මේ නියෝගයේ කාර්ය සඳහා 'නිසි බලධරයා' යන්නෙන්, යුද්ධ හමුදාපති, නාවික හමුදාපති, ගුවන් හමුදාපති, පොලිස්පති හෝ සෑම පරිපාලන දිස්ත්‍රික්කයක ම දිස්ත්‍රික් ලේකම්වරයා අදහස් වේ.

පුද්ගල සේවා අධිග්‍රහණය කිරීම

10. රාජ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් හෝ අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා ආධාර වශයෙන් හෝ ඒ සම්බන්ධයෙන් යම් වැඩක් කිරීමට හෝ පුද්ගලික සේවාවක් ලබාදීමට ස්වකීය අත්සන යටතේ නියමයක් මගින් යම් තැනැත්තකුට නියම කිරීමට ඒ වෙනුවෙන් නියමිත බලධරයන් හෝ නිලධරයන් එක් කෙනෙකුට හෝ ඊට වැඩි දෙනෙකුට නියම කිරීම හෝ බලය පැවරීම ජනාධිපතිවරයා විසින් කළ හැකි ය.

මේ නියෝගය යටතේ සාදන ලද යම් නියමයක් යම් තැනැත්තකු විසින් කඩ කරනු ලබන හෝ ඒ අනුව ක්‍රියා කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක ඒ තැනැත්තා වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබූ විට, එම වරද සම්බන්ධයෙන් එම අධිකරණය විසින් පනවන ලද යම් දණ්ඩනයකට අමතරව -

(අ) ඒ වරදකරු කිරීම කරණ කොටගෙන ඒ තැනැත්තාගේ චංචල හෝ නිශ්චල සියලු දේපළ බැඳීම්වලින් නිදහස්ව රාජසන්තක වූ ලෙස සලකනු ලබන්නේ ය; තව ද,

(ආ) මේ නියෝගය බලාත්මක වූ දිනයෙන් පසුව එම දේපල පිළිබඳව ඒ තැනැත්තා විසින් කරනු ලබන යම් අන්සතු කිරීමක් හෝ වෙනත් බැහැර කිරීමක් ශුන්‍ය හා බල රහිත වූ ලෙස සහ ශුන්‍ය හා බල රහිත ලෙස සලකනු ලබන්නේ ය.

කොමසාරිස් ජනරාල්වරයා විසින් අත්‍යවශ්‍ය සේවා සම්බන්ධීකරණය කරනු ලැබිය යුතු බව

11. (1) ජනාධිපතිවරයා විසින්, නියමයක් මගින්, මුළු ශ්‍රී ලංකාව සඳහාම හෝ එහි යම් කොටසක් සඳහා සඳහා අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා වශයෙන් යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබිය හැකි ය. අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාමට අදාළ සියලු ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

(2) මේ නියෝග යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන නියෝජ්‍ය කොමසාරිස්වරුන් හෝ සහකාර කොමසාරිස්වරුන් සංඛ්‍යාවක් අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින්, නමින් හෝ නිලයෙන් පත්කරනු ලැබිය හැකි ය.

(3) මේ නියෝග මගින් හෝ මේ නියෝග යටතේ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති බලතල හෝ නියමකොට ඇති කාර්ය හෝ භාරකොට ඇති කර්තව්‍ය හෝ කිසිවක්, (2) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ යම් නියෝජ්‍ය කොමසාරිස්වරයකු හෝ සහකාර කොමසාරිස්වරයකු වෙත, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින් පවරනු ලැබිය හැකි ය.

(4) මෙම නියෝගය යටතේ වූ වගකීම් ඉටු කිරීමේ කාර්යය සඳහා, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින් -

(අ) ආරක්ෂක අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හෝ මේ නියෝගය යටතේ පත් කරනු ලැබූ නිසි බලධරයකු වෙත පවරනු ලැබූ යම් බලයක්;

(ආ) එම නියෝගයේ කාර්ය සඳහා නිසි බලධරයා වෙත 9 වන නියෝගයෙන් පවරනු ලැබූ යම් බලයක්;

(ඇ) එම නියෝගය යටතේ වූ යම් බලයක් 10 වන නියෝගය යටතේ පවරන ලද්ද වූ යම් බලධරයකු හෝ නිලධරයකු වෙත පවරනු ලැබූ යම් බලයක්,

ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(5) අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යන බවට නිසැකවම වග බලා ගැනීම සඳහා අවශ්‍ය විධාන -

(අ) 5 වන නියෝගය යටතේ පත් කරනු ලැබූ යම් නිසි බලධරයකුට;

(ආ) 10 වන නියෝගය යටතේ යම් බලයක් පවරනු ලැබූ යම් අධිකාරියකට හෝ නිලධරයකුට; සහ

(ඇ) මේ නියෝග යටතේ පත් කරනු ලැබූ යම් සම්බන්ධීකරණ නිලධරයකුට,

අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබා දිය හැකි අතර, එසේ ලබා දෙන සෑම විධානයක්ම පිළිපැදීම අවස්ථාවෝචිත පරිදි නිසි බලධරයාගේ, අධිකාරියේ, නිලධරයාගේ හෝ සම්බන්ධීකරණ නිලධරයාගේ කාර්යය විය යුතු ය.

## III වන කොටස

### රැස්වීම්, පෙරහැර, ප්‍රකාශන, තුවක්කු සහ ප්‍රවේශවීමේ අයිතිවාසිකම් ආදිය පාලනය කිරීම

සීමා කරනු ලැබ ඇති ප්‍රදේශ

12. (1) අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගෙන යෑම සඳහා සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් අත්කර ගනු ලබන හෝ පාවිච්චි කරනු ලබන යම් ප්‍රදේශයකට, ස්ථානයකට හෝ පරිශ්‍රයකට බලය නොලත් තැනැත්තන් ඇතුළුවීම වැළැක්වීම සඳහා විශේෂ ආරක්ෂිත ක්‍රියා මාර්ග යෙදිය යුතු බවට නිසි බලධරයකුගේ මතය වුවහොත්

නියමයෙහි සඳහන් බලධරයාගේ හෝ තැනැත්තාගේ අවසරය නොමැතිව ඒ ප්‍රදේශයට හෝ ස්ථානයට හෝ භූමියට, නියමයෙහි සඳහන්ව තිබිය හැකි නිදහස් කිරීම්වලට යටත්ව, කිසිම තැනැත්තකු ඇතුළු නොවිය යුතු බවට සහ එහි රැඳී නොසිටිය යුතු බවට ඒ නිසි බලධරයා විසින් නියමයකින් විධිවිධාන සැලැස්විය හැකි ය.

(2) මේ නියෝගය යටතේ සාදනු ලැබූ යම් නියමයක් උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු යම් ප්‍රදේශයක, ස්ථානයක හෝ භූමියක සිටියහොත් ඔහුට විරුද්ධව පවරනු ලැබිය හැකි අන්කිසි නීති කෘත්‍යයකට අගති විරහිතව ඒ සඳහා නිසි බලධරයකු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඔහුව එම ස්ථානයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) මේ නියෝගයෙහි 'නිසි බලධරයා' යන්නෙන්, යම් අත්‍යවශ්‍ය සේවයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ සේවයෙහි කාර්ය සඳහා ජනාධිපතිවරයා විසින්, නමින් හෝ නිලයෙන්, නිසි බලධරයකු වශයෙන් පත් කරනු ලැබූ යම් තැනැත්තෙක් අදහස් වේ.

පෙරහැර හා රැස්වීම් පැවැත්වීම තහනම් බව

13. (1) ජනාධිපතිවරයා විසින්, නියමයක් මගින්, ඒ නියමයේ සඳහන් කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක ප්‍රසිද්ධ පෙරහැර හෝ ප්‍රසිද්ධ රැස්වීම් පැවැත්වීම නැතහොත් ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් වන ප්‍රසිද්ධ පෙරහැර හෝ ප්‍රසිද්ධ රැස්වීම් පැවැත්වීම, ඒ නියමය මගින් හෝ මේ නියෝග යටතේ සාදනු ලබන තදනන්තර නියමයන් මගින් හෝ කරනු ලබන නිදහස් කිරීම්වලට යටත්ව, තහනම් කරනු ලැබිය හැකි ය.

(2) ජනාධිපතිවරයා විසින්, ජනාධිපතිවරයාගේ මතය අනුව මහජන සාමයට බාධා සිදු වීම හෝ විරුද්ධම ප්‍රවර්ධනය වීම සිදු වීමට ඉඩ ප්‍රස්ථා ඇති යම් පෙරහැරක් හෝ රැස්වීමක් ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක පැවැත්වීම තහනම් කරමින් විධාන දෙනු ලැබිය හැකි ය.

(3) යම් පොලිස් නිලධරයකු විසින්, මේ නියෝගය යටතේ සාදන ලද යම් නියමයක් හෝ විධානයක් පිළිපැදීම සාක්ෂාත් කිරීම සඳහා සාධාරණ ලෙස අවශ්‍ය විය හැකි යම් පියවර ගැනීම හෝ බලය භාවිත කිරීම කරනු ලැබිය හැකි ය.

ඇඳිරි නීතිය

14. (1) ජනාධිපතිවරයා විසින් ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක් සම්බන්ධයෙන් කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් වේලාවන් අතරතුර හෝ එහි සඳහන් කාලපරිච්ඡේදය තුළ, ඒ නියමයෙන් හෝ මේ නියෝගය යටතේ කරනු ලබන තදනන්තර නියමයකින් හෝ කර ඇති නිදහස් කිරීම්වලට යටත්ව ද ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් තැනැත්තාගෙන් ලබාගත් ලිඛිත අවසරයක බලය යටතේ ද හැර, ඒ ප්‍රදේශය තුළ යම් ප්‍රසිද්ධ මාර්ගයක, දුම්රිය මාර්ගයක, පොදු පිට්ටනියක, පොදු විනෝද ක්‍රීඩා භූමියක හෝ වෙනත් පොදු භූමියක, මුහුදු වෙරළෙහි හෝ ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් වෙනත් යම් ගොඩනැගිල්ලක, පරිශ්‍රයක හෝ ස්ථානයක කිසිදු තැනැත්තකු නොසිටිය යුතු යයි විධාන කළ හැකි ය.

(2) මේ නියෝගයේ (1) ඡේදයේ 'ප්‍රසිද්ධ මාර්ගයක්' යන්නට, යම් ප්‍රසිද්ධ පාලමකට උඩින් වූ යම් පාරක් හෝ යම් ප්‍රසිද්ධ පාරකට අයත් හෝ සම්බන්ධ වූ යම් පදික වේදිකාවක්, කාණුවක්, කණ්ඩියක් හෝ අගලක් ඇතුළත් වේ.

ප්‍රකාශන පාලනය කිරීම

15. (1) රාජ්‍ය ආරක්ෂාවට හෝ මහජන සාමය රැකීමට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාමට හෝ හානිකර විය හැකි කරුණු හෝ හමුදා කැරළි ගැසීමට හෝ කැරළි කෝලාහල ඇති කිරීමට හෝ මහජන කැළඹීලි ඇති කිරීමට හෝ මහජන සාමය රැකීමට නැතහොත් ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාමට තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක් කඩකිරීම හානිකර වන බව නිසි බලධරයාගේ මතය වන්නේ ද, එවැනි නීතියක් කඩකිරීමට හෝ තැනැත්තන් පොළඹවන හෝ දිරිගන්වන කරුණු ශ්‍රී ලංකාවෙහි හෝ ශ්‍රී ලංකාවෙහි යම් නිශ්චිත ප්‍රදේශයක හෝ පළ කිරීම හෝ ශ්‍රී ලංකාවෙහි සිට බැහැර ස්ථානවලට යැවීම වැළැක්වීම හෝ සීමා කිරීම සඳහා අවශ්‍ය යයි තමා විසින් අදහස් කරනු ලබන ක්‍රියාමාර්ග යෙදීම හා විධාන දීම නිසි බලධරයකු විසින් කරනු ලැබිය හැකි ය. තව ද, ප්‍රවෘත්ති වාර්තා, කතුවැකි, ලිපි, කර්තෘට යවන ලියුම්, විකට චිත්‍ර සහ විචාර ඇතුළත් ආරක්ෂක හමුදාවන්ගේ මෙහෙයුම්වලට අදාළ කරුණු පිළිබඳ ලේඛන, චිත්‍ර නිරූපන, ඡායාරූප, සිනමා චිත්‍ර, චිත්‍රපටි, ටෙලිප්‍රින්ටර්, ටෙලිග්‍රාෆ්, රූපවාහිනියේ පළ කිරීමට හෝ විකාශනය කිරීමට පෙර නිසි බලධරයා වෙත ඉදිරිපත් කළ යුතු බවට හෝ ප්‍රදර්ශනය කළ යුතු බවට විධිවිධාන ඇතුළත්ව, අවශ්‍ය ලෙස හෝ අවස්ථානුකූල ලෙස නිසි බලධරයාට පෙනී යන පරිදි, ආනුෂංගික සහ අතිරේක විධිවිධාන මේ ඡේදය යටතේ නිකුත් කරනු ලැබූ විධිවිධානවලට ඇතුළත් විය හැකි ය.

(2) (අ) මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ දෙන ලද විධානයක විධිවිධාන උල්ලංඝනය කරනු ලබන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු ය. තව ද, පුවත්පතක් පළකිරීමේ හේතුවෙන් යම්

තැනැත්තකු එවැනි වරදකට වරදකරු කරනු ලැබුවහොත් නියමයේ නියම කරනු ලබන කාලසීමාව තුළ ඒ තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙහි කිසිම පුවත්පතක් පළ කරනු නොලැබිය යුතු බවට ජනාධිපතිවරයා විසින් කරනු ලබන නියමයකින් විධාන කළ හැකි ය.

(ආ) මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ දෙන ලද යම් විධානයක සඳහන් විධිවිධාන උල්ලංඝනය කරනු ලැබූ අවස්ථාවක සහ ඒ උල්ලංඝනය කිරීම යම් පුවත්පතක යම් ප්‍රකාශනයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක (අ) අනුඡේදයෙහි විධිවිධානවලට අගතියක් නොමැතිව, සාධාරණ යයි තමා විසින් සලකනු ලබන ආකාරයට එක් වරක් හෝ ඊට වැඩි වාර ගණනක් අවවාද කිරීමෙන් පසුව නිසි බලධරයා විසින් -

(i) ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන කාලය තුළ ඒ පුවත්පත කිසිම තැනැත්තකු විසින් මුද්‍රණය කිරීම, පළ කිරීම හෝ බෙදා හැරීම නොකළ යුතු බව හෝ මුද්‍රණය කිරීමට, පළ කිරීමට හෝ බෙද හැරීමට හෝ කිසිම ආකාරයකින් සම්බන්ධ නොවිය යුතු බව ; හෝ

(ii) ඒ පුවත්පත පළ කරනු ලැබූ මුද්‍රණාලය ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කාලය තුළ කවර හෝ කාර්යයන් සඳහා හෝ නියමයෙහි නිශ්චිතව සඳහන් යම් කාර්යයක් සඳහා හෝ පාවිච්චි නොකළ යුතු බව සහ (ඒ නියමය කරනු ලැබුවේ යම් මුද්‍රණාලයක් සම්බන්ධයෙන් ද ඒ මුද්‍රණාලය හෝ එය පිහිටි යම් ස්ථාන හෝ ඒ මුද්‍රණාලයේ හෝ ස්ථානයේ යම් කොටසක් සන්තකයට ගැනීම ඇතුළුව) ඒ නියමය පිළිපැදීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය යයි එසේ බලය දෙනු ලැබූ තැනැත්තන්ට පෙනී යන ක්‍රියාමාර්ග ගැනීමට එහි නිශ්චිතව සඳහන් යම් තැනැත්තකුට ඒ නියමයෙන් බලය දෙනු ලැබිය හැකි බව ; හෝ

නියම කරනු ලැබිය හැකි ය.

(3) ස්වකීය මතය අනුව රාජ්‍ය ආරක්ෂාවට හෝ මහජන සාමය රැකීමට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාමට හෝ හානිකර විය හැකි කරුණු හෝ හමුද කැරළි ගැසීමට, කැරළි කෝළාහල ඇති කිරීමට හෝ මහජන කැළඹීම් ඇති කිරීමට තැනැත්තන් පොළඹවන හෝ දිරිගන්වන කරුණු යම් පුවත්පතක පළ කරනු ලැබේ යයි හෝ පළ කරනු ලැබුවේ යයි හෝ පළ කරනු ලැබිය හැකි යයි නිසි බලධරයකුගේ මතය වුවහොත් ඔහු විසින් -

(අ) නියමයක් මගින්, ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කාලය තුළ ඒ පුවත්පත කිසිම තැනැත්තකු විසින් මුද්‍රණය කිරීම, පළ කිරීම හෝ බෙද හැරීම නොකළ යුතු බව හෝ මුද්‍රණය කිරීමට, පළ කිරීමට හෝ බෙද හැරීමට කිසිම ආකාරයකින් සම්බන්ධ නොවිය යුතු බවට සහ ඒ පුවත්පත් මුද්‍රණය කළ මුද්‍රණාලය නියමයෙහි නිශ්චිතව සඳහන් කාලය තුළ කවර හෝ කාර්යයන් සඳහා හෝ නියමයෙහි නිශ්චිතව සඳහන් යම් කාර්යයක් සඳහා හෝ පාවිච්චි නොකළ යුතු බවට ද, විධාන කළ හැකි ය. තව ද (ඒ නියමය කරනු ලැබුවේ යම් මුද්‍රණාලයක් සම්බන්ධයෙන් ද, ඒ මුද්‍රණාලය හෝ එය පිහිටි යම් ස්ථානයක් හෝ ඒ මුද්‍රණාලය හෝ ස්ථානයේ යම් කොටසක් සන්තකයට ගැනීම ඇතුළුව) ඒ නියමය පිළිපැදීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය යයි එසේ බලය දෙනු ලැබූ තැනැත්තාට පෙනී යන ක්‍රියාමාර්ග ගැනීමට එහි නිශ්චිතව සඳහන් යම් තැනැත්තකුට ඒ නියමයෙන් බලය දිය හැකි ය; නැතහොත්

(ආ) ඒ පුවත්පත සම්බන්ධයෙන් මේ නියෝගයෙහි (1) වන සහ (2) වන ඡේදයන්හි විධිවිධාන සලසා ඇති පරිදි ක්‍රියාමාර්ග ගැනීම හෝ විධාන දීම හෝ නියමයක් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(4) නියමයෙහි නමින් සඳහන් යම් පුවත්පතක් සම්බන්ධයෙන් මේ නියෝගයේ (2) (ආ) ඡේදයේ හෝ (3) වන ඡේදයේ විධිවිධාන යටතේ නිසි බලධරයකු විසින් නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ නියමය, ඒ නාමය යටතේ පළ කරනු ලබන යම් පුවත්පතකට පමණක් නොව, වෙනත් යම් නමකින් යම් පුවත්පතක් පළ කරනු ලබන්නේ නම් එසේ පළ කරනු ලබන පුවත්පත යම් ආකාරයකින් නියමයෙහි සඳහන් පුවත්පත් පවත්වාගෙන යාමෙහි ලා හෝ ඒ වෙනුවෙන් ආදේශ කිරීමෙහි ලා හෝ පළ කරතහොත් ඒ පුවත්පතට ද අදාළ වන්නේ ය.

(5) මේ නියෝගයේ (2) (ආ) ඡේදයේ හෝ (3) වන ඡේදයේ විධිවිධාන යටතේ නියමයක් කරනු ලැබුවේ යම් පුවත්පතක් සම්බන්ධයෙන් ද, ඒ පුවත්පත මුද්‍රණය කිරීම, පළ කිරීම හෝ බෙදහැරීම හෝ එය මුද්‍රණය කිරීමට, පළ කිරීමට හෝ බෙද හැරීමට කිසියම් ආකාරයකින් සම්බන්ධ වීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(6) මේ නියෝගය යටතේ නියමයක් කරනු ලැබීමෙන් පසු යම් අවස්ථාවක දී සුදුසු යයි ජනාධිපතිවරයා අදහස් කරන කොන්දේසිවලට යටත්ව, ඒ නියමය අත්හිටුවිය යුතු යයි ජනාධිපතිවරයා විසින් විධාන කළ හැකි අතර, ඒ විධානය ජනාධිපතිවරයා විසින් යම් අවස්ථාවක දී ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

(7) රාජ්‍ය ආරක්ෂාවට හෝ මහජන සාමය රැකීමට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වා ගෙන යාමට හෝ හානිකර යයි තම මතය පරිදි අදහස් කරනු ලැබූ කරුණු හෝ හමුද කැරළි ගැසීමට හෝ කැරලි කෝලාහල ඇති කිරීමට හෝ මහජන කැළඹීම් ඇති කිරීමට තැනැත්තන් පොළඹවන හෝ දිරි ගන්වන කරුණු ඇතුළත් යම් ලේඛනයක් සකස් කිරීම සඳහා යම් මුද්‍රණාලයක් හෝ යම් තැනැත්තකුගේ පාලනය යටතේ වූ මුද්‍රණාලයක්, පාවිච්චි කරනු ලැබූ බව හෝ පාවිච්චි කරනු ලැබිය හැකි බව නිසි බලධරයකුගේ මතය වුවහොත් අවස්ථාවෝචිත පරිදි ඒ මුද්‍රණාලය හෝ ඒ තැනැත්තාගේ පාලනය යටතේ පවත්නා මුද්‍රණාල සියල්ල හෝ ඉන් යම් මුද්‍රණාලයක් නියමය බලපවත්නා තෙක්, කවර වූ හෝ කාර්යයක් සඳහා හෝ නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන කාර්යයක් සඳහා පාවිච්චි කරනු නොලැබිය යුතු යයි නිසි බලධරයා විසින් නියමයකින් විධාන කළ හැකි ය. (තව ද නියමය කරනු ලැබුවේ යම් මුද්‍රණාලයක් සම්බන්ධයෙන් ද, ඒ මුද්‍රණාලය හෝ එය පිහිටි යම් ස්ථානයක් හෝ ඒ මුද්‍රණාලයේ හෝ ස්ථානයේ යම් කොටසක් සන්තකයට ගැනීම ඇතුළුව) ඒ නියමය පිළිපැදීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය යැයි එසේ බලය දෙනු ලැබූ තැනැත්තන්ට පෙනී යන ක්‍රියාමාර්ග ගැනීමට එහි නිශ්චිතව සඳහන් තැනැත්තන්ට ඒ නියමයෙන් බලය පවරනු ලැබිය හැකි ය.

(8) මේ නියෝගයේ 2(ආ), (3) වන සහ (7) වන ඡේදයන්හි කාර්ය සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ තැනැත්තන්ගෙන් සමන්විත උපදේශක කාරක සභා එකක් හෝ වැඩි ගණනක් පිහිටුවනු ලැබිය යුතු අතර මේ ඡේදවලින් යම් ඡේදයක් යටතේ කරනු ලැබූ යම් නියමයක් සම්බන්ධයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකුට ඒ පිළිබඳව තම විරෝධතා නිසි උපදේශක කාරක සභාවක් වෙත ඉදිරිපත් කළ හැකි ය.

(9) මේ නියෝගයේ (2) (ආ) ඡේදය, (3) වන ඡේදය හෝ (7) වන ඡේදය යටතේ නියමයක් කරනු ලැබූ අවස්ථාවක, ඒ නියමය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත ලියවිල්ලක් මගින් කරුණු ඉදිරිපත් කරනු ලැබිය හැකි බව ද, එසේ කරුණු ඉදිරිපත් කරනු ලැබුව ද නොලැබුව ද නිසි උපදේශක කාරක සභාවක් වෙත විරෝධතා සැල කරනු ලැබිය හැකි බව ද, ඒ නියමය බලපෑ පුවත්පත් හිමියාගේ මුද්‍රණාලයේ අයිතිකරු වෙත දැනුම් දෙනු ලැබීමට කටයුතු සැලැස්වීම නිසි බලධරයාගේ කාර්යය විය යුතුය.

(10) ඉහත දක්වන ලද පරිදි විරෝධතා සලකා බැලීම සඳහා පවත්වනු ලබන උපදේශක කාරක සභාවක යම් රැස්වීමක මූලාසනය ජනාධිපතිවරයා විසින් නම් කරනු ලැබූ සභාපතිවරයකු විසින් දැරිය යුතු අතර, ස්වකීය විරෝධතා සනාථ කිරීම සඳහා පෞද්ගලික කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් විරෝධය පාන්නාට සලස්වාදීම සභාපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(11) ඉහත දක්වන ලද පරිදි යම් විරෝධතා පිළිබඳව උපදේශක කාරක සභාවක වාර්තාව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර එය සලකා බැලීමෙන් පසුව, විරෝධතාවන්ට අදළ වන නියමය ජනාධිපතිවරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කිරීම නැතහොත් වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය.

(12) මේ නියෝගයේ යම් විධිවිධානයක් හෝ මේ නියෝගයේ (6) වන ඡේදය යටතේ කරනු ලැබූ යම් විධානයක් හා සම්බන්ධ වූ යම් කොන්දේසියක් කඩ කරමින්, යම් පුවත්පතක් මුද්‍රණය කරනු ලබන, පළ කරනු ලබන හෝ බෙද හරිනු ලබන අවස්ථාවක, ඒ පුවත්පතේ අයිතිකරු, කළමනාකරු, කර්තෘ සහ ප්‍රකාශක එම කොන්දේසිය කඩ කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් විධානය ප්‍රත්‍යාදිෂ්ට කරන ලැබුව ද නොලැබුව ද, වරදකට වෙන් වෙන් වශයෙන් වරදකරු විය යුතු ය.

(13) මේ නියෝගයෙහි -

(අ) 'සිනමා චිත්‍රපටය' යන්නට, ශබ්ද පථයක් ද එවැනි චිත්‍රපටියක් ප්‍රදර්ශනය කිරීම සම්බන්ධයෙන් ශබ්ද ප්‍රජනනය කිරීමේ කාර්ය සඳහා ශබ්ද සටහන් කර ගනු ලබන වෙනයම් අයිතමයක් ද ඇතුළත් වේ;

(ආ) 'ප්‍රකාශනය' යන්නෙන්, සිනමා චිත්‍රපටයක් සම්බන්ධයෙන් වන විට මහජනයාට චිත්‍රපටිය ප්‍රදර්ශනය කිරීම අදහස් වන අතර ඉහත කී පරිදි චිත්‍රපටය ප්‍රදර්ශනය කිරීම සම්බන්ධව යම් ශබ්දවල යාන්ත්‍රික හෝ විද්‍යුත් ප්‍රජනන එයට ඇතුළත් වේ;

(ඇ) 'පුවත්පත' යන්නට, යම් සංග්‍රහයක්, සඟරාවක්, පත්‍රිකාවක් හෝ වෙනත් ප්‍රකාශනයක් ඇතුළත් වේ; සහ

(ඈ) 'මුද්‍රණාලය' යන්නට, මුද්‍රණය, ශිලා මුද්‍රණය, ඡායාරූප ශිල්පය හෝ අන්‍ය ආකාරයකින් වචන නිරූපණය කිරීමේ හෝ ප්‍රජනනය කිරීමේ වෙනත් පිළිවෙළක් සඳහා පාවිච්චි කළ හැකි යම් යන්ත්‍රයක්, උපකරණයක් හෝ යන්ත්‍ර පට්ටලයක් හෝ ඒ යන්ත්‍රයට, උපකරණවලට හෝ යන්ත්‍ර පට්ටලයට අයිති යම් අච්චු අකුරු හෝ වෙනත් ද්‍රව්‍යයන් ඇතුළත් වේ.

උපදේශක කාරක සභා.

16. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක සෑම ප්‍රාදේශීය ලේකම්වරයකුම, ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා රාජ්‍ය සේවකයන්ගෙන්, වෘත්තීය සංගම් නිලධාරීන්ගෙන් සහ ප්‍රජාව අතර පිළිගැනීමක් ඇති වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත කාරක සභාවක් පත් කළ යුතු ය. ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත මහජන සාමය ආරක්ෂා කර ගැනීම සහ අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාම සම්බන්ධයෙන්, අදාළ බලධරයන්ට උපදෙස් දීම, ඒ සෑම කාරක සභාවක ම කාර්යය වන්නේ ය.

තුවක්කු සහ පුපුරණ ද්‍රව්‍ය.

17. (1) රාජ්‍ය ආරක්ෂාව හා මහජන සාමය රැක ගැනීමේ අරමුණ ඇතිව පොලිස්පතිවරයා විසින් යම් තැනැත්තකුගේ සන්තකයෙහි තිබෙන යම් තුවක්කුවක් හෝ පුපුරණ ද්‍රව්‍යයක් ඉවත් කිරීමට හා ඔහු විසින් නිශ්චය කරනු ලබන ස්ථානයක හා භාරයෙහි එය තැබීමට විධාන කළ හැකි ය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ පොලිස්පතිවරයා විසින් නිකුත් කරනු ලැබූ යම් විධානයක නමින් හෝ නිලයෙන් නිශ්චිතව සඳහන් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඒ විධානය ක්‍රියාවේ යෙදවිය හැකි ය. ඒ විධානය ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා වෙනයම් තැනැත්තකු හෝ තැනැත්තන් විසින් ඒ තැනැත්තාට සහාය විය හැකි අතර, යම් ස්ථානයකට හෝ තැනකට ඇතුළුවීම හෝ ස්ථානයට හෝ තැනට ඇතුළුවීමේ කාර්යය සඳහා යම් බාහිර හෝ අභ්‍යන්තර දෙරක් හෝ ජනේලයක් හෝ යම් තුවක්කුවක් නැතහොත් පුපුරණ ද්‍රව්‍යයන් තබනු ලැබූ ලෙස ඒ තැනැත්තා විසින් සැක කරනු ලබන යම් භාජනයක් හෝ ගබඩාවක් විවෘත කිරීම හෝ කඩා විවෘත කිරීම කළ හැකි ය.

(3) මේ නියෝගයෙන් (1) වන ඡේදය යටතේ පොලිස්පතිවරයා විසින් නිකුත් කරනු ලැබූ නියමයකට අදාළ වන යම් තුවක්කුවක් හෝ පුපුරණ ද්‍රව්‍යයක් සැඟවීම හෝ ඒ නියමය ක්‍රියාවේ යෙදවීම වැළැක්වීමේ හෝ බාධා කිරීමේ අදහසින් වෙනයම් ක්‍රියා සිදු කිරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

## IV වන කොටස

### අධීක්ෂණය, සෝදිසි කිරීම, අත් අඩංගුවට ගැනීම හා රඳවා තබා ගැනීම

සීමාකිරීමේ නියමය.

18. (1) (අ) රාජ්‍ය ආරක්ෂාවට හෝ මහජන සාමය පවත්වා ගෙන යාමට හෝ අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාමට හෝ අගතිදායක වන යම් ආකාරයකින් ක්‍රියා කිරීමෙන් ; හෝ

(ආ) මේ නියෝගවල 25 වන නියෝගයේ හෝ 44 වන නියෝගයේ (2) වන ඡේදයේ (අ) අනුඡේදයේ හෝ (ආ) අනුඡේදයෙහි හෝ 75 වන නියෝගයෙහි (3) වන ඡේදයෙහි විධිවිධාන අතුරෙන් යම් විධිවිධානයකට යම් ආකාරයකින් පටහැනිව ක්‍රියා කිරීමෙන්,

යම් කිසි තැනැත්තකු වැළැක්වීමේ අදහසින් ඒ තැනැත්තා සම්බන්ධව පහත දැක්වෙන සියලු කාර්යය හෝ ඉන් කිසිවක් සඳහා නියමයක් කිරීම අවශ්‍ය යයි රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් එසේ නියමයක් කළ හැකි ය ;-

(i) ඒ නියමය මගින් හෝ ඒ නියමයෙහි සඳහන් යම් බලධරයකු හෝ තැනැත්තකු විසින් ඒ තැනැත්තාට අවසර දෙනු ලැබිය හැකි යම් පමණකට හැර, එලෙස නියම කරනු ලැබිය හැකි ශ්‍රී ලංකාවේ එවැනි යම් ප්‍රදේශයක ඒ තැනැත්තා නොසිටිය යුතු බවට වගබලා ගැනීම ;

(ii) ඒ නියමයෙහි සඳහන් කර ඇති ආකාරයෙන්, එහි සඳහන් වේලාවන්හි දී එහි සඳහන් බලධරයකුට හෝ තැනැත්තකුට තමාගේ යාම් ඊම් දන්වන ලෙස ඒ තැනැත්තාට නියම කිරීම ;

(iii) ඒ නියමයෙහි සඳහන් කර ඇති බලධරයාගේ හෝ තැනැත්තාගේ අවසරය නොමැතිව ඒ තැනැත්තාට ස්වකීය නිවසින් පිටවීම තහනම් කිරීම සහ ඒ නියමයෙහි සඳහන් හෝ ඒ නියමයෙහි සඳහන් කර ඇති බලධරයා හෝ තැනැත්තා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් අවස්ථානුගත කාරණාවක දී හැර අන් කිසි තැනැත්තකු ඒ නිවසට ඇතුළුවීම හෝ ඉන් පිටවීම තහනම් කිරීම ;(iv) ගමන් බලපත්‍රයක් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ගමනක් යෑම සඳහා ගමන් ලියකියවිලි හෝ ප්‍රවේශ පත්‍ර ඒ තැනැත්තා සන්තකයෙහි තිබේ නම්, අවස්ථාවෝචිත පරිදි එම ගමන් බලපත්‍රය හෝ ගමන් ලියකියවිලි හෝ ප්‍රවේශ පත්‍ර ඒ නියමයෙහි සඳහන් බලධරයා හෝ තැනැත්තා වෙත ආපසු භාර දෙන ලෙස ඔහුට නියම කිරීම ;

(v) යම් නිශ්චිතව සඳහන් කරන ලද භාණ්ඩ ඒ තැනැත්තා විසින් සිය සන්තකයෙහි තබා ගැනීම හෝ ප්‍රයෝජනයට ගැනීම තහනම් කිරීම හෝ සීමා කිරීම; සහ

(vi) ඒ තැනැත්තාගේ රක්ෂාව හෝ ව්‍යාපාරය පිළිබඳව ද වෙනත් තැනැත්තන් සමග වූ ඔහුගේ ආශ්‍රය හෝ පණිවුඩ හුවමාරුව පිළිබඳව ද ප්‍රවෘත්ති පැතිරවීම හෝ මත ප්‍රචාරය කිරීම සම්බන්ධයෙන් වූ ඔහුගේ කටයුතු පිළිබඳව ද, ඒ නියමයෙහි සඳහන් කර ඇති යම් සීමාකිරීම් ඔහු කෙරෙහි පැනවීම.

(2) මේ නියෝගයේ (1) වන ඡේදයේ (i) වන අනුඡේදය යටතේ කරන ලැබූ නියමයන් කඩ කරමින් යම් තැනැත්තකු, යම් ප්‍රදේශයක සිටියහොත් හෝ එබඳු නියමයන් අනුව යම් ප්‍රදේශයකින් ඉවත්ව යාම පැහැර හැරියහොත්, ඔහුට විරුද්ධව පවත්වනු ලැබිය හැකි යම් නීති කෘත්‍යයකට හානියක් නොවන පරිදි, යම් පොලිස් නිලධරයකු විසින් හෝ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ වෙනත් ඕනෑම තැනැත්තකු විසින් ඔහු ඒ ප්‍රදේශයෙන් ඉවත් කළ හැකි ය.

තැනැත්තන් සිරභාරයට ගැනීම.

19. (1)(අ) රාජ්‍ය ආරක්ෂාවට හෝ මහජන සාමය පැවැත්වීමට හෝ අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාමට හානි පමුණුවන යම් ආකාරයකින් ක්‍රියාකිරීමෙන් ; හෝ

(ආ) මේ නියෝගවල 44 වන නියෝගයෙහි (2) වන ඡේදයෙහි (අ) අනුඡේදයේ හෝ (ආ) අනුඡේදයෙහි හෝ 25 වන නියෝගයේ විධිවිධානවලින් යම් විධිවිධාන කිසිවකට පටහැනිව ක්‍රියා කිරීමෙන්,

යම් තැනැත්තකු වැළැක්වීමේ අදහසින්, ඒ තැනැත්තා සම්බන්ධව එලෙස ක්‍රියා කිරීම අවශ්‍ය යයි, රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මතය වන අවස්ථාවක, ඒ තැනැත්තා අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම නියම කරන නියමයක් ඔහු විසින් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද, මේ ඡේදය යටතේ වූ නියමයක් මත කිසිම තැනැත්තකු එක් අවුරුද්දක් ඉක්මවන කාල සීමාවක් සඳහා රඳවා තබා ගනු නොලැබිය යුතුය.

(2) මේ නියෝගයෙහි (1) වන ඡේදය යටතේ වූ කරනු ලැබූ යම් නියමයක් ක්‍රියාත්මක කිරීමට හා ඒ සඳහා අවශ්‍ය විය හැකි සියලු බලය යෙදවීමට යම් පොලිස් නිලධරයකුට හෝ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකුට බලය තිබිය යුතු ය.

(3) මේ නියෝගයෙහි (1) වන ඡේදය යටතේ සිදු කළ නියමයකට අනුව රඳවා තබනු ලැබූ යම් තැනැත්තකු නීත්‍යනුකූල සිරභාරයෙහි රඳවා තැබූ තැනැත්තකු ලෙස සැලකිය යුතු ය. එසේම පොලිස්පතිවරයා විසින් බලය දෙනු ලැබූ ස්ථානයක ඔහු විසින් නිකුත් කරනු ලැබූ උපදෙස් වලට අනුකූලව ඔහු රඳවා තැබිය යුතුය. තව ද බන්ධනාගාර ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ බන්ධනාගාරයක ඒ තැනැත්තා එසේ රඳවා තබනු ලැබූ විටක -

(අ) ඒ ආඥාපනතෙහි IX වන වන කොටසේ විධිවිධාන හැර, ඒ ආඥාපනතේ සියලු විධිවිධාන; සහ

(ආ) සිරකරුවන් බැලීමට ඒම හා ඔවුන්ගේ ලිපි ගනුදෙනු සම්බන්ධයෙන් වූ රීති හැර, ඒ ආ{ාපනත යටතේ සාදනු ලැබූ සියලු රීති,

ඒ ආඥාපනතෙහි අර්ථානුකූලව ඒ තැනැත්තා සිවිල් සිරකරුවෙකු වූවාක් සේ ඒ තැනැත්තා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය:

එසේ වූව ද, පොලිස්පතිවරයා විසින් තමාට යෝග්‍ය යයි සලකනු ලබන අවස්ථාවක -

(අ) මේ ඡේදයේ පෙරාතුව ම වූ විධිවිධාන යටතේ ඒ තැනැත්තාට අදාළ වන එකී ආඥාපනතේ විධිවිධාන හෝ ඒ ආඥාපනත යටතේ සාදනු ලැබූ යම් රීති ඒ තැනැත්තා කෙරෙහි අදාළ විය යුතු යයි හෝ අදාළ නොවිය යුතු යයි හෝ නියමයෙහි සඳහන් සංශෝධනය හෝ වෙනස් කිරීම්වලට යටත්ව නියමයකින් විධාන කළ හැකි ය; තව ද,

(ආ) පොලිස්පතිවරයා විසින් කලින් කලට නියම කරනු ලබන ආකාරයකට, යම් වෙලාවක හා ස්ථානයක දී ඒ තැනැත්තා බැලීම සඳහා ඒමට සහ ඔහුගේ ලිපි ගනුදෙනුවලට අවසර දීම කළ හැකි ය.

(4) මේ නියෝගයෙහි කාර්යය සඳහා, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ තැනැත්තන්ගෙන් සමන්විත උපදේශක කාරක සභා එකක් හෝ වැඩි ගණනක් තිබිය යුතු ය. මේ නියෝගය යටතේ තමන්ට විරුද්ධව කරනු ලැබූ නියමයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඔහුගේ විරෝධතා එවැනි කාරක සභාවකට ඉදිරිපත් කළ හැකි ය.

(5) මේ නියෝගය යටතේ යම් තැනැත්තකුට විරුද්ධව නියමයක් කරනු ලැබුවේ ද ඒ සම්බන්ධයෙන් ලියවිල්ලකින් ජනාධිපතිවරයාට කරුණු දක්වීමට අවස්ථාවක් හැකිතාක් ඉක්මණින් ඒ තැනැත්තාට සලස්වා දීම රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කාර්යය විය යුතු ය. එසේ කරුණු දක්වීමක් කළත් නොකළත් ඉහත කී පරිදි එවැනි යම් උපදේශක කාරක සභාවකට ඔහුගේ විරෝධතා දක්වීම පිළිබඳ ඔහුගේ අයිතිය ඔහුට දැනුම් දිය යුතු ය. ඒ විරෝධතා විභාග කිරීම හා ඒ පිළිබඳව සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් රීති සෑදිය හැකි ය.

(6) ඉහත කී පරිදි ඒ විරෝධතා සලකා බැලීම සඳහා පවත්වනු ලබන උපදේශක කාරක සභාවක යම් රැස්වීමක මූලාසනය ජනාධිපතිවරයා විසින් නම් කරනු ලබන සභාපතිවරයකු විසින් දැරිය යුතු ය. මේ නියෝගය යටතේ විරෝධය පාන්නාට විරුද්ධව නියමය කරනු ලැබූ හේතු ඔහුට දැන්වීම හා ස්වකීය කරුණු දක්වීම සිදු කිරීමට ඔහුට හැකිවීම පිණිස, සභාපතිවරයාගේ මතය අනුව ප්‍රමාණවත් කරුණු ඔහුට සැපයීම සභාපතිවරයාගේ කාර්යය විය යුතුය.

(7) උපදේශක කාරක සභාවක් තුන් දෙනෙකුගෙන් සමන්විත වූ අවස්ථාවක, එහි යම් රැස්වීමක ගණපූරණය දෙදෙනකු විය යුතු අතර, උපදේශක කාරක සභාවක් තුන් දෙනෙකුට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වූ අවස්ථාවක, ගණපූරණය තුන් දෙනකු විය යුතු ය.

(8) ඉහත කී යම් විරෝධතාවක් සම්බන්ධ උපදේශක කාරක සභාවක වාර්තාව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යැවිය යුතු අතර එය සලකා බැලීමෙන් පසු විරෝධතාවට අදළ වන නියමය ඔහු විසින් අවලංගු කළ හැකි ය.

(9) මේ නියෝගයෙහි (1) වන ඡේදය යටතේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් නියමයක් කරනු ලැබුවේ ද ඒ තැනැත්තා මේ නියෝගවල 75 වන නියෝගය යටතේ තහනම් කරනු ලැබූ සංවිධානයක සාමාජිකයෙකු වන බව හෝ සාමාජිකයකු වී සිටි බවට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ලිඛිතව සහතික කරන අවස්ථාවක, ඒ තැනැත්තා සම්බන්ධයෙන් මේ නියෝගයෙහි (4), (5), (6), (7) හා (8) වන ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතුය.

(10) මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ කරනු ලබන නියමයක් කිසිම හේතුවක් නිසා යම් අධිකරණයකදී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

සෝදිසි කිරීමේ,තහනමට ගැනීමේ, සිරභාරයටගැනීමේ හා රඳවාතබා ගැනීමේ බලතල.

20. (1) යම් රජයේ නිලධරයකු හෝ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවුක හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු හෝ මේ නියෝගය යටතේ ක්‍රියා කිරීමට ජනාධිපතිවරයා විසින් බලය දෙනු ලැබූ අන්කිසි තැනැත්තකු හෝ විසින් යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් කරන්නාවූ හෝ කරනු ලැබූ නැතහොත් වරදක් හා සම්බන්ධ හෝ වරදක් කරන බවට හෝ කරනු ලැබූ බවට සැක කරනු ලැබීමට යුක්ති සහගත හේතු ඇත්තාවූ හෝ තැනැත්තකු සෝදිසි කළ හැකිය. එසේ සෝදිසි කිරීමේ කාර්යය සඳහා එකී තැනැත්තකු රඳවා තබාගත හැකිය. නැතහොත් වරෙන්තුවක් නොමැතිව එකී තැනැත්තකු සිරභාරයට ගත හැකිය. තවද වරද සිදු කිරීමේ දී හා ඒ සම්බන්ධයෙන් පාවිච්චි කරනු ලැබූ කුමන අන්දමේ හෝ යම් වාහනයක්, යාත්‍රාවක්, භාණ්ඩයක්, ද්‍රව්‍යයක් හෝ දෙයක් සෝදිසි කිරීම, තහනමට ගැනීම, ඉවත් කිරීම හා රඳවා තබා ගැනීම කළ හැකිය.

(2) (1) වන ඡේදය යටතේ රඳවා තබා ගනු ලැබූ යම් තැනැත්තකු පැය විසිහතරක් ඇතුළත ළඟම පිහිටි පොලිස් ස්ථානය වෙත භාර දෙනු ලැබිය යුතු ය.

(3) මේ නියෝගයේ (1) වන ඡේදය යටතේ සෝදිසියක් පවත්වන තැනැත්තකු විසින් සෝදිසි කරනු ලැබූ ස්ථානයෙහි, භූමියෙහි, වාහනයෙහි හෝ යාත්‍රාවෙහි සිටි අන් කිසි තැනැත්තකුගෙන් හෝ සෝදිසි කරනු ලැබූ තැනැත්තාගෙන් සෝදිසි කිරීමේ කාර්යය හා සම්බන්ධ හෝ එයට අදළ වූ හෝ යම් කරුණක් සම්බන්ධයෙන් ප්‍රශ්න කළ හැකි ය.

(4) මේ නියෝගයේ (3) වන ඡේදය යටතේ ප්‍රශ්න කරනු ලැබූ සෑම තැනැත්තකු විසින්ම ප්‍රශ්න කරනු ලැබූ කරුණ සම්බන්ධයෙන් තමා දන්නා යම් තොරතුරක් සැපයිය යුතු ය.

(5) මේ නියෝගය යටතේ සෝදිසි කළ යුතු යම් පරිශ්‍රයක, ස්ථානයක, වාහනයක හෝ යාත්‍රාවක පදිංචිව සිටින නැතහොත් එබන්දක් භාරව සිටින තැනැත්තකු විසින්, සෝදිසිය පවත්වන තැනැත්තාගේ ඉල්ලීම අනුව ඔහුට ඇතුළුවීමට ඉඩ හැරීම හා එහි සෝදිසියක් කිරීම සඳහා සියලු යුක්ති සහගත පහසුකම් ඔහුට සැලසීම ද කළ යුතු ය.

(6) මේ නියෝගය යටතේ සෝදිසියක් පවත්වන තැනැත්තා විසින් සෝදිසි කළ යුතු පරිශ්‍රයට, ස්ථානයට, වාහනයට හෝ ඒ යාත්‍රාවට ඇතුළුවීම සඳහා යම් බාහිර හෝ අභ්‍යන්තර දොරක් හෝ ජනේලයක් විවෘත කළ හැකිය. නැතහොත් කඩා විවෘත කළ හැකිය.

(7) ස්ත්‍රියක සෝදිසි කිරීමට අවශ්‍ය වූ අවස්ථාවක සෝදිසිය වෙනත් ස්ත්‍රියක විසින් කළ හැකි ය.

(8) සිරභාරයට ගැනීමේ නිලධරයා පොලිස් නිලධරයකු වන අවස්ථාවක, සිරභාරයට ගැනීම කරනු ලැබුවේ යම් කොට්ඨාසයක් තුළ ද ඒ කොට්ඨාසයේ පොලිස් අධිකාරීවරයා වෙත ද, සිරභාරයට ගැනීමේ නිලධරයා සන්නද්ධ හමුදාවක සාමාජිකයකු වන අවස්ථාවක, සිරභාරයට ගැනීම කරනු ලැබුවේ යම් ප්‍රදේශයක් තුළ ද ඒ ප්‍රදේශයේ අණදෙන නිලධරයා වෙත ද, එසේ සිරභාරයට ගැනීමෙන් පැය විසිහතරක් ඇතුළත (1) වන ඡේදය යටතේ කරන ලද සිරභාරයට ගැනීමට පිළිබඳව, වාර්තා කිරීම සිරභාරයට ගැනීම සිදු කළ නිලධරයාගේ කාර්යය විය යුතු ය.

(9) මේ නියෝගයේ විධිවිධාන යටතේ යම් තැනැත්තකු සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන යම් ආකෘතියක සිරභාරයට ගැනීම පිළිගන්නා වූ ලේඛනයක් අවස්ථාවෝචිත පරිදි, භාර්යාවට, ස්වාමිපුරුෂයාට, පියාට, මවට හෝ වෙනත් යම් සමීප ඥාතියෙකුට නිකුත් කිරීම සිරභාරයට ගැනීම සිදු කළ නිලධරයාගේ කාර්යය විය යුතු ය. සිරභාරයට ගනු ලැබූ එවැනි යම් තැනැත්තකු සිරභාරයෙන් නිදහස් කරනු ලැබූ විට, ඒ ලේඛනය උචිත බලධරයා වෙත ආපසු භාරදීම හෝ ඔහු වෙත ඉදිරිපත් කිරීම, ඒ ලේඛනය දරන්නාගේ කාර්යය විය යුතු ය:

එසේ වුවද, යම් තැනැත්තකු සිරභාරයට ගෙන ඇත්තා වූ ද ඉහත සඳහන් ආකාරයට ලේඛනයක් නිකුත් කිරීමට නොහැකි වන්නාවූ ද අවස්ථාවක දී, ඒ සිරභාරයට ගැනීම කළ නිලධරයා පොලිස් නිලධරයකු නම් එවැනි ලේඛනයක් නිකුත් කිරීමට නොහැකි වීමට හේතු සඳහන් කරමින් සටහනක් අදළ පොලිස් ස්ථානයේ තොරතුරු පොතෙහි ඔහු විසින් ඇතුළත් කළ යුතු අතර, සිරභාරයට ගැනීම කළ නිලධරයා සන්නද්ධ හමුදාවක සාමාජිකයකු නම්,

ඔහු විසින් එවැනි ලේඛනයක් නිකුත් කිරීමට නොහැකි වීමට හේතු අදළ පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත වාර්තා කළ යුතුය. එවිට එම කරුණ ඊට හේතු ද සමග තොරතුරු පොතේ සටහන් කිරීම ඒ ස්ථාන භාර නිලධරයාගේ කාර්යය වන්නේ ය.

(10) (9) වන ඡේදයේ නියම කොට ඇති පරිදි සිරභාරයට ගැනීම පිළිගන්නා වූ ලේඛනයක් නිකුත් කිරීම, යුක්ති සහගත හේතුවක් නොමැතිව යම් තැනැත්තකු විසින් පැහැර හැරියහොත් හෝ එම ඡේදයේ අතුරු විධානයේ සඳහන් පරිදි වූ සටහන් කිරීම ඕනෑකමින් ම මග හැරියහොත් හෝ ඒ ලේඛනය නිකුත් නොකළ බව සහ ඊට හේතු වාර්තා කිරීම පැහැර හැරියහොත්, ඔහු වරදකට වරදකරු වන අතර, මහාධිකරණය ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකක කාලයක් දක්වා බන්ධනාගාරගත කරනු ලැබීමට සහ දඩයකට ඔහු යටත් වන්නේය.

(11) මේ නියෝගයේ විධිවිධාන යටතේ යම් දේපළක් තහනමට ගනු ලැබුවා වූ හෝ රඳවා තබාගනු ලැබුවා වූ අවස්ථාවක, තහනමට ගැනීම හෝ රඳවා තබාගැනීම ක්‍රියාත්මක කරන තැනැත්තා විසින්, ඒ දේපළ තහනමට ගනු ලැබුවේ යම් තැනැත්තකුගේ භාරයෙන් ද ඒ දේපළ සම්බන්ධයෙන් වූ ලදුපතක් ඒ තැනැත්තා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

19 වන නියෝගය යටතේ සිරභාරයට ගනු ලැබූ හා රඳවා තබාගනු ලැබූතැනැත්තන් සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන.

21. (1) 19 වන නියෝගය යටතේ සිරභාරයට ගනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි 36 වන, 37 වන හා 38 වන වගන්තිවල විධිවිධාන අදළ නොවිය යුතු ය:

එසේ වුවද, මේ නියෝගවල 19 වන නියෝගයේ විධිවිධාන යටතේ යම් තැනැත්තකු සිර භාරයට ගනු ලැබ රඳවා තබාගනු ලැබූ අවස්ථාවක දී, ඒ එක් එක් අවස්ථාවට අදළ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන, යුක්ති සහගත කාලයක් තුළ දී යම් මහෙස්ත්‍රාත්වරයකු වෙත ඒ තැනැත්තා ඉදිරිපත් කරනු ලැබිය යුතු නමුත් ඒ ඉදිරිපත් කිරීම කිසිදු විටක එකී සිරභාරයට .ැනීමෙන් දින තිහක් ගත වීමෙන් පසුව නොවිය යුතු ය.

තවද, මහෙස්ත්‍රාත්වරයා විසින් නීතිපතිවරයාගේ පූර්ව ලිඛිත අනුමතය ඇතිව මිස, එම තැනැත්තා ඇප පිට මුද නොහැරිය යුතු ය.

මේ නියෝගවල විධිවිධානවලට අනුකූලව යම් තැනැත්තකු ඉදිරිපත් කිරීම (2) වන ඡේදය යටතේ ඒ තැනැත්තා රඳවා ගනු ලැබීම කෙරෙහි බලපෑමක් නොවිය යුතු ය.

(2) 19 වන නියෝගයේ විධිවිධාන අනුව පොලිස්පතිවරයා විසින් අවසර දෙන ලද ස්ථානයක රඳවා තබාගනු ලැබූ යම් තැනැත්තකු ඒ නියෝගය යටතේ ඔහු අත්අඩංගුවට ගනු ලැබූ දින සිට ගණන් බලන දින අනූවකට නොවැඩි කාලසීමාවක් තුළ එසේ රඳවා තබාගනු ලැබිය හැකි අතර, ඒ ස්ථානය භාරව සිටින නිලධරයා විසින් ඒ තැනැත්තා ඒ කාලසීමාව අවසන් වීමට පෙර නිසි බලය ඇති අධිකරණයක් ඉදිරියට පමුණුවනු ලැබුවේ නම් මිස, ඒ කාලසීමාව අවසානයේ දී ඒ නිලධරයා විසින් ඔහු නිදහස් කළ යුතු ය. තවද, බන්ධනාගාර ආඥාපනත යටතේ පිහිටුවන ලද බන්ධනාගාරයක ඒ තැනැත්තා එසේ රඳවා තබාගනු ලැබ ඇති අවස්ථාවක -

(අ) එම ආඥාපනතේ IX වන කොටසේ විධිවිධාන හැර, එම ආඥාපනතේ සියලු විධිවිධාන; සහ

(ආ) සිරකරුවන් බැලීමට සහ ඔවුන් සමග ලිපි හුවමාරු කර ගැනීමට අදළ රීති හැර, එම ආඥාපනත යටතේ සාදන ලද සියලු රීති,

ඒ තැනැත්තා එම ආඥාපනතේ අර්ථානුකූලව සිවිල් සිරකරුවකු වූවාක් ලෙස ඔහු සම්බන්ධයෙන් අදළ විය යුතු ය:

එසේ වුවද, අවස්ථානුකූල යයි පොලිස්පතිවරයා විසින් යෝග්‍ය යයි සලකන ලද අවස්ථාවක -

(අ) මේ ඡේදයේ ඉහතින් වූ විධිවිධාන යටතේ ඒ තැනැත්තාට අදළ වන එකී ආඥාපනතේ විධිවිධාන කිසිවක් හෝ ඒ යටතේ සාදන ලද රීති කිසිවක් හෝ අදළ නොවිය යුතු බවට නැතහොත් නියමයෙහි නිශ්චිත වශයෙන් සඳහන් කරනු ලබන යම් සංශෝධනවලට හෝ වෙනස් කිරීම්වලට යටත්ව අදළ විය යුතු බවට හෝ පොලිස්පතිවරයා විසින් නියමයක් මගින් විධාන කළ හැකිය; තවද

(ආ) පොලිස්පතිවරයා විසින් කලින් කල විධාන කරනු ලබන ආකාරයකින්, යම් වේලාවක හා ස්ථානයක දී ඒ තැනැත්තා බැලීමට සහ ඔහු සමග ලිපි හුවමාරු කර ගැනීමට අවසර දෙනු ලැබිය හැකිය.

(3) 19 වන නියෝගයේ විධිවිධාන අනුව සිරභාරයට ගනු ලැබ රඳවා තබාගනු ලැබූ තැනැත්තකු (2) වන ඡේදයේ සඳහන් නිලධරයා විසින් නිසි අධිකරණ බලය ඇති අධිකරණයකට ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, බන්ධනාගාර ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ බන්ධනාගාරයක පිස්කල්ගේ භාරයෙහි ඒ තැනැත්තා රඳවා තැබිය යුතු යැයි ඒ අධිකරණය විසින් ආඥා කළ යුතුය.

(4) මේ නියෝගයෙහි පොලිස්පතිවරයා යන්නට, යම් නියෝජ්‍ය පොලිසිපතිවරයකු හෝ යම් පොලිස් අධිකාරිවරයකු හෝ යම් සහකාර පොලිස් අධිකාරිවරයකු ඇතුළත් වේ.

භාරවනතැනැත්තන් අත්අඩංගුවේ" තබා ගැනීම.

22. (1) (183 වන අධිකාරය වූ) පුපුරණ ද්‍රව්‍ය පනත, 1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනත, (182 වන අධිකාරය වූ) තුවක්කු ආඥාපනත, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීම (තාවකාලික විධිවිධාන) පනත හෝ දණ්ඩ නීති සංග්‍රහයේ VI වන පරිච්ඡේදය, VII වන පරිච්ඡේදය හෝ VIII වන පරිච්ඡේදය හෝ හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් සමබන්ධයෙන් හෝ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්වලට බියෙන් හෝ යම් පොලිස් නිලධරයකුට, ශ්‍රී ලංකා සන්නද්ධ හමුදවල යම් සාමාජිකයකුට, යම් රජයේ නිලධරයකුට හෝ ජනාධිපතිවරයා විසින් නියමයක් මගින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට භාරවන (මෙහි මින් මතු "භාර වන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකුට ඔහු ස්වේච්ඡාවෙන් භාරවන බවට වූ ලිඛිත ප්‍රකාශයක් ඒ නි,ධරයාට හෝ ඒ වෙනුවෙන් බලයලත් තැනැත්තාට දෙන ලෙස නියම කරනු ලැබිය යුතුය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදය ප්‍රකාර යම් තැනැත්තකු භාරවන අවස්ථාවක, ඒ භාරවීමෙන් පැය විසිහතරක් ඇතුළත ඒ තැනැත්තා ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත භාරදිය යුතු ය. ඒ තැනැත්තා වහාම මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කර සුදුසු ආඥාවක් ලබා ගැනීම ස්ථාන භාර නිලධරයාගේ කාර්යය විය යුතු ය.

නියම කරනුලැබූ විට නේවාසිකයන්ගේ ලැයිස්තුවක් ගෘහ මූලික විසින් දිය යුතු බව.

23. සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට වඩා අඩු නොවන නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් එසේ කරන ලෙස නියම කරනු ලැබූ විට, යම් ප්‍රදේශයක් ඇතුළත සෑම ගෘහ මූලිකයකු විසින්ම තම නිවසේ සිටින සියලුම නේවාසිකයන්ගේ ලැයිස්තුවක්, තම පවුලේ සාමාජිකයන්, නිවසෙහි සිටින සේවකයන්ගෙන් සහ වෙනත් පදිංචිකරුවන්ගෙන් වෙන්කොට දක්වමින් තම ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ පොලිස් ස්ථාන භාර නිලධරයා වෙත සපයනු ලැබිය යුතුය. තවද ඉහත කී පොලිස් නිලධාරයාගේ නියමයෙහි එසේ කරන ලෙස විධාන කරනු ලැබුවහොත්, එම නේවාසිකයන්ගේ යම් වැඩිවීමක්, අඩුවීමක් හෝ වෙනස්වීමක් පිළිබඳ ඔහු විසින් වාර්තා කර තැබිය යුතු අතර, එවැනි නියමයක් යටතේ එවැනි දැන්වීමක් ලැබීමෙන් පසු ඔහු විසින් තම ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත දැන්වීමක් නොකර අමුත්තකු රඳවා ගැනීම නොකළ යුතු ය. මේ නියෝ.යෙන් තමා වෙත නියම කර ඇති යම් යුතුකමක් පැහැර හරින සෑම තැනැත්තකු ම වරදකට වරදකරු විය යුතු ය.

බන්ධනාගාර හා සිරකරුවන් සම්බන්ධයෙන් වූ යම් නීත්‍යානුකූල නියම ක්‍රියාවෙහි යෙදවීමටසන්නද්ධ හමුදාවල සාමාජිකයන්ට ඇති අයිතිය

24. තත් කාලයෙහි යම් සිරකරුවකට භාරව යෑමේ හෝ යම් බන්ධනාගාරයක් නොහොත් සිරකරුවන් රඳවා තබනු ලබන හෝ සේවයෙහි යොදනු ලබන වෙනත් ස්ථානයක් මුරකිරීමේ හෝ යම් සිරකරුවන් විසින් කරන ලද යම් කැළඹීමක් හෝ සාහසිකකමක් මැඩීමෙහි ලා සහාය වීමේ හෝ පැනගිය යම් සිරකරුවකු නැවත අල්ලා ගැනීමේ හෝ යම් නීත්‍යානුකූල නියමයක් ක්‍රියාවේ යෙදවීමේ නැතහොත් යෙදවීමේ ලා සහාය වීමේ නිරත වූ ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ, ශ්‍රී ලංකා නාවුක හමුදවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදවේ සෑම සාමාජිකයකු වෙතම බන්ධනාගාර ආඥාපනතේ 77 (5) වන වගන්තිය මගින් හා ඒ ආඥාපනත යටතේ පනවන ලද රීති මගින් පොලිස් නිලධරයකු වෙත පැවරී ඇති බලතල හා අයිතීන් තිබෙන ලෙස සැළකිය යුතු ය.

## V වන කොටස

## වැරදි හා දණ්ඩන

වංචල හෝ නිශ්චල දේපළ යනාදිය විනාශ කිරීම පිළිබඳ වැරදි.

25. (1) (අ) වංචල හෝ නිශ්චල දේපලකට විනාශයක් හෝ හානියක් සිදු කරන හෝ එබදු යම් දේපළක වටිනාකම නැති කරන හෝ ප්‍රයෝජනය අඩුකරන අන්දමේ යම් වෙනසක් ඇති කරන යම් ක්‍රියාවක් කරන; හෝ

(ආ) ගින්නෙන් හෝ යම් දහ්‍ය ද්‍රව්‍යයකින් හෝ යම් පුපුරණ හෝ විබාදන ද්‍රව්‍යයකින් කුමන ආකාරයක හෝ මිසයිලයකින්, ආයුධයකින් හෝ උපකරණයකින් අන්කිසි තැනැත්තකුට මරණය හෝ තුවාල සිදු කිරීම කරන හෝ එබන්දක් කිරීමට තැත් කරන; හෝ

(ඇ) පදිංචිය හිස්කොට තිබෙන හෝ අනාරක්ෂිතව ඇති හෝ අලාභහානි සිදු කොට ඇති හෝ විනාශයට පත් කොට ඇති යම් ස්ථානයකින් යම් ද්‍රව්‍යයක් සොරකම් කරන , හෝ

(ඈ) දණ්ඩනීති සංග්‍රහයේ 427 සිට 446 දක්වා වූ වගන්තිවලින් කවර හෝ වගන්තියක් යටතේ යම් වරදක් සිදු කරන හෝ යම් ස්ථානයකින් බඩු බාහිරාදිය නැතහොත් ද්‍රව්‍ය කිසිවක් නීති විරෝධී ලෙස ඉවත් කරන හෝ ඉවත් කිරීමට උත්සාහ කරන; හෝ

(ඉ) (අ) අනුඡෙදයෙහි හෝ (ආ) අනුඡේදයෙහි හෝ (ඇ) අනුඡේදයෙහි හෝ (ඈ) අනුඡෙදයෙහි සඳහන් යම් ක්‍රියාවක් කිරීම පරමාර්ථ කොට ගත්තාවූ ද දණ්ඩ නීති සංග්‍රහයෙහි 138 වන වගන්තියෙහි අර්ථ කථනය කොට ඇති අන්දමේ වූ ද නීති විරෝධී රැස්වීමක සාමාජිකයකු වන; හෝ

(ඊ) (ඇ) අනුඡේදයෙහි හෝ (ඈ) අනුඡේදයෙහි යම් ද්‍රව්‍යයක් හෝ බඩුබාහිරාදිය සම්බන්ධයෙන් (ඇ) අනුඡේදය හෝ (ඈ) අනුඡේදය යටතේ වරදක් සිදු කරනු ලැබූ බව දැන දැනම හෝ විශ්වාස කිරීමට හේතු ඇතිව ඒ අනුඡේදවල සඳහන් යම් ද්‍රව්‍යයක් හෝ බඩුබාහිරාදිය වංචනික ලෙස භාර ගන්නා හෝ තබා ගන්නා,

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර දණ්ඩ නීති සංග්‍රහයෙහි හෝ මේ නියෝගවල කුමක් සඳහන් වුවද මහාධිකරණය ඉදිරියේ වරදකරු කරනු ලැබූ විට, මරණ දඬුවමකට හෝ ජීවිතාන්තය දක්වා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ යටත් විය යුතුය.

(2) දේපළ සම්බන්ධ පෞද්ගලික ආරක්ෂාව ක්‍රියාත්මක කිරීමේ දී වරදකරුට මරණය හෝ වෙනත් හානියක් කිරීමට හැකියාව තිබෙන අවස්ථාවන් නියම කරන්නා වූ, දේපළ සම්බන්ධ පෞද්ගලික ආරක්ෂාවට අදාළ දණ්ඩ නීති සංග්‍රහයේ 96 වන වගන්තිය, ඒ වගන්තිය අවසානයේ දී පහත දැක්වෙන පාඨය එකතු කරනු ලැබූ ලෙස බල පැවැත්විය යුතු ය:-

"පස්වනුව - 2019 අංක 1 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 25 වන නියෝගය යටතේ යම් වරදක්.".

(3) වරද සිදු කරන අවස්ථාවේ දී හෝ ඒ ආසන්න වේලාවක දී හෝ පැවති මහජන කැළඹීම වර්ධනය කිරීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් හෝ මහජන කැළඹීමක් අතරතුර දී හෝ වරද සිදු කරනු ලදැයි නීතිපතිවරයා සෑහීමකට පත් වන්නේ නම්, ඒ වරද සම්බන්ධයෙන් මේ හදිසි අවස්ථා නියෝග යටතේ අධිචෝදනාවක් නීතිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකිය:

එසේ වුවද, යම් වරදක් කිරීමට අදළ අවස්ථානුගත කරුණු සැලකීමෙන් පසුව නීතිපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි වරද හෝ වැරදි වර්ග සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුතු ආරම්භ කිරීමට ඔහු විසින් පොලිස්පතිවරයාට බලය පවරනු ලැබිය හැකි අතර ඉන් අනතුරුව එම කටයුතු පොලිස්පතිවරයාගේ ලියවිල්ලකින් වූ අවසරය ඇතිව ආරම්භ කරනු ලැබිය හැකි අතර, එම වැරදි සම්බන්ධයෙන් නඩු විභාගයට අදළව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ XVII වන පරිච්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදළ විය යුතු ය.

(4) මහේස්ත්‍රාත් අධිකරණයක නඩු පවරනු ලැබ ඇති අවස්ථාවක, මේ නියෝගවල 49 වන නියෝගයෙහි විධිවිධාන සලසා ඇති දඬුවමින් එම වරද සඳහා දඬුවම් කරනු ලැබිය යුතුය.

ත්‍රස්තවාදී කටයුතු යනාදිය තහනම් බව.

26. කිසිදු තැනැත්තකු හෝ සංස්ථාගත කළ හෝ නොකළ පුද්ගල මණ්ඩලයක් විසින්, තනිව හෝ කණ්ඩායමක් ලෙස හෝ කණ්ඩායම් ලෙස හෝ වෙනත් තැනැත්තන් මාර්ගයෙන් හෝ -

(අ) ත්‍රස්තවාදයෙහි; හෝ

(ආ) යම් නිශ්චිත ත්‍රස්තවාදී ක්‍රියාකරකම්වල; හෝ

(ඇ) යම් තැනැත්තෙක් කණ්ඩායමක් හෝ තැනැත්තන් කණ්ඩායමක් විසින් සිදු කරනු ලබන යම් ත්‍රස්තවාදී ක්‍රියාවක් හෝ නිශ්චිත ත්‍රස්තවාදී ක්‍රියාකාරකමක් සාක්ෂාත් කර ගැනීම උදෙසා වෙනත් යම් ක්‍රියාකාරකමක,

නිරත නොවිය යුතු ය.

27. (1) කිසිම තැනැත්තකු විසින්, මේ නියෝගවල 26 වන නියෝගය උල්ලංඝනය කරමින් ක්‍රියාකරන යම් තැනැත්තකුගේ, කණ්ඩායමක හෝ තැනැත්තන් කණ්ඩායමක හෝ සංවිධානයක - 26 වන නියෝගය උල්ලංඝනය කරමින් ක්‍රියාවල නිරත වීම තහනම් බව

(අ) නිළඇඳුම්, ඇඳුම්, සංකේත, ලාංඡන පැළඳීම, ප්‍රදර්ශනය කිරීම සහ සන්තකයේ තබාගැනීම හෝ කොඩිය ප්‍රදර්ශනය කිරීම, එසවීම හෝ සන්තකයේ තබාගැනීම;

(ආ) රැස්වීමක් කැඳවීම, රැස්කිරීම, පැවැත්වීම හෝ ඊට සහභාගී වීම;

(ඇ) සාමාජිකත්වය ලබා ගැනීම හෝ බැඳීම;

(ඈ) සාමාජිකයකුට, සමූහයකට හෝ වෙනත් යම් ආශ්‍රිතයකුට රැකවරණය සැළසීම, ඔහු සඟවා තබා ගැනීම, ඔහුට ආධාර කිරීම;

(ඉ) එවැනි යම් තැනැත්තකු, කණ්ඩායමක්, තැනැත්තන් කණ්ඩායමක් හෝ සංවිධානයක් ප්‍රවර්ධනය කිරීම, දිරිගැන්වීම, ආධාර කිරීම, උපදෙස් දීම, සහාය දීම සහ ඒ වෙනුවෙන් ක්‍රියා කිරීම; හෝ

(ඊ) යම් ක්‍රියාකාරකමක් හෝ වැඩසටහනක් සංවිධානය කිරීම හෝ ඊට සහභා්. වීම

නොකළ යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදය උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහාධිකරණයේ දී වරදකරු කරනු ලැබීමේ දී වසර පහකට නොඅඩු සහ වසර දහයකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට යටත් කරනු ලැබිය යුතු ය.

28.(1) මේ නියෝගවල 26 වන සහ 27 වන නියෝග උල්ලංඝනය කරමින් ක්‍රියා කරන්නා වූද යම් සංස්ථාගත කරනු ලැබූ හෝ සංස්ථාගත කරනු නොලැබුවා වූ, යම් තැනැත්තකු, කණ්ඩායමක් හෝ පුද්ගල කණ්ඩායමකට හෝ එවැනි තැනැත්තකුට, කණ්ඩායමකට හෝ පුද්ගල කණ්ඩායමක සාමාජිකයකුට, සමූහයක් හෝ ආශ්‍රිතයකුට ද්‍රව්‍යමය හෝ අන්‍යාකාරයේ දායකත්වය ලබා දීම, සැපයීම, පරිත්‍යාග කිරීම, විකිණීම, මිළදී ගැනීම, කුලියට දීම, බද්දට දීම, ලබා ගැනීම, ලබා ගැනීමට ඉඩ දීම, අරමුදල් සැපයීම, බෙදහැරීම හෝ ණයට දීම ඇතුළු කවර හෝ ආකාරයක යම් ගණුදෙනුවක කිසිම තැනැත්තකු නොයෙදිය යුතු ය: 26 වන සහ 27 වන නියෝග උල්ලංඝනය කරන තැනැත්තන් සමඟ කිසිදු ගනුදෙනුවක් නොකළ යුතු බව.

එසේ වුව ද, සාමාකාමී දේශපාලන විසඳුමක් ඇති කිරීම, ත්‍රස්තවාදය හෝ යම් නිශ්චිත ත්‍රස්තවාදී ක්‍රියාකරකමක් අවසන් කිරීම, ජනජීවිතයට අත්‍යාවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාම, සංවර්ධන ක්‍රියාකරකම් පවත්වාගෙන යාම යන අරමුණු ඉටුකර ගැනීමට, පහසුකම් සැලසීම සඳහා හෝ වෙනත් යම් නීත්‍යානුකූල ජාතික හෝ ජාත්‍යන්තර, රාජ්‍ය නොවන සංවිධානයක් ඇතුළු යම් තැනැත්තකු විසින් මෙහි 26 වන සහ 27 වන නියෝග උල්ලංඝනය කරමින් ක්‍රියාකරන යම් තැනැත්තකු හෝ කණ්ඩායමක් හෝ පුද්ගල කණ්ඩායමක් සමග සද්භාවයෙන් සහ මේ නියෝග ප්‍රකාර පත් කරන ලද නිසි බලධරයාගේ ලිඛිත අනුමතය ඇතිව, යම් අනුමත ගණුදෙනුවක නියැලීම නීත්‍යානුකූල වන්නේ ය:

එසේම තවදුරටත්, මේ නියෝගවල 26 වන සහ 27 වන නියෝග උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකුට හදිසි වෛද්‍ය ප්‍රතිකාර හෝ වෛද්‍ය සහාය ලබාදීම සඳහා නිසි බලධරයාගේ එවැනි අනුමතයක් ලබා ගැනීම අවශ්‍ය නොවන්නේ ය.

(2) මේ නියෝගයේ (1) වන ඡේදය උල්ලංඝනය කරමින් ක්‍රියාකරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහාධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමේ දී ඒ තැනැත්තා වසර දහයක කාලසීමාවක් දක්වා වූ බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

29. (1) මේ නියෝගවල 26 වන නියෝගය උල්ලංඝනය කරමින් කටයුතු කරන යම් තැනැත්තකුට, කණ්ඩායමකට, පුද්ගල කණ්ඩායමකට හෝ සංවිධානයකට, ජාතික ආරක්ෂාවට අහිතකර ලෙස බලපාන හෝ අගතියක් සිදුවන යම් තොරතුරක් කිසිම තැනැත්තකු විසින් සැපයීම නොකළ යුතු ය. ජාතික ආරක්ෂාවට අගතිගාමී වන තොරතුරු සැපයීම නොකළ යුතු බව.

(2) මේ නියෝගයේ (1) වන ඡේදය උල්ලංඝනය කරමින් ක්‍රියාකරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර මහාධිකරණය මගින් වරදකරු කිරීමේ දී වසර පහකට නොඅඩු සහ වසර දහයකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට යටත් කරනු ලැබිය යුතු ය.

සටන් පාඨ යනාදිය ප්‍රදර්ශනය කිරීම.

30. නීතියෙන් පිහිටුවා ඇති ශ්‍රී ලංකාණ්ඩුව, නීත්‍යානුකූල මාර්ගයකින් හැර අන් ලෙසකින් බිඳ හෙලීමේ හෝ බලෙන් යටත් කර ගැනීමේ අවශ්‍යතාවට, කාර්යයට හෝ යෝග්‍යතාවට, කථික හෝ ලිඛිත වුව ද වචනවලින් හෝ සංඥාවලින් හෝ දෘශ්‍ය නිරූපනවලින් හෝ හැසිරීමෙන් හෝ වෙන යම් ක්‍රියාවක් මගින්, කෙළින්ම හෝ අන්‍යාකාරයකින් පක්ෂව කථා කරන, කරුණු කියා සිටින හෝ ඒ සඳහා උපදෙස් දෙන කවරකු වුව ද වරදකට වරදකරු විය යුතු ය.

පත්‍රිකා ආදිය බෙදා හැරීම.

31. මහජන ආරක්ෂාවට, මහජන සාමයට හෝ ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාමට හෝ අගතිගාමී වන කරුණු අඩංගු යම් දැන්වීම් කොළ හෝ අත් පත්‍රිකා හෝ පත්‍රිකා මහජනයාට පෙනෙන යම් ස්ථානයක ඇලවීම හෝ මහජනයා අතර බෙදාහැරීම හෝ කිසිම තැනැත්තකු විසින් කරනු නොලැබිය යුතු ය.

කටකතා හෝ අසත්‍ය ප්‍රකාශ පැතිරවීම හෝ විසුරුවා හැරීම.

32. මහජනයා බිය වැද්දවිය හැකි හෝ මහජනයා කැළඹිය හැකි කිසිම කටකථාවක් හෝ අසත්‍ය ප්‍රකාශයක් කට වචනයෙන් හෝ වෙන කවර වූ හෝ ක්‍රමයකින් සන්නිවේදනය කිරීම, ප්‍රචලිත කිරීම හෝ පැතිරවීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

ඇතැම් වර්ගවල ලේඛන මුද්‍රණය කිරීම හෝ පළ කිරීම.

33. පහත දැක්වෙන කරුණුවලින් යමක්, එනම් :-

(අ) මේ නියෝගය යටතේ තහනම් කරනු ලැබූ යම් සංවිධානයක කටයුතු;

(ආ) ත්‍රස්තවාදී ව්‍යාපාරය පිළිබඳව, ආණ්ඩුව විසින් පවත්වාගෙන යනු ලබන විමර්ශනවලට අදාළ යම් කරුණක්;

(ඇ) පොලිසියේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවුක හමුදාවේ සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සේනාංක රඳවා තිබෙන ආකාරය, ඒවායේ තත්ත්වය, යාම් ඊම් හෝ මෙහෙයුම්;

(ඈ) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආරක්ෂාවට සහ ආරක්ෂාවට අදළ යම් කරුණක්;

(ඉ) කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ජාතිවාදී හැඟීම් ඇවිස්සීමට ඉඩ ඇති යම් කරුණක්,

සම්බන්ධයෙන් ලේඛනයක් හෝ වාර්තාවක් මුද්‍රණය කරන හෝ පළ කරන, ඒ පිළිබඳ තොරතුරු ලබා දෙන හෝ අදහස් පළ කරන හෝ ඒ සම්බන්ධයෙන් වූ යම් චිත්‍රගත නිරූපනයක්, ඡායාරූපයක් හෝ චලන චිත්‍රපටයක් මුද්‍රණය කරන හෝ පළ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

ඡායාරූප ගැනීමට වූතහනම

34. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිඛිත අවසරය කලින් ලබා නොගෙන -

(අ) යම් පොලිස් නිලධරයකු වෙත හෝ, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි, ශ්‍රී ලංකා නාවික හමුදාවෙහි නැතහොත් ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙහි යම් සාමාජිකයෙකු සතු කරන ලද නැතහොත් එවැනි නිලධරයකු හෝ සාමාජිකයකු හෝ විසින් පාවිච්චියට ගනු ලබන යම් ගොඩනැගිල්ලක, නැවක හෝ ගුවන් යානයක; හෝ

(ආ) එවැනි යම් ගොඩනැගිල්ලක්, නැවක් හෝ ගුවන් යානාවක් පෙනෙන තෙක් මානයේ,

කිනම් හෝ ආකාරයක ඡායාරූප ගන්නා යම් තැනැත්තකු, වරදකට වරදකරු විය යුතුය.

අසත්‍ය ප්‍රකාශ.

35. යම් තැනැත්තකු -

(අ) යම් හදිසි අවස්ථා නියෝගයක් ප්‍රකාර හෝ හදිසි අවස්ථා නියෝගයක් යටතේ කරනු ලැබූ යම් නියමයක් ප්‍රකාර හෝ කරනු ලැබූ ඉල්ලීමකට පිළිතුරු වශයෙන් සැලකිය යුතු කරුණක් සම්බන්ධයෙන් අසත්‍ය බව තමා දන්නා වූ හෝ අසත්‍ය බව විශ්වාස කිරීමට යුක්තිසහගත හේතුවක් ඇත්තා වූ යම් ප්‍රකාශයක් කළහොත් හෝ එබඳු යම් තොරතුරක් සැපයුවහොත්; නැතහොත්,

(ආ) යම් හදිසි අවස්ථා නියෝගයකින් හෝ හදිසි අවස්ථා නියෝගයක් යටතේ කරනු ලැබූ නියමයකින් ඔහු විසින් පිළියෙළ කළ යුතු යයි නියම කරනු ලැබූ යම් ගිණුමක, ප්‍රකාශයක, තක්සේරුවක, වාර්තාවක හෝ අන්කිසි ලේඛනයක ඉහත සඳහන් පරිදි ප්‍රකාශයක් කළහොත්,

ඔහු වරදකට වරදකරු විය යුතු ය.

**සිතියම් ආදිය සන්තකයෙහි තබා ගැනීම.**

36. රාජ්‍ය සංස්ථාවක් ඇතුළුව ආණ්ඩුවේ යම් කාර්යාලයකට, සංවිධානයකට, ආයතනයකට හෝ සංස්ථාවකට සම්බන්ධ නැතහොත් ඊට අදළ හෝ පොලීසියේ හෝ සන්නද්ධ සේවාවන්හි සාමාජිකයින්, සේවයෙහි යොදවා ඇති ආකාරයට හෝ ඔවුන්ගේ වාසස්ථානයට සම්බන්ධ නැතහොත් අදළ හෝ, පොලිසියට හෝ සන්නද්ධ හමුදවට හෝ අයත් ප්‍රවාහන සේවාවල, යුද්ධායුධවලට හෝ වෙඩි ද්‍රව්‍යවලට සමබන්ධ නැතහොත් ඒවාට අදළ යම් සිතියමක්, සැලැස්මක්, දළ සටහනක්, චිත්‍රයක් හෝ කටු සටහනක් හෝ වෙනත් තොරතුරු, නීත්‍යානුකූල සමාවට කරුණක් නොමැතිව, ලබාගන්නා හෝ ස්වකීය භාරයෙහි නැතහොත් පාලනයෙහි තබා ගන්නා හෝ සන්තකයෙහි තබා ගන්නා හෝ පාලනයට ලබාගැනීමට හෝ සන්තකයෙහි තබාගැනීමට තැත් කරන කවරකු වුව ද වරදකට වරදකරු විය යුතු අතර නිත්‍යානුකූල සමාවට කරුණු ඔප්පු කිරීමේ භාරය එකී තැනැත්තා වෙත පැවරෙන්නේ ය.

**විනාශකාරී පොත්පත් සන්තකයෙහි තබාගැනීම.**

37. රාජ්‍ය ආරක්ෂාව හෝ මහජන සාමය රැකීමට හානිකර විය හැකි හෝ ආණ්ඩුව කෙරෙහි වෛරයෙන් යුත් හෝ අපහාසයෙන් යුත් හැඟීම් ඇවිස්සීමට, ඊට ධෛර්ය දීමට හෝ අනුබල දීමට ඉඩ ඇති හෝ ආණ්ඩුව බිඳ හෙළීම සඳහා යම් පියවරක් ගැනීමට කෙළින්ම හෝ අන්‍යාකාරයකින් යම් තැනැත්තකු පෙළඹවීමට ඉඩ ඇති යම් පොතක්, ලේඛනයක් හෝ යම් ලියවිල්ලක් හෝ කරුණු සැලකිරීමක් අඩංගු යම් ලිපියක්, නීත්‍යානුකූල බලයක් හෝ සමාවට සෑහෙන කරුණු නොමැතිව තම සන්තකයෙහි, භාරයෙහි හෝ පාලනයෙහි තබාගන්නා කවරකු වුවද වරදකට වරදකරු විය යුතු අතර නීත්‍යානුකූල බලය හෝ සමාවට සෑහෙන කරුණු ඇති බව ඔප්පු කිරීමේ කාර්ය භාරය ඒ තැනැත්තා වෙත පැවරෙන්නේ ය.

**යුද්ධායුධ යනාදියරැස්කිරීම.**

38. යුද්ධායුධ, වෙඩි බෙහෙත්, පුපුරණ ද්‍රව්‍ය, ආයුධ හෝ වෙනත් අන්තරාදයක භාණ්ඩ හෝ ද්‍රව්‍ය රැස්කරන, බලය ලබා නොගෙන තම සන්තකයෙහි තබාගෙන සිටින හෝ එකී යුද්ධායුධ, වෙඩි බෙහෙත්, පුපුරණ ද්‍රව්‍ය, ආයුධ හෝ අන්තරාදයක භාණ්ඩ හෝ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමෙහි ලා යම් තැනැත්තකු සූදනම් කරන, පුහුණු කරන හෝ පුහුණු කිරීමට තැත් කරන කවරකු වුවද වරදකට වරදකරු විය යුතු අතර වරදකරු කරනු ලැබූ විට අවුරුදු දහයකට අඩු නොවන කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

**නිළ ඇඳුම්වලට සමාන ඇඳුම් පැළඳුම් ඇඳීම.**

39. සන්නද්ධ හමුදවන්හි හෝ පොලිසියෙහි යම් සාමාජිකයකු විසින් පළඳිනු ලබන හෝ පාවිච්චි කරනු ලබන ඇඳුමට, වස්ත්‍රයට, නිළ ඇඳුමට, හැඳුනුම්පතට, ලකුණට හෝ වෙනත් සංකේතයකට යම් ආකාරයකින් හෝ යම් විස්තරයක් අනුව සමාන වන යම් ඇඳුමක්, වස්ත්‍රයක්, නිළ ඇඳුමක් හැඳුනුම්පතක්, ලකුණක් හෝ වෙනත් සංකේතයක් පළඳින හෝ එහි භාරය හෝ පාලනය තම සන්තකයෙහි ඇති සන්නද්ධ හමුදවන්හි හෝ පොලිසියෙහි සාමාජිකයෙකු නොවන කවරකු වුවද වරදකට වරදකරු විය යුතු ය.

**තුවක්කු, පුපුරන ද්‍රව්‍ය, පීඩාකාරී ආයුධ සහ පීඩාකාරී ද්‍රව්‍ය.**

40. (1) නීත්‍යානුකූල බලයක් හෝ සාධාරණ හේතුවක් නොමැතිව, යම්කිසි තුවක්කුවක්, පුපුරණ ද්‍රව්‍යයක්, පීඩාකාරී ආයුධයක් හෝ පීඩාකාරී ද්‍රව්‍යයක් ප්‍රවාහනය කරන හෝ ප්‍රවාහනය කිරීමට සලස්වන නැතහොත් තම සන්තකයෙහි හෝ පාලනය යටතේ තබාගන්නා යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර එවැනි නීත්‍යානුකූල බලයක් හෝ සාධාරණ හේතුවක් ඇති බව ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා වෙත පැවරෙන්නේ ය.

(2) යම් තැනැත්තකු මේ නියෝගය යටතේ වරදක් කරතැයි විශ්වාස කිරීමට පොලිස් නිලධරයකුට හෝ ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ කෝප්‍රල් තත්ත්වයකට නොඅඩු තත්ත්වයක සාමාජිකයකුට හෝ ශ්‍රී ලංකා නාවුක හමුදවේ නායක නැවියකුගේ තත්ත්වයකට නොඅඩු තත්ත්වයක සාමාජිකයකුට හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදවේ කෝප්‍රල් තත්ත්වයකට නොඅඩු තත්ත්වයක සාමාජිකයකුට සාධාරණ හේතු ඇති විට ඒ තැනැත්තාගේ සන්තකයෙහි හෝ පාලනය යටතේ තිබෙන යම්කිසි තුවක්කුවක්, පුපුරණ ද්‍රව්‍යයක්, පීඩාකාරී ආයුධයක් හෝ පීඩාකාරී ද්‍රව්‍යයක් එකී නිලධරයා හෝ සාමාජිකයා විසින් ඉවත් කළ හැකි ය.

(3) යම් තැනැත්තකු මේ නියෝගය යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක -

(ආ) ඒ තැනැත්තාගේ සියලු චංචල සහ නිශ්චල දේපළ ද; සහ

(ඇ) ඒ වරද සිදු කිරීම සඳහා පාවිච්චි කර ඇති යම් වාහනයක් හෝ යාත්‍රාවක් ද, ඒ වරදකරු කිරීම ප්‍රකාරව බැඳීම්වලින් නිදහස්ව රාජසන්තක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (3) වන අනුඡේදය යටතේ රාජසන්තක කළ යම් දේපළක්, වාහනයක් හෝ යාත්‍රාවක්,

(අ) අදාළ වරදකරු කිරීමට විරුද්ධව, අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර නොමැති නම්, ඒ වරදකරු කිරීමට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා නියමිත කාලසීමාව අවසන් වන දිනයෙහි සිට සම්පූර්ණයෙන්ම රජය සතු විය යුතු ය;

(ආ) අදාළ වරදකරු කිරීමට විරුද්ධව, අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්නම්, අභියාචනයේ දී ඒ වරදකරු කිරිම ස්ථිර කරනු ලැබූ දිනයෙහි සිට සම්පූර්ණයෙන්ම රජය සතු විය යුතු ය.

මේ ඡේදයෙහි ''අදාළ වරදකරු කිරීම'' යන්නෙන්, (3) අනුඡේදය යටතේ යම් දේපළක් රජය වෙත හිමිවන්නේ යම් වරදකරු කිරීමට ප්‍රතිඵලයක් වශයෙන් ද, ඒ වරදකරු කිරී"ම අදහස් වේ.

(5) මේ නියෝගය යටතේ වරදක් සිදුකරන යම් තැනැත්තකු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, ඔහුට මරණීය දණ්ඩනයෙන් හෝ ජීවිතාන්තය දක්වා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමෙන් හෝ දඬුවම් කරනු ලැබිය යුතු ය.

(6) මේ නියෝගයෙහි -

''පීඩාකාරී ද්‍රව්‍ය'' යන්නෙන් ගිනිගන්නා සුළු, විබාදන හෝ ප්‍රචණ්ඩ ද්‍රව්‍යයක් අදහස් වේ; සහ

''පීඩාකාරී ආයුධ'' යන්නෙන් බෝම්බයක් නැතහොත් බෝම්බයක හෝ අත් බෝම්බයක උපයෝගී කර ගැනීමක් හා සමාන උපයෝගී කර ගැනීමක් සඳහා හෝ බෝම්බයක හෝ අත් බෝම්බයක කාර්යය හා සමාන කාර්යයක් සඳහා සාදනු ලැබූ හෝ අදහස් කරනු ලැබූ ඉන් කිසි උපායක් හෝ උපක්‍රමයක් හෝ කායික තුවාල සිදු කිරීමට හෝ දේපළ හානි කිරීමට හෝ පාවිච්චි කළ හැකි යම් ද්‍රව්‍යයක් අදහස් වන අතර එවැනි බෝම්බයක, අත් බෝම්බයක, උපායක හෝ උපක්‍රමයක කොටසක් විය හැකි යම්කිසි දෙයක් හෝ ද්‍රව්‍යයක් එයට ඇතුළත් වේ.

දමාගසන ආයුධ විසි කිරීම.

41. ඇන්ජිමක් ඇඳූ රථයක්, මැදිරියක්, ට්‍රක් රථයක් හෝ වාහනයක් තුළ හෝ මත සිටින යම් තැනැත්තකුගේ හෝ වෙනත් යම් තැනැත්තෙකුගේ ආරක්ෂාවට හානිවන පරිදි යම් දුම්රිය මාර්ගයක ඒ තැනැත්තාට හෝ ඒ ඇන්ජිමකට ඇඳූ රථයකට, මැදිරියකට හෝ ට්‍රක් රථයකට හෝ යම් ප්‍රසිද්ධ පාරක යම් වාහනයකට, කිසිම තැනැත්තෙකු විසින් කිසිදු දෙයක් හෝ ද්‍රව්‍යයක් විසි නොකළ යුතු ය. මේ නියෝගයේ ඉහතින් වූ විධිවිධාන කිසිවක් කඩකරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දහයකට අඩු නොවන කාලයක් සඳහා බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය.

තුවක්කු එල්ල කිරීම.

42. කිසිම තැනැත්තකු විසින් පතරොම් දමනු ලැබූ හෝ නොදමනු ලැබූ යම් තුවක්කුවක් වෙනත් යම් තැනැත්තකු කෙරෙහි නීත්‍යානුකූල හේතුවක් නොමැතිව එල්ල නොකළ යුතු ය.

භය ගැන්වීම ආදිය වැළැක්වීම.

43. (1) ජනාධිපතිවරයා විසින් නියමයක් මගින් නිශ්චිතව සඳහන් කරනු ලබන ශ්‍රී ලංකාවේ යම් ප්‍රදේශයක යම් තැනැත්තකු වාසය කරන, වැඩ කරන, ව්‍යාපාර කටයුතු ගෙනයන හෝ සිටින යම් ගෙයක නැතහොත් ස්ථානයක සිටින්නා වූ යම් තැනැත්තකු භය ගන්වන ආකාරයෙන් හෝ ඒ ගෙයට නැතහොත් ස්ථානයකට ඇතුළුවීම හෝ ඉන් පිටවීම අවහිර කෙරෙන ආකාරයෙන් හෝ සාමය කඩවීමට තුඩුදෙන ආකාරයෙන් හෝ ඒ ගෙයට නැතහොත් ස්ථානයට හෝ ඒ අසළට කිසිදු තැනැත්තකු නොයා යුතු ය.

(2) මේ නියෝගයෙහි "භය ගැන්වීම" යන යෙදුමෙන් තමාට හෝ තම පවුලේ යම් සාමාජිකයකුට හෝ තමාගෙන් යැපෙන යම් තැනැත්තකුට හෝ හානියක් සිදුවේ යයි නැතහොත් යම් තැනැත්තකුට සිතෙහි ජනිත කරවීම අදහස් වන අතර "හානිය" යන යෙදුමට යම් තැනැත්තකුගේ ව්‍යාපාරය, වෘත්තීය, සේවා නියුක්තිය හෝ වෙනත් ආදායම් මාර්ගයක් සම්බන්ධයෙන් ඔහුට සිදුවන යම් හානියක් ඇතුළත් වන අතර, නඩු පැවරිය හැකි යම් සිවිල් වරදක් ද ඊට ඇතුළත් වේ.

අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාම, එයට බාධා කිරීම ආදිය.

44. (1) මේ නියෝගවල උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් සේවයක් අත්‍යවශ්‍ය සේවයක් බව ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක, 2019 අප්‍රේල් මස 22 වැනි දින හෝ ඉන්පසු සේවයට සම්බන්ධ යම් කාර්යයක යෙදී සිටි හෝ සේවයෙහි නියුක්ත කරනු ලැබූ යම් තැනැත්තකු -

(අ) ඒ නියමයෙහි දිනයෙහි සිට එක් දිනයක් ඉකුත් වීමෙන් පසු තම කාර්යය හෝ සේවය කරන ස්ථානයට හෝ තම සේවායෝජක විසින් නැතහොත් තම සේවායෝජකයාගේ බලය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් කලින් කල නම් කරනු ලබන වෙනත් ස්ථානයකට පැමිණ සිටීම පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් හෝ එම සේවයේ තමන්ගේ සේවා නියමයන්ට හා කොන්දේසිවලට අනුකූලව සාමාන්‍ය වැඩකරන දිනයක හෝ යම් කොටසක වැඩ කිරීමට තමන්ට නියමිත මුළු කාලසීමාව තුළ වැඩ නොකිරීමක්, වැඩ කිරීම පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් හෝ සේවා ස්ථානයෙන් බැහැර ගියහොත් හෝ වැඩට නොපැමිණ සිටියහොත්; හෝ

(ආ) තමා නිශ්චිත සේවයක යෙදී සිටින හෝ නියුක්තව සිටින තැනැත්තකුව සිටිමින් තම සේවායෝජක විසින් හෝ සේවායෝජකයාගේ බලය යටතේ ක්‍රියාකරන තැනැත්තකු විසින් ඉටු කරන ලෙස තමාට විධාන කරනු ලබන පරිදි එබඳු කාර්යයක් ඒ සේවායෝජක හෝ ඒ තැනැත්තා විසින් කලින් කල නිශ්චිතව සඳහන් කරනු ලබන කාලයක දී හෝ ඒ කාලසීමාව ඇතුළත (ඒ කාලය හෝ කාලසීමාව සාමාන්‍ය වැඩ කරන කාලය ඇතුළත් වුව ද, ඉන් බාහිරව හෝ නිවාඩු දිනවල වුව ද) ඉටු කිරීම පැහැර හැරියහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත්,

ඔහු එසේ පැමිණ සිටීම හෝ එසේ කාර්ය ඉටු කිරීම පැහැර හැරියේ හෝ ප්‍රතික්ෂේප කළේ වැඩ වර්ජනයකට හෝ වෙනත් සංවිධානාත්මක ක්‍රියාකාරකමකට අනුබල දීමෙහිලා වුව ද -

(i) වෙනත් යම් නීතියක හෝ ඔහුගේ සේවා නියුක්තිය පාලනය වන යම් ගිවිසුමක නියමවල හා කොන්දේසිවල පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඔහු තම සේවය එකෙනෙහිම අවසන් කළ ලෙස හෝ ඉන් ඉවත් වූ ලෙස, සියලු කාර්යය සඳහා සැලකිය යුතු ය; තව ද,

(ii) ඊට අතිරේකව වරදකට වරදකරු ද විය යුතු ය.

මේ ඡේදයෙහි ''නිශ්චිත සේවය'' යන්නෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් නිශ්චිත සේවයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ අත්‍යවශ්‍ය සේවයක් වූ ද ඒ සේවයට සම්බන්ධ කාර්යයක නියුක්ත හෝ යෙදුණු තැනැත්කුට සාමාන්‍ය වැඩ කරන කාලවේලාවලින් බාහිරව හෝ නිවාඩු දිනවල වැඩ කිරීමට නියම කරනු ලැබිය හැකි අත්‍යවශ්‍ය සේවයක් අදහස් වේ.

(2) යම් සේවයක් අත්‍යවශ්‍ය සේවයක් යයි ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක -

(අ) යම් තැනැත්තකු කවර ආකාරයකින් හෝ -

(i) ඒ සේවය පවත්වාගෙන යාමට බාධා කළහොත්, අවහිර කළහොත්, එය ප්‍රමාද කළහොත් හෝ සීමා කළහොත්; හෝ

(ii) ඒ සේවය පවත්වාගෙන යාමෙහි හෝ ඒ සම්බන්ධයෙන් හෝ සේවයෙහි යොදවා සිටින අන්කිසි තැනැත්තකුට ඔහු වැඩ කරන ස්ථානයට පැමිණීමට බාධා කළහොත්, අවහිර කළහොත් හෝ වැළැක්වුවහොත්; හෝ

(iii) ඒ සේවය පවත්වාගෙන යාමෙහි හෝ ඒ සම්බන්ධයෙන් හෝ සේවයෙහි යොදවනු ලැබූ යම් තැනැත්තකු ඔහු වැඩ කරන ස්ථානයට නොපැමිණෙන ලෙස පෙළඹුවහොත්, උනන්දු කළහොත්; හෝ දිරිගැන්වූවහොත්; හෝ

(iv) ඒ සේවය ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ එහි අංශයක් වන අවස්ථාවක ඒ සේවය වෙනුවට හෝ ඊට සමාන්තර හෝ යම් සේවයක් පිහිටුවීමට නැතහොත් පවත්වාගෙන යාමට බල කළහොත්, පෙළඹුවහොත්, උනන්දු කළහොත් හෝ දිරිගැන්වුවහොත්; හෝ

(v) ඒ සේවය පවත්වාගෙන යාමෙහි හෝ සම්බන්ධයෙන් හෝ සේවයෙහි යොදවනු ලැබූ වෙනත් යම් තැනැත්තකු ඒ සේවයට පාවා දීමට, ඉන් ඉවත්වී යාමට (එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒ වෙනත් තැනැත්තා ඒ සේවය එසේ පාවා දුන්නත්, නැතත්, ඉවත්ව යතත් නැතත්) බල කළහොත්, පෙළඹුවහොත්, උනන්දු කළහොත් හෝ දිරිගැන්වුවහොත්; හෝ

(vi) ඒ සේවයෙහි හෝ ඒ කාර්ය කරගෙන යාම සම්බන්ධයෙන් හෝ සේවා නියුක්තියක් අර්පණය කිරීමෙන් නැතහොත් භාර ගැනීමෙන් වෙනත් යම් තැනැත්තකු වැළැක්වුවහොත්; හෝ

(ආ) යම් තැනැත්තකු යම් කායික ක්‍රියාවකින් හෝ යම් කතාවකින් හෝ ලියවිල්ලකින් මේ ඡේදයෙහි (අ) අනුඡේදයෙන් නියම කරනු ලැබූ යම් ක්‍රියාවක්, කරන ලෙස වෙනත් යම් තැනැත්තකු (එහි ප්‍රතිඵලයක් ලෙස ඒ වෙනත් තැනැත්තා එසේ නියමිත යම් ක්‍රියාවක් කළත් නොකළත්) අන්කිසි තැනැත්තකු පෙළඹුවහොත්, උනන්දු කළහොත් හෝ දිරිගැන්වුවහොත්,

ඔහු වරදකට වරදකරු විය යුතු ය.

(3) කවර හෝ සංවිධානයක සාමාජිකයන්, මේ නියෝගය (2) වන ඡේදයේ සඳහන් යම් ක්‍රියාවක් කරන බව හෝ එවැනි ක්‍රියාවක් කිරීමෙහිලා ආධාර හෝ අනුබල දෙන බව ජනාධිපතිවරයාගේ මතය වන අවස්ථාවක, ඒ සංවිධානය තහනම් කරනු ලැබූ සංවිධානයක් බවට ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ඔහු විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය.

(4) යම් සංවිධානයක් තහනම් කරනු ලැබූ සංවිධානයක් බවට (3) වන ඡේදය යටතේ කරනු ලැබූ නියමයක් මගින් ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාවක -

(අ) 75 වන නියෝගයේ (2) වන, (3) වන, (4)වන සහ (5) වන ඡේදවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ සංවිධානයට සහ ඒ සංවිධානය සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(ආ) ඒ නියමයේ දිනයේ දී හෝ ඉන් පසුව ඒ සංවිධානයේ සාමාජිකයකුව සිටින සෑම තැනැත්තකුම -

(i) ඒ තැනැත්තා ආණ්ඩුව යටතේ යම් රාජ්‍ය සංස්ථාවක හෝ යම් ධූරයක් දරන්නකු වන්නේ නම්, සියලු කාර්ය සඳහා ඒ නියමයේ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු ඒ ධූරය දැරීම අවසාන කළ ලෙස හෝ ධූරය හිස් කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

(ii) ඊට අමතරව ද මේ නියෝග යටතේ, වරදකට වරදකරු ද වන්නේ ය.

(ඇ) ඒ සංවිධානය විසින් යම් බැංකුවක ගිණුමක් පවත්වාගෙන යනු ලබන්නේ ද ඒ බැංකුව විසින් කිසිම තැනැත්තකුට ඒ ගිණුම ක්‍රියාත්මක කිරීමට ඉඩ නොදිය යුතු ය.

(5) මේ නියෝගයේ (1) වන ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මකවීමේ හේතුවෙන් යම් තැනැත්තකුට හෝ ඔහු වෙනුවෙන් ආණ්ඩුවෙන් සපයා ඇති යම් නිල නිවාසයක් වේ නම් ඔහු විසින් එසේ ධූරය අවසාන කරනු ලැබූ හෝ හිස් කරනු ලැබූ දින සිට දින තුනක් තුළ දී ඒ නිල නිවාසයෙන් ඔහු ඉවත් විය යුතු ය. එකී කාලපරිච්ඡේදය තුළ දී එකී නිල නිවාසයකින් ඉවත්වීම පැහැර හැරින සෑම තැනැත්තෙක්ම මේ නියෝග යටතේ වරදකට වරදකරු වන්නේ ය.

මේ ඡේදයේ ''නිල නිවාසය'' යන්නෙන්, පදිංචිය දරන හෝ පදිංචිය සඳහා භාවිතා කරනු ලබන යම් ගොඩනැගිල්ලක් හෝ කාමරයක් හෝ වෙනත් ඉඩකඩක් අදහස් කෙරන අතර එවැනි ගොඩනැගිල්ලක්, කාමරයක් හෝ වෙනත් ඉඩකඩ පිහිටා ඇති යම් ඉඩමක් හෝ පරිශ්‍රයක් ඊට ඇතුළත් වේ.

(6) මේ නියෝගයට විරුද්ධව යම් වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක ඒ වරද සඳහා අධිකරණය විසින් නියම කළ යුතු වෙන යම් දඬුවමකට අතිරේක වශයෙන් -

(අ) ඒ තැනැත්තාගේ සියලුම නිශ්චල හෝ චංචල දේපළ ඒ වරදකරු කිරීම ප්‍රකාර ජනරජයට රාජසන්තක වන බව සැළකිය යුතු ය; එසේම,

(ආ) මේ නියෝග ක්‍රියාත්මකවීමේ දිනයෙන් පසු ඒ තැනැත්තා විසින් ඒ දේපළ සම්බන්ධයෙන් කරනු ලැබූ යම් අන්සතු කිරීමක් හෝ අන්‍යාකාර බැහැර කිරීමක් ශුන්‍ය හා බලරහිත වන ලෙස සැලකිය යුතු ය.

45. (1) (අ) නීත්‍යානුකූල බලයකින් තොරව - මරණීය තර්ජන වැළැක්වීම

(i) වෙනත් යම් තැනැත්තකුට මරණ තර්ජනයක් හෝ ශාරිරික හිංසනයක් ස්ථාපනය කරන; හෝ

(ii) වෙනත් යම් තැනැත්තකු හෝ තවත් යම් තැනැත්තකු සමඟ නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, වෙළදාමක, ව්‍යාපාරයක හෝ ව්‍යවසායක යෙදීම හෝ වෙනත් යම් තැනැත්තකු වෙනත් යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීම හෝ කිරීමෙන් වැළැක්වීම, වෙනත් යම් තැනැත්තකුට මරණ තර්ජනයක් හෝ ශාරීරික හානියක් සාධාරණව ස්ථාපනය කරන,

යම් ප්‍රකාශයක් හෝ රූපමය ඉදිරිපත් කිරීමක් අඩංගු යම් ලේඛනයක් ඔහුගේ සන්තකයේ තබා සිටින හෝ මුද්‍රණය කරන, ප්‍රසිද්ධ කරන හෝ බෙදාහරින

(ආ) යම් වෙනත් තැනැත්තකු සාමාජිකයකු වන්නා වූ යම් දේශපාලන පක්ෂයකින් හෝ වෘත්තීය සමිතියකින් හෝ ඉල්ලා අස්වන ලෙසට හෝ ඒ වෙනත් තැනැත්තා දරන යම් ධූරයකින් ඉල්ලා අස්වන ලෙසට, හෝ යම් දේශපාලන පක්ෂයකට බැඳෙන ලෙසට, මරණ බවට හෝ ශාරිරික හිංසාවලට භාජනය කරනු ලබන බවට ලිඛිත වචනවලින් හෝ වාචිකව හෝ සංඥා මගින් හෝ හැසිරීමෙන් හෝ තර්ජනය කොට ඒ වෙනත් තැනැත්තා පෙළඹවීමට තැත් කරන්නා වූ; හෝ

(ඇ) යම් රජයේ නිලධරයකුට හෝ යම් අත්‍යවශ්‍ය සේවයක් ඉටු කිරීමෙහි යෙදී සිටින තැනැත්තකුට අවස්ථාවෝචිත පරිදි රජයේ නිලධරයකු වශයෙන් හෝ එසේ අත්‍යවශ්‍ය සේවයක යෙදි සිටින තැනැත්තකු වශයෙන් තම කාර්යය උල්ලංඝනය කෙරෙන පරිදි යම් ක්‍රියාවක් කරන ලෙස හෝ නොකර හරින ලෙසට, ඒ නිලධරයා හෝ තැනැත්තා මරණ බවට හෝ ශාරිරික හිංසාවලට භාජනය කරනු ලබන බවට ලිඛිත වචනවලින් හෝ වාචිකව හෝ සංඥා මගින් හෝ තම හැසිරීමෙන් තර්ජනය කොට, ඒ රජයේ නිලධරයා හෝ තැනැත්තා පෙළඹවීමට තැත් කරන්නා වූ,

යම් තැනැත්තෙක් මේ නියෝග යටතේ වරදක් කරන අතර, මහාධිකරණය ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබූ විට ඔහුට මරණීය දණ්ඩනයෙන් දඬුවම් කරනු ලැබිය යුතු ය.

මේ නියෝගයේ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ සඳහන් කරන ලද පරිදි එවැනි යම් තර්ජනයක් ඇතුළත් වූ ලියවිල්ලක් තැනැත්තකු සත්කයේ තිබී සොයා ගන්නා ලද බව ඔප්පු කිරීම, ඒ ඡේදයේ විස්තර කර ඇති වරද සිදු කිරීමට ඒ තැනැත්තා තැත් කළ බවට හෝ ඒ වරද සිදු කිරීමට ප්‍රාරම්භක වූ ක්‍රියාවක් කරන ලද බව බැලූ බැල්මට පෙනෙන ඔප්පු කිරීම වන්නේ ය.

(2) මේ නියෝගය යටතේ වූ වරදක් සඳහා වන නඩු විභාගයක් ඒ වරද සිදු කරනු ලැබ ඇති බවට පොලිස්පතිවරයා විසින් මහාධිකරණයට වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබීමෙන් සහ චූදිතයා අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමෙන් පසු ආරම්භ විය යුතු ය. එවැනි සෑම නඩු විභාගයක්ම, ජූරි සභාවක් නොමැතිව විනිශ්චයාසනාරූඪ වන මහාධිකරණ විනිශ්චයකාරවරයකු විසින් පවත්වනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග යටතේ වූ වරදවල් පිළිබඳ නඩු විභාගයට, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 450 වන වගන්තියේ (6) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේදවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(4) මේ නියෝගය යටතේ වරදක් කරන ලදැයි කියනු ලබන හෝ වරදක් කරන ලද්දේ යැයි සැක කරනු ලබන යම් තැනැත්තකු විසින් කවර වූ හෝ තැනැත්තකුට සහ කවර වූ අවස්ථානුගත කරුණු යටතේ කරනු ලැබූ පාපොච්චාරණයක් හෝ වෙනත් අපරාධාරෝපක ප්‍රකාශයක්, එවැනි වරදක් සඳහා වූ යම් නඩු විභාගයක දී ඒ තැනැත්තාට විරුද්ධව ඔප්පු කරනු ලැබිය හැකිය. එසේ වුව ද, ඒ පාපොච්චාරණයට හෝ අපරාධරෝපක ප්‍රකාශයට තබනු ලබන වගකීමේ ප්‍රමාණය අඩු කිරීමට හෝ ලුහු කිරීමට ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තා වෙනුවෙන් අපේක්ෂා කරනු ලබන්නේ නම්, ඒ ස්ථාවරය සනාථ කිරීම පිණිස අවශ්‍ය කරුණු ඔප්පු කිරීමේ භාරය ඒ තැනැත්තා වෙත විය යුතු ය.

(5) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, මේ නියෝගය යටතේ වූ වරදක් සඳහා වන නඩු විභාගය ක්‍රියා මාර්ගයේ දී කරන ලද ආඥාවක් ඉවත දමන හෝ වෙනස් කරන යම් ආඥාවක් කිරීමට හෝ එවැනි යම් නඩු විභාගයක් පැවැත්වීම නතර කිරීමට, අත්හිටුවීමට හෝ තහනම් කිරීමට කිසිදු අධිකරණයකට බලය හෝ අධිකරණ බලය නොමැත්තේ ය.

වැරදි කිරීමට තැත් කිරීම යනාදිය.

46. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් කිරීමට -

(අ) තැත්කරන හෝ කිරීමට සූදනම් වීමේ යම් ක්‍රියාවක් කරන; හෝ

(ආ) අන් තැනැත්තකුට ආධාර හෝ අනුබල දෙන; හෝ

(ඇ) අන් තැනැත්තකු සමග කුමන්ත්‍රණය කරන,

යම් තැනැත්තකු ඒ වරදට වරදකරු විය යුතු අතර, ඒ අනුව ඒ වරද සඳහා හදිසි අවස්ථා නියෝග යටතේ නියම කරනු ලැබ ඇති ආකාරයට නඩු විභාගයකට ඔහු භාජනය කර හදිසි අවස්ථා නියෝග යටතේ ඒ වරදට නියමිත දඬුවමෙන් ම ඔහුට දඬුවම් කළ යුතු ය.

වැරදි කරන්නන්ට සහාය දීම.

47. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු බව දන්නා හෝ විශ්වාස කිරීමට සෑහෙන හේතු ඇති කිසිම තැනැත්තකු විසින් එකී වරද සඳහා යට කී තැනැත්තා අල්ලා ගැනීමට, ඔහුට විරුද්ධව නඩු විභාග කිරීම හෝ ඔහුට දඬුවම් දීම වැළැක්වීමේ, ඊට බාධා කිරීමේ හෝ මැදිහත් වීමේ අදහසින් ඒ තැන්ත්තාට කිසිදු සහායක් නොදිය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි.

48. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පුද්ගල මණ්ඩලයක් විසින් වරදක් කරනු ලැබූ අවස්ථාවක -

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකුම; හා

(ආ) ඒ මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවකුම,

තමාගේ දැනුම නොමැතිව ඒ වරද කර ඇති බව, හා ඒ වරද කිරීම වැළැක්වීමට යථා ලෙස පූර්ණ උද්‍යෝගයෙන් තමා ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ වරදට වරදකරු වශයෙන් සැලකිය යුතු ය.

49. (1) යම් හදිසි අවස්ථා නියෝගයක් හෝ එවැනි යම් නියෝගයක් යටතේ කරනු ලැබූ යම් නියමයක් හෝ යම් රීතියක් හෝ එවැනි නියෝගයක් යටතේ දෙනු ලැබූ විධානයක් හෝ කරනු ලැබූ යම් නියමයක් හෝ, යම් තැනැත්තකු උල්ලංඝනය කරතහොත් හෝ එවැන්නකට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිතහොත් ඔහු වරදකට වරදකරු විය යුතු ය. තව ද, මහාධිකරණය ඉදිරියේ දී ජූරි සභාවක් නොමැතිව පවත්වනු ලබන නැතහොත් මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු ඔහු වරදකරු කරනු ලැබූ විට, ඒ නියෝගයෙහි සඳහන් යම් විශේෂ විධිවිධානවලට යටත්ව, මාස තුනකට අඩු නොවූ ද අවුරුදු පහකට වැඩි නොවූ ද බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමට හෝ රුපියල් පන්දහසකට අඩු නොවූ ද රුපියල් දස දහසකට වැඩි නොවූ ද දඩයකට යටත් විය යුතු ය. දණ්ඩන.

(2) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතෙහි වූ වරදක් සඳහා ඒ නියෝගයෙහි දඬුවමක් නියම කර නොමැති අවස්ථාවක, ඒ වරද සම්බන්ධයෙන් වරදකරු වූ තැනැත්තකු මහාධිකරණය ඉදිරියේ ජූරි සභාවක් නොමැතිව පවත්වනු ලබන නැතහොත් මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, මේ නියෝගයෙහි (1) වන ඡේදයෙහි නියම කරනු ලැබූ දඬුවමටම ඔහු යටත් විය යුතු ය.

(3) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306(2) වන වගන්තිය හදිසි අවස්ථා නියෝගයක් යටතෙහි වරදක් සම්බන්ධයෙන් වරදකරු වූ තැනැත්තකුට අදාළ නොවිය යුතු ය.

## VI වන කොටස

### *විමර්ශන නඩු විභාග යනාදිය*

50. (1) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් කිරීමේ චේතනාවක්, ප්‍රයත්නයක් හෝ සූදානමක් ගැන හෝ එවැනි වරදක් සිදු කිරීම ගැන හෝ දැන ගන්නා කවරකු වුව ද ඒ පිළිබඳ තොරතුරු ආසන්නතම ග්‍රාම නිලධරයාට හෝ ආසන්නතම පොලිසිය භාරව සිටින නිලධරයාට නොපමාව දැන්විය යුතු ය. තොරතුරු එළිදරව් කිරීමේ යුතුකම

(2) (අ) ඡේදයෙහි සඳහන් තොරතුරු දැන්වීම ඕනෑ කමින්ම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු විය යුතු ය.

(3) හදිසි නියෝගයක් යටතේ වූ වරදක් සම්බන්ධ යම් තොරතුරක්, ලැබුණු යම් ග්‍රාම නිලධරයකු විසින් ඒ තොරතුරු අප්‍රමාදව ආසන්නතම පොලිස් ස්ථානයට දැන්විය යුතු ය.

51. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් විමර්ශනය කරන යම් පොලිස් නිලධරයෙකු විසින්- විමර්ශනය කරන පොලිස් නිලධරයන්ගේ බලතල

(අ) වරදට සම්බන්ධ සිද්ධීන් හා කරුණු පිළිබඳ දැනුමක් ඇතැයි සැක කෙරෙන යම් තැනැත්තකුගෙන් වාචික ප්‍රශ්න අසා එසේ ප්‍රශ්න කරන ලද තැනැත්තා කළ යම් ප්‍රකාශයක් ලියා ගත යුතු ය:

එසේ වූවද, එබඳු ප්‍රකාශයක් කරන තැනැත්තා විසින් මෙන්ම එය සටහන් කරන පොලිස් නිලධාරයා විසින් ද එම ප්‍රකාශයට අත්සන් තැබිය යුතු ය:

එසේ ද වූවත්, ඒ ප්‍රකාශයට අත්සන් තැබීම යම් තැනැත්තකු විසින් ප්‍රතික්ෂේප කළ අවස්ථාවක එම ප්‍රතික්ෂේප කිරීම පොලිස් නිලධරයා විසින් සටහන් කර ගත යුතු ය.

(ආ) ඒ තැනැත්තාගේ ආදර්ශ අත් අකුරු ඡායාරූප, ඇඟිලි සටහන් සහ වෙනත් හඳුනා ගැනීමේ ලක්ෂණ ලබා ගත හැකි ය;

(ඇ) ඒ තැනැත්තා සෝදිසි කළ හැකිය, නැතහොත් ඒ තැනැත්තා පදිංචි ගෙයට හෝ වැඩ කරන ස්ථානයට ඇතුළු වී ඒ ගෙය හෝ ස්ථානය සෝදිසි කළ හැකි ය;

(ඈ) එබඳු යම් වරදකට පැටලුණු හෝ සම්බන්ධ වූ නැතහොත් පැටලී හෝ සම්බන්ධ වී ඇතැයි සැලකෙන යම් ස්ථානයකට, ගොඩනැගිල්ලට, වාහනයකට හෝ යාත්‍රාවකට ඇතුළු වී එය සෝදිසි කළ හැකිය; තව ද

(ඉ) යම් විදුලි පණිවිඩයක්, තැපැල් ලේඛනයක්, යම් බැංකුවක ඇති වෙනත් පොතක් හෝ ලේඛනයක් ඇතුළුව, කවරාකාරයක වූ හෝ යම් චංචල දේපළක් පරීක්ෂා කොට තම සන්තකයට ගත හැකි ය:

එසේ වුව ද, යම් බැංකුවකින් හෝ තැපැල් කාර්යාලයකින් යම් පොතක්, හෝ ලේඛනයක් ලබා ගැනීමට බලාපොරොත්තුවීමට පෙර, තනතුරින් සහකාර පොලිස් අධිකාරීවරයකුට වඩා පහත් නොවූ පොලිස් නිලධරයකු විසින් ඒ පොත හෝ ලේඛනය ඒ විමර්ශනයේ කාර්යයන් සඳහා අවශ්‍ය බව, අවස්ථාචෝචිත විය හැකි පරිදි ඒ බැංකුව හෝ තැපැල් කාර්යාලය භාරව සිටින කළමනාකරු හෝ නිලධාරයා වෙත කලින් ලියා දැන්විය යුතු ය.

සැකකරනු ලබනතැනැත්තන් සන්තකයෙහිතිබෙන ලේඛන

52. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ යම් වරදකට පැටලී ඇතැයි සැක කෙරෙන තැනැත්තකුගේ සන්තකයේ, භාරයේ හෝ පාලනයේ තිබී සොයා ගනු ලබන යම් පොතක්, ලේඛනයක් හෝ පත්‍රිකාවක් ඒ වරද සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව කෙරෙන යම් නීති කෘත්‍යවලදී අදාළ විය යුතු අතර ඒ පොතේ, ලේඛනයේ හෝ පත්‍රිකාවේ අඩංගු කරුණු තවදුරටත් ඔප්පු කිරීමක් නොමැතිව සාක්ෂි වශයෙන් පිළිගත යුතු ය.

ප්‍රශ්න කිරීමේ අයිතිවාසිකම් හා සහාය දීමේ යුතුකම

53. (අ) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් පිළිබඳව විමර්ශනය කරන පොලිස් නිලධරයකුට හෝ හදිසි අවස්ථා නියෝග යටතේ විධිමත් ලෙස බලය පවරනු ලැබූ තැනැත්තකුට, වෙන යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද -

(i) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ රඳවා ගනු ලැබ සිටින හෝ අත් අඩංගුවේ තබා ගනු ලැබ සිටින තැනැත්තකු ඇතුළු යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමේ දී එසේ ප්‍රශ්න කරන කාලය තුළ දී විමර්ශනයේ කාර්යය සඳහා එම තැනැත්තා ස්ථානයෙන් ස්ථානයට ගෙන යෑමේ දී අයිතිවාසිකම් ද තිබිය යුතු ය; තව ද

(ii) ඒ විමර්ශනයේ කාර්යය සඳහා අවශ්‍ය වන ලිපිලේඛන ඇතුළුව යම් භාණ්ඩයක් හෝ වෙනත් දෙයක්, එසේ ප්‍රශ්න කරනු ලබන යම් තැනැත්තකුගේ භාරයෙන් තමාගේ භාරයට ගැනීමේ අයිතිවාසිකම් තිබිය යුතු ය.

(ආ) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් පිළිබඳව විමර්ශන කරන පොලිස් නිලධරයකුට හෝ නිසි බලය ලැබූ වෙනත් තැනැත්තකුට සෑම සහයෝගයක් ම දීම සෑම තැනැත්තකුගේ ම යුතුකම විය යුතු අතර මේ නියෝගයේ (අ) ඡේදයේ (i) වන අනුඡේදය යටතේ ප්‍රශ්න කරනු ලබන සෑම තැනැත්තෙක් ම ඔහුගෙන් අසනු ලබන සියලුම ප්‍රශ්නවලට සත්‍යවාදී ලෙස පිළිතුරු දිය යුතු අතර වෙන යම නීතියක පටහැකිව කුමක් සඳහන් ව ඇත ද, යම් ලේඛනයක අඩංගු කරුණු අතුළුව විමර්ශනයට විෂය වූ කරුණට අදළ සියලු තොරතුරු අනාවරණය කළ යුතු ය. එම තොරතුරු හෝ එම ලේඛනවල අඩංගු කරුණු පිළිබඳ දැනීම එම තැනැත්තාට ලැබී ඇත්තේ ඔහු දරන කවර තත්ත්වයක් නිසා වුව ද එය නොසැලකිය යුතු ය.

(ඇ) මේ නියෝගයේ (අ) ඡේදය යටතේ ප්‍රශ්න කරනු ලබන තැනැත්තකු භාරයේ, සන්තකයේ ඇති ලිපිලේඛනයක් ඇතුළු යම් භාණ්ඩයක් හෝ වෙනත් දෙයක් යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් පිළිබඳව විමර්ශනය කරන පොලිස් නිලධරයකු වෙත හෝ නිසි ලෙස බලය ලැබූ තැනැත්තකු වෙත හෝ භාර දෙන ලෙස, ඒ පොලිස් නිලධරයා හෝ බලය පවරනු ලැබූ තැනැත්තා විසින් විධාන කරනු ලැබූ කල්හි එසේ භාරදීම එසේ ප්‍රශ්න කරනු ලබන සෑම තැනැත්තකුගේම යුතුකම විය යුතු ය.

(ඇ) මේ නියෝගයේ විධිවිධානවලින් යමක් උල්ලංඝනය කිරීම හෝ ඒ යටතේ නියම කරන ලද යම් යුතුකමක් කඩ කිරීම මේ නියෝගවල 49 වන නියෝගය යටතේ දඬුවම් පැමිණිවිය හැකි වරදක් විය යුතු ය.

ප්‍රවේශවීමේ අයිතිවාසිකම් පොලිස් නිලධරයකු සතු බව

54. යම් තැනැත්තකු රඳවාගෙන හෝ අත්අඩංගුවේ තබාගෙන ඇති කාල සීමාව තුළ විමර්ශනයේ කාර්යය සඳහා සාධාරණ කාලවේලාවන් හි දී එකී යම් තැනැත්කු වෙත යාමේ අයිතිය යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් පිළිබඳව විමර්ශනය කරන පොලිස් නිලධරයකු සතුව තිබිය යුතු ය.

සාමාන්‍ය බලතලවලට අතිරේකව පොලිස් නිලධරයන්ගේ බලතල.

55. යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පොලිස් නිලධරයකු සතු බලතල, වෙනයම් නීතියක් යටතේ ඔහු සතු බලතලවලට අතිරේකව මිස, ඒ බලතල හීන කිරීමක් නොවිය යුතු ය.

පොලිස් නිළධරයකුගේ බලතල අන් සමහර නිළධරයන් සහතැනැත්තන් විසින් පාවිච්චි කරනුලැබිය හැකි බව .

56. (1) යම් හදිසි අවස්ථාව නියෝගයක් යටතේ පොලිස් නිලධරයකුගේ බලතල පිළිවෙලින් ශ්‍රී ලංකා යුද්ධ හමුදපති, ශ්‍රී ලංකා නාවික හමුදපති හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාපති විසින් එම බලතල ක්‍රියාත්මක කිරීම සඳහා බලය පවරනු ලැබූ ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ, ශ්‍රී ලංකා නාවික හමුදවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදවේ යම් අධිකාරලත් හෝ අධිකාර නොලත් නිලධරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

(2) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ පොලිස් නිලධරයකුගේ බලතල ජනාධිපතිවරයා විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා බලය පරවනු ලැබූ යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

57. පොලිස් නිලධරයෙකු විසින් හෝ සන්නද්ධ හමුදවල යම් සාමාජිකයකු විසින් හෝ සිය රාජකාරී කටයුතු ඉටු කිරීමේ දී යම් තැනැත්තකුගේ මරණය සිදු කරනු ලබන අවස්ථාවක වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද ඒ නිලධරයා හෝ සාමාජිකයා අවස්ථාවෝචිත පරිදි පොලිස් අත්අඩංගුවේ හෝ හමුද අත්අඩංගුවේ හෝ රඳවා තබා ගැනීම සඳහා උචිත බලධරයා වෙත භාරදෙනු ලැබිය යුතු ය.

පොලිස් නිලධරයෙකු හෝ සන්නද්ධ හමුදවල යම් සාමාජිකයකු හෝ රඳවා තබා ගැනීම

58. (1) උප පොලිස් අධිකාරිවරයකුගේ නිලයට අඩු නොවන නිලයක් දරන යම් පොලිස් නිලධරයකු විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් නිළධරයෙකු හෝ තැනැත්තකු විසින් යම් මෘත ශරීරයක් ස්වාමිත්වයට ගැනීම හා භූමිදානය කිරීම හෝ ආදාහනය කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම හා එබඳු භූමිදානයක් හෝ ආදාහනයක් සම්බන්ධයෙන් හෝ එබඳු භූමිදානයක හෝ ආදාහනයක කාර්යය සඳහා රැස්වීමකට පැමිණ සිටීමට අවසර දෙනු ලැබිය හැකි තැනැත්තන් කවුරුන්දැයි ස්වකීය අභිමතය පරිදි නිශ්චය කිරීම නීත්‍යානුකුල විය යුතු ය. තව ද එම නිලධරයාගේ හෝ බලයලත් තැනැත්තාගේ අවසරය නොමැතිව එකී රැස්වීමක සිටින හෝ ඉහත පවරනු ලැබූ බලතල ක්‍රියාවෙහි යෙදවීමේදී ඒ නිළධරයාට හෝ බලයලත් තැනැත්තාට අවහිර කරන යම් තැනැත්තකු වරදක් සම්බන්ධයෙන් වරදකරු විය යුතු ය.

මෘත ශරීර භූමිදාන කරන හෝ ආදහන කරන ලෙස විධාන කිරීම.

(2) මේ නියෝගය යටතේ මෘත ශරීරයක ස්වාමිත්වය හා භූමිදානය හෝ ආදාහනය සම්බන්ධයෙන් පියවර ගන්නා යම් නිලධරයකු හෝ තැනැත්තකු විසින් හදිසි මරණ පරීක්ෂණයක හෝ භූමිදානයට හෝ ආදාහනයට අදාළව මේ නියෝගවල වෙනත් විධිවිධාන හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අනුව ක්‍රියාකිරීමට අවශ්‍ය නොවන්නේය.

(3) (1) වන ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුවද තමා විසින් හෝ තමාට පහළ යම් නිලධරයකු විසින් හෝ තම කාර්යය අතරතුර කරනු ලැබූ යම් ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් යම් තැනැත්තෙකුගේ මරණය සිදුව ඇති බව විශ්වාස කිරීමට යම් පොලිස් නිලධරයකුට හෝ සන්නද්ධ හමුදවල යම් සාමාජිකයෙකුට හෝ හේතු ඇති අවස්ථාවක නැතහොත් පොලිස් අත්අඩංගුවෙහි හෝ හමුද අත්අඩංගුවෙහි සිටිය දී යම් තැනැත්තකු මිය යන අවස්ථාවක, ඒ පොලිස් නිලධාරයා අනුයුක්ත කොට ඇත්තේ යම් කොට්ඨාසයකට ද ඒ කොට්ඨාසය භාර පොලිස් අධිකාරිවරයා විසින් හෝ සන්නද්ධ සේවාවල සාමාජිකයකු සම්බන්ධයෙන් වන විට, ඔහු අයත් ඒකකයේ අණදෙන විධාන නිලධරයා විසින් හෝ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXX වන පරිච්ඡේදයේ සහ 9 වන වගන්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන් ව ඇත ද මරණයට අදළ සිද්ධීන්, පොලිස්පතිවරයාට හෝ ආසන්නතම නියෝජ්‍ය පොලිස්පතිවරයාට හෝ වාර්තා කළ යුතු ය.

59. 58 නියෝගයෙහි (3) වන ඡේදය යටතේ තොරතුරු ලැබුණු විට අවස්ථාවෝචිත පරිදි පොලිස්පතිවරයා හෝ නියෝජ්‍ය පොලිස්පතිවරයා හෝ විසින් -

පොලිස් නිලධරයා විසින් වාර්තා කළ යුතු බව සහ ප්‍රකාශ ආදිය වාර්තාගත කළ යුතු බව

(අ) සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලයට පහළ නොවන නිලධරයකුට සිද්ධිය වූ ස්ථානයට ගොස් -

(i) ඔහුගේ නිරීක්ෂණය වාර්තා කිරීමට;

(ii) යම් ඉදිරිපත් කරනු ලැබිය හැකි ද්‍රව්‍ය භාරයට ගැනීමට;

(iii) තම මතය අනුව, ඒ මරණයට අදළ අවස්ථානුගත කරුණු දන්නා බවට පෙනී යන යම් තැනැත්තකුගේ ප්‍රකාශ වාර්තාගත කිරීමට විධාන කරනු ලැබිය යුතු ය; තව ද

(ආ) මෘත ශරීරය සොයාගනු ලැබූ වේ යම් අවස්ථාවක දී ද, ඒ සිද්ධිය වහාම මහෙස්ත්‍රාත්වරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

60. (1) අවස්ථාවෝචිත පරිදි, පොලිස්පතිවරයාගෙන් හෝ නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් 59 නියෝගය යටතේ සිද්ධි පිළිබඳ වාර්තාවක් මහෙස්ත්‍රාත්වරයා වෙත ලැබුණු විට ඔහු විසින් -

පශ්චාත් මරණ පරීක්ෂණ පැවැත්වීම සහ මෘත ශරීර භූමාදනය කිරීම හෝ ආදහනය කිරීම

(අ) ඒ මෘත ශරීරය පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණයක් වහාම පැවැත්වීමට රජයේ වෛද්‍ය නිලධරයකුට විධාන කළ යුතු ය. තව ද එවකටත් මෘත ශරීරය භූමදනය කරනු ලැබ ඇත්නම් එය ගොඩ ගැනීමට විධාන කළ හැකි ය.

(ආ) පශ්චාත් මරණ පරීක්ෂණය අවසානයේ දී මෘත ශරීරය සුදුස්සක් කිරීම සඳහා නියෝජ්‍ය පොලිස්පතිවරයාට භාර දෙන ලෙස ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(2) මෘත ශරීරය භාරදෙනු ලැබ ඇත්තේ යම් නියෝජ්‍ය පොලිස්පත්වරයකුට ද, ඒ නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින්, ජාතික ආරක්ෂාව සඳහා හෝ මහජන සාමය පවත්වාගෙන යාම හෝ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන යම් කොන්දේසිවලට හෝ පරිසීමා කිරීම්වලට යටත්ව, මෘත ශරීරයට හිමිකම්පාන යම් ඥාතීන්ට ඒ මෘත ශරීරය භාර දෙනු ලැබිය යුතු ය.එසේ වුවද, ජාතික ආරක්ෂාව සඳහා හෝ මහජන සාමය පවත්වාගෙන යාම හෝ ආරක්ෂා කිරීම සඳහා අවස්ථානුගත කරුණු අනුව අවශ්‍ය යයි නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් සලකනු ලබන යම් පියවරවලට අනුකූලව, මෘත ශරීරය සන්තකයට ගෙන භූමදානය කිරීම හෝ ආදාහනය කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට ඔහු විසින් බලය දෙනු ලැබිය හැකි ය.

පොලිස්පතිවරයා විසින් මහාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූවිට යම්තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් විභාග කිරීමට මහාධිකරණයට ඇති බලය

61. (1) 58 වන නියෝගයෙහි (3) වන ඡේදයේ සඳහන් අවස්ථානුගත කරුණු අනුව, දිවයිනේ යම් කොටසක දී හෝ එහි දේශීය ජල තීරය ඇතුළත දී සිදු කරනු ලැබූ හෝ සිදු කරනු ලැබුවේ යැයි අදහස් කරනු ලබන යම් තැනැත්තකුගේ මරණය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද කොළඹ දී පවත්වනු ලබන මහාධිකරණයට අනන්‍ය අධිකරණ බලය තිබිය යුතු ය.

(2) කොළඹ දී පවත්වනු ලබන මහාධිකරණයේ විනිශ්චයකාරවරයා වෙත පොලිස්පතිවරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, ඒ අධිකරණය විසින්, ඒ ඉල්ලීමෙහි මියගිය තැනැත්තා වශයෙන් නම් කරන ලද තැනැත්තාගේ මරණයට හේතු සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු ය.

(3) මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ වූ ඉල්ලීමක, මියගිය තැනැත්තා වශයෙන් නම් කරන ලද ඒ තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් යම් මහෙස්ත්‍රාත් අධිකරණයක යම් නඩු කටයුතු විනිශ්චයට භාජනයව පවත්නා අවස්ථාවක, ඒ ඉල්ලීමේ දිනයෙහි මහෙස්ත්‍රාත් අධිකරණයෙහි විනිශ්චයට භාජනව පවත්නා ඒ සියලු නඩු කටයුතු එකී ඉල්ලීමෙහි මියගිය තැනැත්තා වශයෙන් නම් කරන ලද තැනැත්තා වෙත පැවරිය යුතු ය.

(4) ජාතික ආරක්ෂාව සහ මහජන සාමය ආරක්ෂා කිරීම කෙරෙහි සැලකිල්ල ඇතිව, මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින් ඒ පරීක්ෂණය හෝ ඒ පරීක්ෂණයේ කොටසක් ශ්‍රී ලංකාවේ කවර වූ යම් කොටසක දී හෝ පවත්වනු ලැබිය හැකි ය.

(5) පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වන රජයේ වෛද්‍ය නිලධරයා විසින්, එකී මහාධිකරණ විනිශ්චයකාරවරයා වෙත තම වාර්තාව ඉදිරිපත් කළ යුතු අතර, මහාධිකරණය විසින් තත් කාර්යය කිරීමට බලය දෙනු ලැබුවේ නම් මිස, එහි ඇතුළත් යම් දෙයක් යම් තැනැත්තකුට අනාවරණය නොකළ යුතු ය.

(6) මූලික නිරීක්ෂණ වාර්තා සහ පරීක්ෂණය පැවත්වීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් ලේඛන පොලිස්පතිවරයා විසින් මහාධිකරණ විනිශ්චයකාරවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(7) පොලිස්පතිවරයා විසින් හෝ තත් කාර්යය සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ වෙනත් නිලධරයකු විසින් තමා ඉදිරියෙහි තබනු ලබන යම් සාක්ෂි සහ යම් මරණයක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වනු ලබන්නේ ද ඒ පරීක්ෂණයට අදාළ අවස්ථානුගත කරුණු දන්නා බව පෙනී යන වෙනත් යම් තැනැත්තකුගේ සාක්ෂි මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින් වාර්තා ගත කළ යුතු ය.

(8) මහාධිකරණය ඉදිරියෙහි පැවැත්වෙන නඩු කටයුතු මහජනයාට විවෘත නොවිය යුතු අතර, නිසි බලධරයා විසින් බලය දෙනු ලබන නඩු කටයුතුවල හෝ ඒවායේ කොටසක වාර්තා පමණක් පළ කරනු ලැබිය යුතු ය :එසේ වුව ද, තත් කාර්යය සඳහා අභියාචනාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, නඩු කටයුතු හෝ ඉන් යම් කොටසක් හෝ මහජනයාට විවෘත කිරීමට ඒ අධිකරණය විසින් විධාන කරනු ලැබිය හැකිය.

(9) පරීක්ෂණය අවසානයේ දී වෙනත් යම් ලේඛන සමග සාක්ෂි වාර්තාව සහ මරණය සිදුවූ අවස්ථානුගත කරුණු පිළිබඳ වාර්තාවක් මහාධිකරණ විනිශ්චයකාරවරයා විසින් නීතිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

නීතිපතිවරයාගේ බලතල.

62. 61 වන නියෝගයේ (9) වන ඡේදය යටතේ නීතිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ සාක්ෂි වාර්තාව සහ වෙනත් ලේඛන ලැබුණ විට, නීතිපතිවරයා විසින් -

(අ) ඔහුට අවශ්‍ය කරනු ලබන යම් වැඩිදුර කරුණු හෝ තොරතුරු කැඳවීම.

(ආ) යම් වරදවල් සිදු කිරීම අනාවරණය කොට ඇති බවට ඔහු සෑහීමට පත් වන්නේ නම්,

(i) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XIV වන හෝ XV වන හෝ පරිච්ඡේද යටතේ නඩු පැවරීමට විධාන කිරීම ; හෝ

(ii) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 393 වන වගන්තියේ (7) වන උපවගන්තියේ විධිවිධාන යටතේ කටයුතු කරගෙන යාම ; හෝ

නීත්‍යානුකූල වන්නේ ය.

## VII වන කොටස

### පොදු

අධිකරණ ඉදිරියේ නීති කෘත්‍ය සඳහා ප්‍රමුඛකත්වය

63. හදිසි අවස්ථා නියෝග යටතේ යම් තැනැත්තෙකු විසින් කරනු ලැබී යයි කියනු ලබන වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක පැවැත්වෙන යම් නීති කෘත්‍යයක්, ඒ අධිකරණයේ වෙනත් යම් කටයුතුවලට පෙර විභාග කරනු ලැබිය යුතු ය.

පරීක්ෂණ හා නඩු විභාග

64. (1) මෙහි අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්නම් පරිද්දෙන් හැර සහ අන්කිසි ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ යම් තැනැත්තකු විසින් කර ඇතැයි කියනු ලබන වරදක් පිළිබඳ නඩු කටයුතු තත් කාලයෙහි ඒ තැනැත්තා සිටින ස්ථානය කෙරෙහි අධිකරණ බලය ඇති ශ්‍රී ලංකාවේ නිසි අධිකරණය ඉදිරියෙහි ආරම්භ කළ හැකි ය.

(2) (අ) හදිසි අවස්ථා නියෝග යටතේ තැනැත්තන් විසින් කර ඇතැයි කියනු ලබන වැරදි ; හෝ

(ආ) ඒ නම් යෝ. යටතේ, නියම ලෙසින් හෝ අනියම් ලෙසින් යම් බලයක් පාවිච්චි කිරීම හෝ යුතුකමක් ඉටු කිරීම නැතහොත් කල්පිත පාවිච්චි කිරීම හෝ ඉටුකිරීම හෝ හේතු කොටගෙන හෝ එයින් උද්ගත වූ නැතහොත් ඒ පාවිච්චි කිරීමේ දී හෝ ඉටු කිරීමේදී කරන ලද හෝ නොකර හරින ලද ක්‍රියාවලින් වෙන යම් ලිඛිත නීතියක් යටතේ යම් වැරදි සංයුක්ත වේ ද යම් තැනැත්තන් විසින් කරන ලදැයි කියනු ලබන එවැනි වැරදි

පිළිබඳ පරීක්ෂණ කවර අධිකරණයකදී පවත්වා නඩු විභාග කළ යුතු දැයි නීතිපතිවරයා විසින් තීරණය කළ හැකි ය. ඒ අධිකරණය ස්වකීය ප්‍රාදේශීය බලසීමාව ඇතුළත දී ඒ වරදවල් කරනු ලැබුයේ නම්, ඒ වරදවල් පිළිබඳ පරීක්ෂණ පවත්වා නඩු විභාග කළ හැකිව තිබූ අධිකරණයක් විය යුතු ය.

(3) යටත් පිරිසෙයින් චෝදනාවලින් එකක්වත් ඉහත (2) වන ඡේදයේ (ආ) අනුඡේදයේ සඳහන් කවර වූ හෝ වරදක් සම්බන්ධයෙන් වන විට, වෙනත් කිසිදු ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, නීතිපතිවරයා ට කෙළින්ම මහාධිකරණය වෙත අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කළ හැකි වන අතර, එසේ විත්තිකරුට විරුද්ධව ඉදිරිපත් කෙරෙන අධිචෝදනා පත්‍රය සම්බන්ධ නඩු විභාගය ජූරි සභාවක් නොමැතිව පවත්වාගෙන යා යුතු ය.

(4) මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ යම් වරදක් ගැන පරීක්ෂණ පවත්වා නඩුව විභාග කළ යුතු වන්නේ කුමන අධිකරණයක් මගින් දැයි නීතිපතිවරයා තීරණය කළ අවස්ථාවක, ඒ වරද ගැන පරීක්ෂණ පවත්වා නඩුව විභාග කළ යුතු අධිකරණය ලෙස ඔහු විසින් තම ලිඛිත නියෝගයක් මගින් ඒ අධිකරණය නම් කළ යුතු අතර ඒ අනුව ඒ අධිකරණය විසින් ඒ නියෝගයේ බලය ප්‍රකාර පරීක්ෂණය හෝ නඩු විභාගය පවත්වා ඒ නියෝගය ඒ පරීක්ෂණයේ හෝ නඩු විභාගයේ නඩු කටයුතු වාර්තා සමඟ ගොනුකොට තැබිය යුතු ය.

(5) මේ නියෝගයේ (2) වන ඡේදය යටතේ නීතිපතිවරයා විසින් කරනු ලබන තීරණයක් පහත සඳහන් වැරදිවලට අදාළ කළ හැකිය.

(අ) හදිසි අවස්ථා නියෝග යටතේ තැනැත්තන් විසින් ශ්‍රී ලංකාව මුළුල්ලෙහිම හෝ ශ්‍රී ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක කරන ලදැයි කියනු ලබන වැරදි ; හෝ

(ආ) යම් නිශ්චිත පන්තියක හෝ වර්ගයක තැනැත්තන් විසින් ශ්‍රී ලංකාවේ යම් නිශ්චිත ප්‍රදේශයක කරන ලදැයි කියනු ලබන ; හෝ

(ඇ) තැනැත්තන් විසින් ශ්‍රී ලංකාව මුළුල්ලෙහි ම හෝ ශ්‍රී ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක කරන ලදැයි කියනු ලබන යම් නිශ්චිත පන්තියකට හෝ වර්ගයකට අයත් සියලු ම වැරදි ; හෝ

(ඇ) යම් නිශ්චිත පන්තියකට හෝ වර්ගයකට අයත් තැනැත්තන් විසින් හෝ යම් නිශ්චිත තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව මුළුල්ලෙහි ම හෝ ශ්‍රී ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක කර ඇතැයි කියනු ලබන යම් නිශ්චිත පන්තියකට හෝ වර්ගයකට අයත් සියලුම වැරදි ; නැතහොත්

(ඉ) යම් නිශ්චිත තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව මුළුල්ලෙහිම හෝ ශ්‍රී ලංකාවේ යම් විශේෂ ප්‍රදේශයක කර ඇතැයි කියනු ලබන යම් නිශ්චිත වරදක්.

නීතිපතිවරයාගේ අනුමතය.

65. (1) 25 වන නියෝගයේ (3) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව,-

(අ) යම් හදිසි අවස්ථා නියෝගයකට එරෙහි වරදක් සඳහා ; හෝ

(ආ) ඒ නියෝගය යටතේ යම් බලයක් හෝ කාර්යයක් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී හෝ කල්පිත ක්‍රියාත්මක කරවීමේ දී හෝ ඉටු කිරීමේ දී, කිරීමෙන් හෝ නොකර හැරීමෙන් උද්ගත වූ නැතහොත් ඇති වූ හෝ වරදකින් සංයුක්ත වන ක්‍රියාව හෝ නොකර හැරීම වෙන යම් ලිඛිත නීතියක් යටතේ තැනැත්තන් විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන

වරදක් සඳහා ඃ හෝ

මහෙස්ත්‍රාත් අධිකරණයක කිසිම නඩු පැවරීමක්, නීතිපතිවරයා විසින් ලියවිල්ලකින් දෙනු ලබන අනුමතය හෝ ඒ අනුමතය මගින් ඇතිව හෝ මිස නොකළ යුතු ය.

(2) ආඥාවෙහි නියම කරනු ලැබූ යම් හදිසි අවස්ථා නියෝගයකට විරුද්ධව යම් වරදක් සම්බන්ධයෙන් මේ නියෝගයේ (1) වන ඡේදයෙහි විධිවිධාන අදාළ නොවිය යුතු යයි ජනාධිපතිවරයා විසින් ආඥාවක් මගින් ප්‍රකාශ කළ හැකිය. තවද ආඥාව බලපවත්වනතාක් එවැනි වරදකට ඒ ඡේදය අදාළ නොවිය යුතු ය.

මහාධිකරණ ඉදිරියේ නඩු විභාග.

66. (1) යම් හදිසි අවස්ථා නියෝගයක හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් ව ඇත ද හදිසි අවස්ථා නියෝග යටතේ යම් වරදක් සම්න්ධයෙන් විශේෂ අධිකරණ විභාගයක් ඇතුළුව නඩු විභාගය නීතිපතිවරයා විසින් අධිචෝදනා පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ විට පවත්වනු ලැබිය හැකි අතර, එවිට චෝදනාවකට ලක්වූ තැනැත්තාට විරුද්ධව, අවස්ථාවෝචිත පරිදි, ජූරි සභාවක් නොමැතිව මහාධිකරණය ඉදිරියේ හෝ මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියේ මූලික පරීක්ෂණයක් නොමැතිව නඩු විභාග කළ යුතු ය.

එසේ වුව ද, මූලික පරීක්ෂණයක දී වාර්තාගත කරනු ලැබූ සාක්ෂි, අධිචෝදනාවක් සකස් කිරීම සඳහා අවශ්‍ය බව නීතිපතිවරයාගේ මතය වන අවස්ථාවක, මූලික පරීක්ෂණයක් පැවැත්වීම සඳහා ඔහු විසින් විධාන කළ හැකිය. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ මූලික පරීක්ෂණයට අදාළ විය යුතු ය.

(2) මේ නියෝගය යටතේ මහාධිකරණය ඉදිරියෙහි අධිචෝදනා ඉදිරිපත් කරනු ලැබ සිටින තැනැත්තකුට නීතිපතිවරයාගේ අනුමතිය ඇතිව මිස ඇප නියම නොකළ යුතු ය.

(3) (2) වන ඡේදයෙහි විධිවිධානවලට යටත්ව, මේ නියෝගය යටතේ පැවැත්වෙන යම් නඩු විභාගයකදී අධිකරණය ඉදිරියෙහි චෝදනා කරනු ලබන සියලු තැනැත්තන් කැඳවීම, ඔවුන් සිරභාරයට ගැනීම, ඔවුන්ගේ රැකවරණය හෝ ඔවුනට ඇප නියම කිරීම සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීම ඒ නඩු විභාගය පවත්වන අධිකරණය විසින් හෝ මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින් කළ හැකි ය.

(4) යම් තැනැත්තකු සිර භාරයට ගනු ලැබීම ඒ තැනැත්තා විසින් මග හරින බව, පැනගොස් සැඟවී සිටින බව හෝ අසනීප බවට ව්‍යාජ ලෙස හඟවනු ලබන බව අධිකරණය සෑහීමකට පත් වුවහොත් මේ නියෝගය යටතේ මහාධිකරණය ඉදිරියෙහි පැවැත්වෙන ඒ තැනැත්තා පිළිබඳ නඩු විභාගය ඒ තැනැත්තා නොපැමිණ සිටිය දී ආරම්භ කළ හැකිය. නැතහොත් එසේ පවත්වාගෙන යා හැකි ය.

(5) මේ නියෝගය යටතේ මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ලැබ සිටින යම් තැනැත්තකු විසින්, ඒ නඩු විභාගය ආරම්භ වන දිනට පෙර දින තිහක් ඉක්ම නොවිය යුතු යම් අවස්ථාවක, පැමිණිලි පක්ෂය විසින් කැඳවීමට අදහස් කරන සාක්ෂිකරුවන් විසින් කරන ලද ප්‍රකාශවල ද නඩු විභාගයේ දී උපයෝගී කර ගැනීමට

බලාපොරොත්තු වන ලේඛනවල ද පිටපත් තමාට සපයන ලෙස මහාධිකරණය වෙත ලිඛිත ඉල්ලීමක් මගින් අයැද සිටිය හැකි අතර, ඒ සියලු ප්‍රකාශවල හෝ ලේඛනවල පිටපත් හෝ ස්වකීය අභිමතය පරිදි සුදුසු යයි අධිකරණය සලකන ප්‍රකාශවල හෝ ලේඛනවල පමණක් පිටපත් ඒ තැනැත්තාට දිය යුතු යැයි අධිකරණය විසින් නියම කළ හැකිය.

(6) මේ නියෝග යටතේ මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඇතුළුව මහාධිකරණ ඉදිරියෙහි වූ නඩු විභාගයක්, අවස්ථාවෝචිත පරිදි ජූරි සභාවක් නොමැතිව මහාධිකරණය ඉදිරියෙහි හෝ මහාධිකරණයේ විශේෂ අධිකරණයක් ඉදිරියෙහි නඩු විභාග සම්බන්ධයෙන් වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට හැකිතාක් ඉක්මණින් පැවැත්විය යුතු ය.

ප්‍රකාශ සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කළ හැකි බව

67. (1) හදිසි අවස්ථා නියෝග යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුගේ නඩු විභාගයකදී ඒ තැනැත්තා විසින් කරන ලද ප්‍රකාශයක් පාපෝච්චාරණයක් වුවත්, නැතත්, එය කරන ලද අවස්ථාවේ දී එම තැනැත්තා සිටියේ පොලිස් නිලධාරයකුගේ රැකවරණයේ වුවත්, නැතත්, එම ප්‍රකාශය මහෙස්ත්‍රාත්වරයා ඉදිරිපිට දීම කරන ලද්දක් වුවත්, නැතත්, එම ප්‍රකාශය සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තිය යටතේ අදාළ නොවන්නේ නම් පමණක් ම ඔහුට විරුද්ධව ඔප්පු කළ හැකිය.

එසේ වුව ද, ඒ ප්‍රකාශය, තනතුරින් සහකාර පොලිස් අධිකාරී කෙනකුට වඩා පහළ නිලධරයකුට කරන ලද්දක් නම්, එවැනි කිසිම ප්‍රකශයක් ඒ තැනැත්තාට විරුද්ධව ඔප්පු නොකළ යුතු ය.

(2) යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් (1) වන ඡේදය යටතේ යම් තැනැත්තකුට විරුද්ධව ම ඔප්පු කළ හැකි ඔහු විසින් ම කරන ලද ප්‍රකාශයක් මේ නියෝගවල 54 වන නියෝගය යටතේ කරන ලද ප්‍රකාශයක් හැර, වෙනත් සාක්ෂි මගින් වැදගත් විස්තර සම්බන්ධයෙන් එම ප්‍රකාශය තහවුරු කළ හැකි නම් පමණක් ම එම වරද සඳහා හවුලේ චෝදනා කරනු ලැබ සිටින යම් තැනැත්තකුට විරුද්ධව ද ඔප්පු කළ හැකිය.

(3) (1) වන හෝ (2) වන ඡේදවල සඳහන් යම් ප්‍රකාශයක් සාක්ෂි ආඥාපනතේ 24 වන වගන්තිය යටතේ අදළ නොවන බව ඔප්පු කිරීමේ භාරය එය අදළ නොවන බව තරයේ කියා සිටින තැනැත්තා සතු විය යුතු ය.

(4) යම් හදිසි අවස්ථා නියෝග යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් සාක්ෂි ආඥාපනතේ 25 වන, 26 වන සහ 30 වන වගන්තිවල විධිවිධාන අදළ නොවිය යුතු ය.

(5) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 110 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද යම් තැනැත්තෙකු විසින් කරන ලද ප්‍රකාශයක් (1) ඡේදයේ හෝ (2) ඡේදය යටතේ ඔප්පු කරනු ලැබිය හැකිය.

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පණතේ XI වන පරිච්ඡේදයේ විධිවිධාන අදළ නොවිය යුතු බව.

68. හදිසි අවස්ථා නියෝග යටතේ පවත්වනු ලබන යම් පරීක්ෂණවලට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XI වන පරිච්ඡේදයේ විධිවිධාන අදළ නොවිය යුතු ය.

ආණ්ඩුවේ රස පරීක්ෂකගේ සහතිකය සහ යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් ආණ්ඩුවේ රස පරීක්ෂක විසින් විනාශ කරනු ලැබීම

69. (1) වරදක් සම්බන්ධයෙන් පැවැත්වෙන යම් නීති කෘත්‍යයක දී පරීක්ෂණය හෝ විශ්ලේෂණය සඳහා තමා වෙත ඉදිරිපත් කරන ලද යම් දෙයක හෝ ද්‍රව්‍යයක අනන්‍යතාව, සංයුතිය හෝ ස්වභාවය සම්බන්ධයෙන් ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාගේ, ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂකවරයාගේ හෝ ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂකවරයාගේ නැතහොත් ඒ තත්ත්වයෙන් කටයුතු කරන වෙනත් යම් නිලධරයකුගේ හෝ අත්සන යටතේ වූවක් ලෙස සලකනු ලැබන සහතිකයක්, එම නීති කෘත්‍යයේ දී සාක්ෂි දීම පිණිස ඒ තැනැත්තා නොකැඳවා ම, එම සහතිකයේ අඩංගු ප්‍රකාශයන්හි සත්‍යතාව පිළිබඳව තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

(2) යම් වරදක් සම්න්ධයෙන් පරීක්ෂණය හෝ විශ්ලේෂණය සඳහා තමා වෙත ඉදිරිපත් කරන ලද යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් තම භාරයේ තබා ගැනීම ආරක්ෂා සහිත නොවන බව නැතහොත් ප්‍රයෝගිකව කළ නො හැකිය යන මතය ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා, ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂකවරයා හෝ ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂකවරයා නැතහොත් ඒ තත්ත්වයෙන් කටයුතු කරන වෙනත් යම් නිලධරයකු හෝ විසින් දරනු

ලබන අවස්ථාවක, ඒ නිලධරයා විසින් අවශ්‍ය පරීක්ෂණය හෝ විශ්ලේෂණය කිරීමෙන් පසු, ඒ දෙය හෝ ද්‍රව්‍යය බැහැර කිරීම හෝ විනාශ කිරීම කළ හැකිය.

(3) යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් (2) වන ඡේදයෙහි විධිවිධාන යටතේ බැහැර කරනු ලැබූ විට හෝ විනාශ කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා, ආණ්ඩුවේ නියෝජ්‍ය රසපරීක්ෂකවරයා හෝ ආණ්ඩුවේ සහකාර රජ පරීක්ෂකවරයා නැතහොත් ඒ තත්වයෙන් කටයුතු කරන වෙනත් යම් නිලධරයකු හෝ විසින් බැහැර කරනු ලැබූ හෝ විනාශ කරනු ලැබූ දෙය හෝ ද්‍රව්‍යය පිළිබඳව වාර්තාවක් තබාගත යුතු අතර ඒ වාර්තාවේ සාරය හෝ අන්තර්ගත කරුණු ඇතුළත්, එවැනි යම් නිලධරයකුගේ අත්සන යටතේ වූවක් සලකනු ලබන සහතිකයක් යම් වරදක් සඳහා වූ යම් නීති කෘත්‍යයක දී සාක්ෂි දීම පිණිස ඒ නිලධරයා නොකැඳවා ම එම සහතිකයේ සඳහන් ප්‍රකාශයන්හි සත්‍යතාව පිළිබඳව තිරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

(4) මේ නියෝගයෙහි වරද යන්නෙන් යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ හෝ (183 වන අධිකාරය වූ) පුපුරණ ද්‍රව්‍ය පනත යටතේ හෝ 1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනත යටතේ හෝ තුවක්කු ආඥාපනත යටතේ හෝ දණ්ඩ නීති සංග්‍රහයේ VI වන පරිච්ඡේදයේ හෝ VII වන පරිච්ඡේදය හෝ VIII වන පරිච්ඡේදය යටතේ යම් වරදක් අදහස් වේ.

බලය දරනතැනැත්තන්ට විරෝධය පෑම හෝ අවහිර කිරීම

70. කිසිම තැනැත්තෙකු යම් හදිසි අවස්ථා නියෝගයකින් හෝ ඒ යටතේ යම් තැනැත්තකු පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලතල හෝ කාර්යය ක්‍රියාවේ යෙදවීමේ දී ඒ තැනැත්තාට විරෝධය පෑම හෝ අවහිර කිරීම නොකළ යුතු ය.

## VIII වන කොටස

## විවිධ

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතෙහි සුළු වෙනස් කිරීම.

71. (1) මේ නියෝගය බලපවත්නා කාලය තුළ -

(අ) (නීති විරෝධී රැස්වීම් විසුරුවා හැරීමේ බලයට අදාළ වන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 95 සහ 96 වන වගන්ති බලපැවැත්වීම අවසන් විය යුතු ය.

(ආ) තව ද තත්ත්වයෙන් සැරයන් කෙනෙකුට නො අඩු තත්ත්වයක සිටින යම් පොලිස් නිලධරයකු විසින් හෝ තත්ත්වයෙන් කෝප්‍රල් කෙනෙකුට නො අඩු තත්ත්වයක සිටින ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ යම් සාමාජිකයකු විසින් හෝ තත්ත්වයෙන් ප්‍රධාන නැවියකුට නො අඩු තත්ත්වයක සිටින ශ්‍රී ලංකා නාවික හමුදවේ යම් සාමාජිකයකු විසින් හෝ තත්ත්වයෙන් කෝප්‍රල් කෙනෙකුට නොඅඩු තත්ත්වයක සිටින ශ්‍රී ලංකා ගුවන් හමුදවේ යම් සාමාජිකයකු විසින් හෝ යම් පොදු මාර්ගයක, දුම්රිය මාර්ගයක, පොදු පිට්ටනියක, පොදු විනෝද ක්‍රීඩා භූමියක හෝ වෙනත් පොදු භූමියක, මුහුදු වෙරළක හෝ යම් ප්‍රසිද්ධ ගොඩනැගිල්ලක් හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් අසළ හෝ එය භූමියෙහි සිටින යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට ඒ ස්ථානයෙන් ඉවත්ව යාමට අණ කළ හැකි ය. තව ද, ඒ ආඥාව පිළිපැදීම අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තාගේ හෝ ඒ එක් එක් තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

(2) නියමයක් නිකුත් කිරීමට බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් මේ නියෝගයෙහි (1) ඡේදයේ (ආ) අනුඡේදය යටතේ නියමයක් නිකුත් කරනු ලැබූ විට යම් තැනැත්තකු ඒ නියමයට අනුකූලව ක්‍රියා නොකරතහොත් හෝ එම නියමට අනුකූලව ක්‍රියා නොකිරීමේ අධිෂ්ඨානයක් පෙන්වන ආකාරයට හැසිරෙතහොත් ඒ නිලධරයා විසින් අවශ්‍ය විය හැකි යම් සහායක් ඇතිව, සන්නද්ධ බලය ඇතුළු බලයෙන් ඒ නියමය ක්‍රියාත්මක කිරීමට කටයුතු ආරම්භ කළ හැකි අතර, ඒ තැනැත්තා ඉවත් කිරීමට හෝ සිරභාරයට ගෙන රඳවා තැබීමට සැලැස්විය හැකි ය.

(3) මේ නියෝගය බලපවත්නා කාලය තුළ 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 306(1), (2) සහ (4) වන වගන්ති, 13(1) නියෝගය යටතේ වරදකට හැර වෙනත් යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබූ හෝ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකුට හෝ ඔහු සම්බන්ධයෙන් අදළ නොවිය යුතු ය.

ප්‍රශ්නවලට පිළිතුරුදීමට ඇති යුතුකම.

72. (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් හදිසි අවස්ථා නියෝගයක් යටතේ සිරභාරයට ගෙන රඳවා ගනු ලැබූ යම් තැනැත්තකු, එසේ සිරභාරයට ගෙන රඳවාගෙන ඇති කාලසීමාව ඇතුළත පොලිස් නිලධරයකු විසින් හෝ යුද්ධ හමුදාපති, නාවුක හමුදාපති හෝ ගුවන් හමුදාපති විසින් බලය දෙනු ලැබූ අන්කිසි නිලධරයකු විසින් හෝ ප්‍රශ්න කරනු ලැබිය හැකිය. තව ද තමාගෙන් අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුරු දීම එසේ ප්‍රශ්න කරනු ලැබූ තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

(2) (1) වන ඡේදය යටතේ සිරභාරයට ගෙන රඳවාගෙන ඇති යම් තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීමේ කාර්යය සඳහා හෝ ඒ ප්‍රශ්න කිරීමට සම්බන්ධ වෙනත් යම් කාර්යයක් සඳහා ඒ තැනැත්තා මේ නියෝගයෙහි (1) ඡේදයේ සඳහන් යම් නිලධරයකු විසින් ඔහු රඳවාගෙන හෝ සිරභාරයේ තබාගෙන ඇති යම් ස්ථානයකින් ඉවත් කොට එක් වරකට දින හතකට නොවැඩි කාලයක් එම නිලධාරියාගේ තාවකාලික අත්අඩංගුවේ තබා ගත හැකිය.

තොරතුරු ලබාගැනීම හෝ භාණ්ඩ පරීක්ෂා කිරීමේ බලය.

73. (1) මේ නියෝගවල ඇතුළත් විශේෂ විධිවිධානවලට හානියක් නොමැතිව, නිසි බලධරයා විසින් හෝ ඔහු වෙනුවෙන් ඉල්ලීමක් කළ විටක, රාජ්‍ය ආරක්ෂාව සඳහා හෝ මහජන සාමය පවත්වාගෙන යාම සඳහා හෝ යම් හදිසි අවස්ථා නියෝගයක කාර්යය සඳහා හෝ ලබා ගැනීමට හෝ පරීක්ෂා කරනු ලැබීමට අවශය යයි නැතහොත් යෝග්‍ය යයි නිසි බලධරයා හෝ ඉල්ලීම කරන තැනැත්තා හෝ අදහස් කරන්නා වූ ද, යම් තොරතුරු හෝ භාණ්ඩ ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් නිසි බලධරයා හෝ තැනැත්තාට යට කී තැනැත්තා විසින් සැපයිය යුතු ය. නැතහොත් ඉදිරිපත් කළ යුතු ය. තව ද මේ නියෝගය යටතේ යථා පරිදි ඔහු වෙත කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රකාර, යම් තොරතුරක් හෝ තම සන්තකයෙහි ඇති භාණ්ඩයක් සැපයුම හෝ ඉදිරිපත් කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හැරියහොත් ඔහු වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ නියෝගයෙහි "භාණ්ඩය" යන්නට යම් පොතක්, ගිණුමක් හෝ ලේඛනයක් ඇතුළත් වේ.

මෝටර් වාහන පනතේ ඇතැම් විධිවිධානවලින් සන්නද්ධ හමුදාවල සාමාජිකයන් නිදහස් කිරීම.

74. මහජන සාමය ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා යම් මෝටර් වාහනයක් පදවන ලෙස නිසි බලධරයා විසින් බලය පවරනු ලැබ, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා නාවුක හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ හෝ සාමාජිකයකු යම් මෝටර් වාහනයක් එසේ පදවන විට, මෝටර් වාහන පනත යටතේ සාදන ලද නියෝග අතුරෙන් 1955 ජූලි 8 වන දින අංක 10,815 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 1955 මෝටර් වාහන (මහ රැජිනගේ හමුදා නිදහස් කිරීමේ) නියෝගවල 'අ' උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් මෝටර් වාහන පනතේ විධිවිධානවලින් හා නියෝගවලින් ඔහු නිදහස් වන්නේය.

තහනම් කරනු ලැබූ සංවිධාන.

75. (1)(අ) රාජ්‍ය ආරක්ෂාවට හෝ මහජන සාමය පවත්වාගෙන යාමට හෝ අත්‍යවශ්‍ය සේවා පවත්වා ගෙන යාමට හානිකර වූ කාර්ය සඳහා, හෝ

(ආ) මේ නියෝගවල 44 වන නියෝගයෙහි (2) ඡේදයෙහි හෝ 25 වන නියෝගයෙහි(1) වන ඡේදයෙහි හෝ 26,27 හෝ 28 වන නියෝගයෙහි සඳහන් කරනු ලැබූ කාර්යයන් අතුරෙන් යම් කාර්යයක් සඳහා,

යම් සංවිධානයක් විසින් හෝ යම් සංවිධානයක සාමාජිකයන් හෝ අනුගාමිකයන් විසින් ක්‍රියා කිරීමේ අන්තරායක් ඇතැයි හෝ යම් සංවිධානයක් හෝ එහි සාමාජිකයන් හෝ අනුගාමිකයන් යොදවා ගැනීමේ අන්තරායක් ඇතැයි ජනාධිපතිවරයා සෑහීමකට පත්වන අවස්ථාවක, ඒ සංවිධානය තහනම් කරනු ලැබූ සංවිධානයක් යයි ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින් ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කළ හැකි ය.

(2) රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින්, ඒ නියමය මගින් ම එහි සඳහන් කරනු ලබන තැනැත්තන්ට බලය දීමෙන් එම නියමයට අනුකූලව කටයුතු කරනු ලබන බව තහවුරු කිරීම සඳහා අවශ්‍ය යයි එසේ බලය දෙනු ලැබූ තැනැත්තන්ට පෙනී යන්නා වූ, (ඒ නියමය කරනු ලැබුවේ යම් මුද්‍රණාලයක් සම්බන්ධයෙන් ද, ඒ මුද්‍රණාලය හෝ එය පිහිටි පරිශ්‍රය හෝ ඒ මුද්‍රණාලයේ හෝ පරිශ්‍රයේ යම් කොටසක් හෝ සන්තකයට ගැනීම ඇතුළුව) පියවර ගැනීමේ බලය දෙනු ලැබිය හැකි ය.

මේ නියෝගයේ "මුද්‍රණාලය" යන්නට මුද්‍රණය කිරීම, ලිතෝ මුද්‍රණය කිරීම, ඡායාරූප ගැනීම හෝ වචන දෘශ්‍ය ස්වභාවයෙන් නිරූපණය කිරීමේ නැතහොත් ප්‍රතිනිර්මාණය කිරීමේ වෙනත් ක්‍රමයක් සඳහා හෝ පාවිච්චි කරනු ලබන යම් යන්ත්‍රයකට, උපකරණයකට හෝ පිරියතකට අයත් යම් මුද්‍රණ අකුරු හෝ වෙනත් භාණ්ඩයක් ද ඇතුළත් වේ.

(3) කිසිම තැනැත්තකු විසින් -

(අ) තහනම් කරනු ලැබූ සංවිධානයක් විසින් හෝ එහි යම් සාමාජිකයකු විසින් හෝ කළමකාකරුවකු විසින් හෝ පළ කරනු ලැබූ නැතහොත් පළ කරනු ලැබී යයි සලකනු ලබන යම් ලිඛිත හෝ මුද්‍රිත ද්‍රව්‍ය සකස් කිරීම, මුද්‍රණය කිරීම, හෝ බෙද හැරීම හෝ එබඳු ද්‍රව්‍ය සකස් කිරීමට, මුද්‍රණය කිරීමට, හෝ බෙදා හැරීමට යම් ආකාරයකින් සම‍බන්ධව සිටීම; හෝ

(ආ) සංවිධානය විසින් හෝ එහි යම් කළමනාකරුවකු විසින් කරනු ලැබූ හෝ කරනු ලැබී යයි සලකනු ලබන යම් නියමයක්, තීරණයක්, ප්‍රකාශයක් හෝ උපදේශයක්, හෝ ඊට අදළ වන යම් තොරතුරක් යම් ආකාරයකින් අන්කිසි තැනැත්තකුට දනුම් දීම හෝ දනුම දීමට තැත් කිරීම; හෝ(ඇ) සංවිධානයේ හෝ එහි යම් සාමාජිකයන්ගේ හෝ කළමනාකරුවන්ගේ හෝ යම් රැස්වීමක් කැඳවීම හෝ ඊට සහභාගීවීම; හෝ

(ඇ) සංවිධානයට බැඳෙන ලෙස හෝ ඊට ආධාර කරන ලෙස අන්කිසි තැනැත්තකුට ආරාධනා කිරීම හෝ උනන්දු කිරීම; හෝ

(ඉ) සංවිධානයේ කළමනාකරුවකු හෝ සාමාජිකයකු වශයෙන් තම තත්ත්වය අනුව හෝ තමා ඒ තත්ත්වය අනුව ක්‍රියාකරන බව විශ්වාස කරන ආකාරයෙන් හෝ වෙනත් යම් තැනැත්තකු පෙළඹවිය හැකි අන්දමේ කරුණු යෙදී තිබියදී, යම් ක්‍රියාවක් හෝ දෙයක් කිරීම හෝ කිරීමට තැත් කිරීම; හෝ

(ඊ) එම සංවිධානයේ යම් සාමාජිකයකු හෝ එම සංවිධානයේ සාමාපිකයකු යයි සැක කරනු ලබන යම් තැනැත්තකු රඳවා තබා ගැනීම හෝ සඟවා තබා ගැනීම,

නොකළ යුතු ය.

(4) (1) තහනම් කරනු ලැබූ යම් සංවිධානයක පාලනය යටතේ තිබෙන යම් මුද්‍රණාලයක් තම මතය අනුව -

(අ) රාජ්‍ය ආරක්ෂාවට හෝ මහජන සාමය රැකීමට හෝ හානි කරවීමට ; හෝ

(ආ) ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාමට හානි කරවීමට ; හෝ

(ඇ) හමුදා, කැරළි ගැසීමට, කැරළි කෝලාහල ඇති කිරීමට හෝ මහජන කැළඹීම ඇති කිරීමට තැනැත්තන් පෙළඹවීමට හෝ දිරි ගැන්වීමට,

අදහස් කරන ලද කරුණු අඩංගු යම් ලේඛනයක් නිපදවීම සඳහා යොදා ගෙන ඇතැයි හෝ යොදා ගැනීමට ඉඩ ඇතැයි හෝ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ගේ මතය වේ. නම්, ඔහු විසින් නියමයක් කිරීමෙන්, ඒ නියමයේ සඳහන් පරිදි වූ ඒ සංවිධානයේ පාලනය යටතේ පවතින ඒ මුද්‍රණාලයේ හෝ, මුද්‍රණාල සියල්ල හෝ ඉන් කිසිවක් හෝ ඒ නියමය බලපවත්වන තාක් කල් කිසිම කාර්යයක් සඳහා හෝ ඒ නියමයේ සඳහන් යම් විශේෂ කාර්යයක් සඳහා හෝ යොදා නොගත යුතු බවට විධාන කරනු ලැබිය හැකි ය.

(5) නීතිපතිවරයා විසින් හෝ සංවිධානයේ යම් සාමාජිකයකු විසින් හෝ සංවිධානයේ ණය හිමියකු විසින් හෝ ඉල්ලීමක් කරනු ලැබූ විට, යම් සංවිධානයක් මේ නියෝගය අදළ වන සංවිධානයක් යයි මහාධිකරණයට පෙනී ගියහොත් ඒ සංවිධානය විසින් හෝ එය සඳහා හෝ දරන්නා වූ දේපළ අධිකරණයේ අවසරය නොමැතිව බැහැර කිරීම වැළැක්වීමට අවශ්‍ය යයි පෙනී යන අන්දමේ ආඥාවක් අධිකරණය විසින් කළ හැකි ය. ඉහත දක්වෙන පරිදි යම් දේපළක් සම්බන්ධව හා සංවිධානයේ කටයුතු සම්බන්ධව පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් සකස් කරන ලෙස ද අධිකරණය විසින් නියම කළ හැකි ය. සංවිධානයේ ගණන් බේරා වසා දැමීම හා විසුරුවා හැරීම සඳහාත් එබඳු යම් පරීක්ෂණයක් හා වාර්තාවක් සහ සංවිධානයේ ගණන් බේරා වසා දැමීම හා විසුරුවා හැරීම සම්බන්ධයෙන් දරනු ලැබූ වියදම් කිසිවෙක් වේ නම් ඒ පිළිබඳව හෝ ඒ සඳහාත් අධිකරණයේ අනුමැතිය ඇතිව ඉල්ලීමේ දිනයට පෙර හෝ ඉන්පසුව නීත්‍යානුකූලව බැඳුණු සංවිධානයේ ණය තුරුස් නිදහස් කිරීම පිළිබඳව හෝ ඒ සඳහාත් එබඳු යම් දේපළක් ඉහත දක්වුණු පරිදි යෙදවීම සඳහාත් යුක්ති සහගත හා සාධාරණ යයි අධිකරණයට පෙනී යන අන්දමේ අතිරේක ආඥාවක් කිරීම ද අධිකරණය විසින් කළ හැකිය. තව ද, ඉහත දක්වුණු කරුණු පරිදි යෙදවීමට අධිකරණය විසින් නියම නොකරනු ලබන යම් දේපළක් ජනරජය වෙත සන්තක කළ යුතු යයි අධිකරණය විසින් ආඥා කළ යුතු ය.

(6) මේ නියෝගයෙහි ''කළමනාකරු'' යන්නෙන් යම් සංවිධානයක් සම්බන්ධයෙන් යෙදී ඇති විට, ඒ සංවිධානයේ යම් නිලධරයකු ද ඒ සංවිධානයේ කළමනාකාරීත්වයට හෝ පාලනයට සහභාගි වන නැතහොත් කළමනාකාර හෝ පාලන තත්ත්වයක් දරන්නේ යයි සලකනු ලබන යම් තැනැත්තෙක් ද අදහස් වේ.

76. ගිනි අවියක්, බෝම්බයක්, පුපුරණ ද්‍රව්‍යයක් හෝ වෙනත් මාරාන්තික ද්‍රව්‍යයක් හෝ උපකරණයක් භාවිත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් තුවාලයක් සිදුවී ඇති බවට පෙනී යන යම් තුවාල සිදු වූ තැනැත්තකුට වෛද්‍ය ප්‍රතිකාර ලබාදෙන හෝ එවැනි තුවාල සිදු වූ තැනැත්තකු වෛද්‍ය ප්‍රතිකාර ලබාගන්නා යම් තැනැත්තකු විසින් එසේ තුවා, ලැබූ තැනැත්තාගේ අනන්‍යතාවය පිළිබඳ විස්තර ද තුවාලයේ විස්තර ද හැකිතාක් දුරට තුවාලය සිදුවූ අවස්ථානුගත කරුණු ද වාර්තාගත කොට, වහාම එම තොරතුරු ළඟම ඇති පොලිස් ස්ථානය වෙත ලබාදිය යුතු ය. තැනැත්තන්ට සහාය දීම

77. යම් හදිසි අවස්ථා නියෝගයක හෝ ඒ යටතේ කරන ලද යම් නියමයක හෝ විධානයක විධිවිධාන යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි අදහස් කෙරෙන යම් කාරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් නීතිපතිවරයාගේ ලිඛිත අනුමතිය මඟින් හෝ එම අනුමැතිය ඇතිව හෝ මිස, කිසිම අධිකරණයක නොපැවරිය යුතු ය. වගකීමෙන් ආරක්ෂා කිරීම.

**(2 වන සහ 44 වන නියෝගය)**

## උපලේඛනය

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවෙන් හෝ (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 127 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අර්ථ නිරූපණය කර ඇති යම් බැංකු ආයතනයකින් හෝ 1975 අංක 13 දරන ජාතික රාජ්‍ය සභා පනතින් පිහිටුවන ලද්දා වූ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවෙන් සපයනු ලබන සේවා;

(ආ) සෞඛ්‍ය සහ වනිතා කටයුතු අමාත්‍යාංශය යටතේ වූ ආරෝග්‍යශාලාවල, බෙහෙත් ශාලාවල සහ වෙනත් ආයතනවල රෝගීන් නඩත්තු කිරීම සහ බාර ගැනීම, ඔවුන්ට කෑම බීම දීම, උපස්ථාන කිරීම සහ ප්‍රතිකාර කිරීම සම්බන්ධව ඉටු කිරීමට අවශ්‍ය හෝ නියමිත කවර වූ ආකාරයක සියලු සේවා කාර්ය හෝ කම්කරු කටයුතු;

(ඇ) ඛණිජ තෙල් නිෂ්පාදන සහ ගෑස් ඇතුළුව ඉන්ධන සැපයීමට හෝ බෙද හැරීමට සම්බන්ධ සියලු සේවා;

(ඈ) විදුලිබලය සැපයීමට සම්බන්ධ සියලු සේවා;

(ඉ) විදේශීය විදුලි සංදේශ සේවා ඇතුළුව තැපැල් සහ විදුලි සංදේශ සේවා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සිදු කිරීමට අවශ්‍ය හෝ නියමිත කවර වුව ද ආකාරයක සියලු සේවා, වැඩ හෝ ශ්‍රමය;

(ඊ) සියලු අමාත්‍යාංශවල, ආණ්ඩුවේ සියලු දෙපාර්තමේන්තුවල, හා රාජ්‍ය සංස්ථාවල නිලධරයන් විසින් හෝ සේවකයන් විසින් ඉටු කිරීමට අවශ්‍ය හෝ නියමිත කවර ම ආකාරයක සියලු සේවා, කාර්ය හෝ කම්කරු කටයුතු;

(උ) මාර්ග ප්‍රවාහන සේවා සහ දුම්රිය සේවා සහ මහජන ප්‍රවාහන සේවා පවත්වා ගෙනයාම හා සම්බන්ධව ඉටු කිරීමට අවශ්‍ය හෝ නියමිත කවර වූ ආකාරයක සියලු සේවා, කාර්ය හෝ කම්කරු කටයුතු;

(ඌ) තේ, රබර් සහ පොල් යන වැවිලි පවත්වා ගෙන යාම හා පාලනය කිරීම හෝ තේ, රබර් සහ පොල් නිෂ්පාදනය හා සම්බන්ධව ඉටු කිරීමට අවශ්‍ය හෝ නියමිත කවර වූ ආකාරයක සියලු සේවා, කාර්ය හෝ කම්කරු කටයුතු;

(එ) භාණ්ඩ, ඇඟලුම් හා වෙනත් නිෂ්පාදන අපනයනය කිරීම සම්බන්ධයෙන් ඉටු කිරීමට අවශ්‍ය හෝ නියමිත කවර වූ ආකාරයක සියලු සේවා, කාර්ය හෝ කම්කරු කටයුතු;

(ඒ) සියලු ගුවන් විදුලි විකාශන සහ රූපවාහිනී සේවා පවත්වාගෙන යාම හා සම්බන්ධව ඉටු කිරීමට අවශ්‍ය හෝ නියමිත කවර වූ හෝ ආකාරයක සියලු සේවා, කාර්ය හෝ කම්කරු කටයුතු;

(ඔ) මහජනයාට අවශ්‍ය යම් ආහාර ද්‍රව්‍යයක් හෝ ඖෂධ හෝ වෙනත් යම් භාණ්ඩයක් විකිණීම, සැපයීම හෝ බෙද හැරීම හා සම්බන්ධව ඉටු කිරීමට අවශ්‍ය හෝ නියමිත, කවර වූ ආකාරයක සියලු සේවා, කාර්ය හෝ කම්කරු කටයුතු.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.